On the other hand, it is not just peripheral regions, with which Sri Lanka enjoys considerable cultural ties, that the island has failed to consolidate bilateral relations with. What is puzzling is that the country's diplomatic machinery has never truly explored its cultural and historical ties with its biggest partners. The US is perhaps the best example here. In February, the two countries celebrated 75 years of bilateral ties. However, the history of US-Sri Lanka ties goes back by at least 225 years, to 1788, almost a decade before British colonization of the Maritime Provinces. In 2016, US Embassy staff located the graveyard of the first American Consul to Ceylon. What should have made headlines in the local and US press, however, passed by and was barely noticed.

This, of course, is just one example. On the other hand, with certain countries Sri Lanka seems to go for the same general cultural, historical, and people-to-people engagements. For instance, in India, Sri Lanka frequently resorts to the Ramayana.

Today such commonalities manifest themselves in the form of tourist attractions such as the Ramayana Trail. Unfortunately, while these are ingrained in a nation's collective consciousness, the question can legitimately be asked as to whether a country's ties with its closest neighbor would be best served by resorting to a myth which effectively depicts a war between the two states.

Cultural ties can and, in our view, should be used to promote harmony, unity, and goodwill. It is in this view that we find it intriguing as to why Sri Lanka has not used one of its most unique cultural identifiers, Buddhism, more cohesively.

With regard to India, the benefits of pursuing Sri Lanka's Buddhist connection are apparent when considering how India itself appears to be pursuing it in Sri Lanka. India's actions here may well be motivated by China's deployment of Buddhist diplomacy in Sri Lanka.

The advantage that India has there is that it is the birthplace of not just Buddhism, but also the form of Buddhism that has been transplanted in Sri Lanka, whereas in China a long process of cultural syncretism has produced a form of Buddhism which differs considerably from its Theravada, South Asia, and South-East Asian variants.

This is not to say that China and Sri Lanka lack a "Buddhist connection": far from it. But India, with its rich cultural tapestry, and its position as the birthplace not just of Theravada Buddhism but also of the creeds which influenced it, such as Jainism, the advantages of consolidating cultural connections with its closest neighbor are obvious.

In the case of the United States too, the benefits of pursuing these ties are apparent. US-Sri Lanka relations have been, for the lack of a better way of putting it, ambivalent since independence, in particular since 1952, when a pro-Western, pro-US administration was rebuffed in its attempts at cajoling economic concessions from Washington.

When the Sri Lankan government, despite its own alignment with the West, sent a delegation to China and entered the Rubber-Rice Pact later that year, American officials regretted their earlier refusal to grant those concessions. Since then, relations with the US have often taken a turn for the worse, particularly with such episodes as the nationalization of oil companies in the 1960s. In fact, despite a tilt to the West after 1977, Sri Lanka is yet to engage properly on the cultural front with Washington: it seems to be focusing more on economic and defense ties.

There are of course clear enough reasons for this. Sri Lanka's position in the Indian Ocean and its relations with India and China, particularly the latter, have made it an indispensable element in the US's Indo-Pacific Strategy. Like most small states in the Indo-Pacific, Sri Lanka remains wary of the Quad alliance but is also keen to maintain its ties, especially military ties, with Washington.

On the other hand, the US continues to view Sri Lanka through the prism of its military engagements. As at least one academic has pointed out, this has prevented the US from treating Sri Lanka as a distinct state, and from recognizing its individuality in South Asia and the Indian Ocean. That in turn has pre-empted both countries from cementing non-economic, non-military ties.

There are obvious benefits to be gained from pursuing the latter ties. At first glance, there seems to be a wide cultural gulf between Sri Lanka and the US. But the cultural element remains strong, even when accounting for Sri Lanka's rich Buddhist heritage. Indeed, it is intriguing that neither country has delved into the US contribution to that heritage, particularly the intervention of the Theosophical Society in the Buddhist Revival of the late 19th century.

The latter was an undeniably and distinctly American contribution. It did not involve any military or economic element. It was a classic case of individuals from two very different societies, spurred on by common interests, coming together for a cause beneficial to both: a Track 2 diplomatic initiative, in other words.

Sri Lanka's Buddhist heritage, then, represents one way through which the country can consolidate and cement its ties with both traditional and non-traditional partners, from India, China, and the US to Central Asia. On the other hand, can the Island rely on Buddhist diplomacy alone? Reports that the country resorts to Buddhism at high-level multilateral forums to gloss over its failures on the human rights and reconciliation fronts may be exaggerated at one level.

But Buddhism's place in Sri Lanka has, from a diplomatic perspective, traditionally been a double-edged sword. While on the one hand the religion occupies a prominent place in its history, on the

other hand it has managed to secure for the country a somewhat ambivalent press internationally, especially with respect to reports of State patronage of Buddhism, patronage that is often seen to have been given at the expense of the other communities and ethno-religious groups in the country.

As one respondent to our queries on this report observed, moreover, there has been "a fundamental misunderstanding of the role of culture in foreign relations." According to this reading, Sri Lanka has not failed to utilize culture in its handling of bilateral ties; what it has failed to do is home in on its history and culture to strengthen those ties.

For instance, concerning Buddhist diplomacy, Sri Lanka has been content in highlighting its 2,500-year-old history. While 2,500 years is indeed a long time and Sri Lanka's history ranks among the most meticulously recorded in the region, in a global context, such chronologies appeal to very small audiences. In fact, appeals to high culture tend to be lost on people in general, because what entrances most people, here and abroad, is popular culture. It is this popular culture that Sri Lanka is yet to acknowledge or highlight, properly.

What would constitute this popular culture? A recent example would be "Menike Mage Hithe", but a far better example would be "Surangani." Unlike Yohani's hit, which was a cover, the latter was an original, based partly on a Sinhalese baila. It represents, for us, the peak of Sri Lankan culture, for two reasons: because it seamlessly blended in Sinhala and Tamil lyrics, and because it appealed so successfully to mass audiences. Despite the many remixes and covers that "Surangani" has endured over the decades, the original version, by A. E. Manoharan, remains popular.

Appeals to high culture, by contrast, have fallen on deaf ears, even here. A recent example would be Jerry Stalin's "Yarlpanathilirunthu Kolaverida", which was a response to the popularity of Dhanush's "Why This Kolaveri Di?" Written in pristine Jaffna Tamil and pandering to fears of the Tamil language being bastardized by external elements, it did not garner much success on YouTube. Contrast that with "Menike Mage Hithe", which despite being a cover and being a Sinhala song, proved to be so popular that it was dubbed into several Indian languages.

Such middlebrow or even lowbrow works of art have the potential to unite diverse communities, crossing both local as well as foreign borders. While the Sri Lankan government did, rather mutedly, take note of Yohani's song, however, nothing much seems to have been done to tap into the popularity of such initiatives. In all fairness, however, it must be noted that "Menike Mage Hithe" came on eve of the crisis in 2022.

Of course, this is not to belittle the role that high culture plays in shaping global perceptions of a country, particularly a country like Sri Lanka. A recent endeavor which demonstrates the possibilities of marketing Sri Lankan history would be Malwatu Oya Soya.

Written and directed by Dr SinhaRaja Tammita-Delgoda, a leading historian and art historian, Malwatu Oya Soya depicts the history of Sri Lanka's second longest river after the Mahaveli. That history has been recorded before, not least by Sinhalese and Pali Chronicles. But the film, which won several awards internationally, breaks ground by presenting this history visually, within a clear, cogent narrative.

A comparable effort would be Basil Wright's Song of Ceylon (1934). Unlike Wright's film, Malwatu Oya Soya did not receive State backing and was sponsored by a private company. This recalls what Harry Pieris, one of the pioneers of the modernist art movement in Sri Lanka, said about the private sector's contribution to the restoration of Sri Lanka's ancient heritage.

"Should not our creative talent be supported and encouraged by the wealthy businessmen of this country, so that art too could pay big dividends and bring into the country much needed foreign exchange?"

In that sense, the private sector can play a major, catalytical role in marketing Sri Lanka's image abroad through its history and culture. This can be done through not merely documentaries, but also feature films. Here it must be noted that Sri Lanka has won a reputation as a top-quality location for foreign film productions. This was so even before the construction of Ranminithenna in Hambantota.

While a few productions have come to a halt because of the crisis, a number of foreign films and series, like Good Karma Hospital, had established Sri Lanka as an oriental paradise, in effect a refuge from the banal, humdrum, materialist culture of the West.

Whether Sri Lankan directors themselves can use or have used Sri Lankan landscapes to project such an image remains to be seen, however. While recent efforts, like Maharaja Gemunu, are limited to local audiences and nationalist cultural narratives, others, like Prasanna Vithanage's Gaadi, have more creatively used Sri Lanka's beautiful landscapes, within which directors have weaved highly original stories.

Gaadi opened the country to another potentially big source of cultural diplomacy, its own expatriate community. As the director told the authors of this review, the film had enjoyed and continued to enjoy massive success abroad, especially in Western capitals and among Sri Lankan emigres. During the interview the point was raised as to why more efforts were not being made to secure emigres as cultural emissaries to their own country of birth.

Indeed, given the historical connections Sri Lanka has built up over centuries in so many countries, it is intriguing that the government and the Foreign Ministry has not creatively made use of non-traditional platforms, like social media, and the expat community to emphasize those connections. In this respect, it would be apt to note how Sri Lanka's partners, such as China, uses social media to highlight its cultural ties with the island.

At official levels, Sri Lanka resorts to two channels to emphasize these ties: Parliamentary Friendship Groups and tourism propaganda. While the last few years have seen several such groups being formed or revived, such as the Sri Lanka - US Parliamentary Friendship Association, the Australia - Sri Lanka Parliamentary Friendship Group, and the India - Sri Lanka Parliamentary Friendship Group, these have mostly been in response to and contingent on immediate priorities.

To give one example, the India - Sri Lanka Parliamentary Friendship Group was revived after Sri Lanka decided to purchase nano fertilizer from India in November 2021, a decision sparked by the Sri Lankan government's decision to ban chemical fertilizer imports seven months earlier. It is questionable whether such motives can form the basis for longstanding ties, regardless of the high-flown rhetoric about cultural connections that accompany the formation of such groups.

In this regard, it would be instructive to note Sri Lanka's strengths and weaknesses and based on such an assessment to understand how it can cement its bilateral ties on the cultural, historical, and people-to-people fronts. Sri Lanka's geopolitical woes have mainly to do with three countries: India, China, and the US, in that order.

On the other hand, it enjoys vast non-economic ties with almost every country it has diplomatic representation in, directly or concurrently, particularly in Asia and inclusive of the above three countries. These ties have come about by virtue either of its position in the Indian Ocean or its conquest by successive European powers after the 16th century.

While Sri Lanka does invoke cultural ties, we believe that such calls are made to compensate for the country's economic weaknesses. In other words, it is because Sri Lanka does not have economic strength that it resorts to the domains of culture and history.

That underlies another more fundamental problem. Sri Lanka's invocation of cultural-historical and people-to-ties has been inversed to its pursuit of economic ties. Thus, while it constantly advocates cultural-historical ties with countries with which it does not enjoy much trade ties, it mysteriously has strayed away from consolidating historical ties with countries with which it does enjoy robust ties.

The US and India are two clear examples for the second case, while Central Asia and Latin and Central America are two clear examples for the first case. This merely gives the impression that Sri Lanka both pursues people-to-people engagements in the absence of strong economic relations and neglects such engagements when it already enjoys strong economic ties: in effect, a worst of both worlds' scenario, hardly conducive to its long-term external relations.

We believe this should not be the case. Cultural connections, based on people-to-people ties and other engagements, should form the basis of bilateral ties for any country, not just small states like Sri Lanka. On the other hand, it is counterproductive to keep invoking them in the absence of other ways of cementing bilateral relations.

Therefore, while revamping its cultural diplomacy in line with the recommendations above, Sri Lanka should engage in strengthening its economy, simply because no amount of soft power cultural projection can salvage Sri Lanka's foreign policy unless it is buttressed by a strong financial base. As P. K. Balachandran noted in an interview with the authors of the review, cultural ties in themselves mean nothing in the absence of trade.

factum

# විදේශ ප්‍රතිපත්ති විවරණය

## අලුත් ශ්‍රී ලංකාවක් සඳහා ප්‍රවේශයක්

factum

**විදේශ ප්‍රතිපත්ති විවරණය**
අලුත් ශ්‍රී ලංකාවක් සඳහා ප්‍රවේශයක්

| | | |
|---|---|---|
| පළමු මුද්‍රණය | : | 2023 සැප්තැම්බර් |
| උපදේශක කණ්ඩායම | : | ආචාර්ය රංග කලංසූරිය, මන්දනා ඉස්මයිල් අබේවික්‍රම, ඕමාර් රාජරත්නම්, එම්. එස්. එම්. අයුබ්, සහ චාන්දනී කිරින්දේ |
| ප්‍රධාන සංස්කාරක | : | උදිත දේවප්‍රිය |
| පර්යේෂණ සම්බන්ධීකරණය | : | සීනත් අයුබ් සහ ශරන්‍යා අබේවික්‍රම |
| පර්යේෂණ සහාය | : | ආකිල් රියාස් සහ උත්පල විජේසූරිය |
| පිටු සැලසුම | : | සංජීව පෙත්තාවඩු |
| ප්‍රකාශනය | : | Factum |

Factum යනු ගෝලීය දේශපාලනය, උපායමාර්ගික සන්නිවේදන සහ තාක්ෂණික සහයෝගීතා සේවා පිළිබඳ විචාරාත්මක අවබෝධය, විශ්ලේෂණ සහ ඉදිරිදර්ශන ඉදිරිපත් කරන ස්වාධීන උපදේශන ආයතනයක් සහ චින්තන පර්ෂදයකි. එය ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ලාභ ලබන සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත. ජාත්‍යන්තර සබඳතා සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය පිළිබඳ විශේෂඥයින් කණ්ඩායමක් සමඟින්, Factum විසින් ජාත්‍යන්තර සහ කලාපීය දේශපාලනය, ආර්ථික විද්‍යාව, පාරිසරික සහ ආරක්ෂක ගැට¨ සහ වෙනත් අංශ සම්බන්ධව ස්වාධීන ප්‍රතිපත්ති පර්යේෂණ, ගැඹුරු සන්දර්භ විශ්ලේෂණ සහ අපක්ෂපාතී විවරණ ඔස්සේ ශ්‍රී ලාංකික සහ ආසියානු විශේෂඥයින් බලමුලු ගන්වනු ලැබේ.

ෆැක්ටම් බහුත්වවාදය, සමාන අවස්ථා සහ සියල්ලන් ඇතුළත් කිරීම සඳහා කැපවී සිටී. එය ආන්තික කණ්ඩායම් ඇතුළුව සියලු ස්ත්‍රී පුරුෂ සමාජභාවී කණ්ඩායම්වල සහ ප්‍රජාවන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරයි.

මෙම ග්‍රන්ථය සම්පූර්ණ කිරීම සඳහා මග පෙන්වූ, උපදෙස් දුන්, සහ උපදේශනය කළ හිටපු තානාපතිවරුන් සහ විදේශ ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය තාන්ත්‍රික මණ්ඩලයට කතුවරුන් ස්තූතිවන්ත වෙන්නෙමු

මෙම ග්‍රන්ථයේ දැක්වෙන කාටූන් අවන්ත ආටිගල විසිනි.

29A, මැරීන් ඩ්‍රයිව්, කොළඹ 3.

වෙබ් අඩවිය : www.factum.lk
ඊමේල් : info@factum.lk

සමාජ මාධ්‍ය
Facebook : www.facebook.com/Factum.lk
X or Twitter : www.twitter.com/factumlk
Instagram : www.instagram.com/factum.sl

රටේ පළාත් නමයම ආවරණය වන අයුරින් පවත්වන ලද උපදේශන වැඩමුළු සමූහයක් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා විසිපහකට ආසන්න සංඛ්‍යාවක තොරතුරු මෙම ග්‍රන්ථය සඳහා පදනම් විය. රාජ්‍ය තාන්ත්‍රික සේවයේ දැනට සිටින සාමාජිකයින්, විශ්‍රාමික විදේශ ලේකම්වරුන් / වරියන්, තානාපතිවරුන්, තානාපතිවරියන්,  සන්නද්ධ හමුදා උසස් නිලධාරීන්, පරිපාලන සේවයේ සාමාජිකයින්, සිවිල් සංවිධාන නායකයින්, ආගමික නායකයින්, පෞද්ගලික සහ වාණිජ ක්ෂේත්‍රයේ ප්‍රවීණයින්, මාධ්‍යවේදීන්, ක්‍රීඩකයින් සහ සිනමාව ඇතුළු සංස්කෘතික අංශයේ නියෝජිතයන් ඇතුළු විවිධ අංශවල නියෝජිතයන් සමග සම්මුඛ සාකච්ඡා සිදුකෙරිණි. විශේෂයෙන්ම සියම් මහා නිකායේ මල්වතු පාර්ශවයේ මහා නායක තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහා නාහිමිපාණන් වහන්සේ සහ ආදිවාසී නායක ඌරුවරිගෙ වන්නියලැත්තන් ගෙන් ලද උපදේශනයන් ද මෙහිදී ස්තූති පූර්වකව සඳහන් කළ යුතුය.

රටේ විදේශ ප්‍රතිපත්තිය වෙනුවෙන් තම ජීවිත හා වෘත්තීය කැප කළ බොහෝ රාජ්‍ය තාන්ත්‍රිකයින්, තානාපතිවරුන්/වරියන් සහ නිලධාරීන්/නිලධාරීනියන් මේ ග්‍රන්ථය පුද කරන්නෙමු

# අන්තර්ගතය


**හැඳින්වීම** 42

**තේමාත්මක කලාප වැදගත් කාරණා**

භූ දේශපාලනය 44

ආරක්ෂක සහයෝගීතාව 50

පර්යේෂණ සහ නවෝත්පාදනය 54

ඩිජිටල් සහයෝගීතාව 60

දේශගුණික පරිසරය 66

පුද්ගලාන්තර සබඳතා 72



# හැඳින්වීම

## මුල් පියවරක්

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කිසිවිටෙක ස්ථාවරව නොතිබිණි. නිදහසින් පසු, එය විවිධ බාහිර හා අභ්‍යන්තර නිර්ණායකවලට අනුකූලව අඛණ්ඩව වෙනස් වී ඇත. මෙහිදී ශ්‍රී ලංකාව පමණක් විශේෂ වන්නේ නැත. බලවත් රටවල් ඇතුළු වෙනත් රටවල ද විදේශ ප්‍රතිපත්ති සිග්සැග් ආකාරයෙන් වෙනස් වී තිබේ. එක් යුගයක සතුරන් තවත් යුගයක මිතුරන් වී ඇත. එහෙත් මෑතක සිට ශ්‍රී ලංකාව එක් අනන්‍යතා අර්බුදයක සිට තවත් අර්බුදයක් වෙත ඇදෙමින් සිටී. පසුගිය වසරේ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් රටට, එහි දේශපාලන යාන්ත්‍රණයට සහ එහි පුරවැසියන්ට එහි විදේශ සබඳතාවල ගමන් පථය සමඟ සම්බන්ධ වීමට සහ එම සබඳතාවලින් යම් ප්‍රතිලාභයක් ලබා තිබේදැයි තක්සේරු කිරීමට බල කරන ලදි.

මෙම ප්‍රකාශනය ශ්‍රී ලංකාව පසුගිය වසරේ අර්බුදයෙන් උගත් හෝ නූගත් පාඩම් කිහිපයක් ඉදිරිපත් කරයි. ද්විතීයික මූලාශ්‍ර මෙන්ම Google ප්‍රශ්නාවලියක් සහ පුද්ගල සම්මුඛ සාකච්ඡා භාවිතා කරමින්, එය ප්‍රධාන ප්‍රශ්න දෙකක් සම්බන්ධයෙන් ගැඹුරින් විමසීමට උත්සාහ කර ඇත. ඒවා නම්, ශ්‍රී ලංකාව දැන් සිටින්නේ කොතැනද, ඉදිරියට යාමට එහි විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කුමක් කළ හැකිද යන ප්‍රශ්නයි. මෙම ප්‍රකාශනය ශාස්ත්‍රීය නිබන්ධනයක් නොවන මුත්, එය අපට වැරදී ඇත්තේ කොතැනද යන්න සහ අපගේ තත්වය සහ අපගේ ස්ථාවරය වැඩිදියුණු කිරීමට අපට කළ හැකි දේ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ පළමු පියවරක් ලෙස සැලකිය හැකිය. එහි දී අප එක් මූලධර්මයකින් මඟ පෙන්වනු ලැබ ඇත. එනම්, අවසානයේ අපගේ විදේශ ප්‍රතිපත්තිය රඳා පවතින්නේ අපගේ දේශීය දේශපාලනය මත හෝ අභ්‍යන්තර මානය මතය යන මූලධර්මයයි.

Factum හි අපි විදේශ ප්‍රතිපත්ති සාක්ෂරතාවය ශ්‍රී ලංකාවේ සංවර්ධනයෙහිදී ප්‍රධාන සාධකයක් වන බව විශ්වාස කරන්නෙමු. එය මනසේ තබාගෙන අපි පසුගිය වසරේ පළාත් ගණනාවක් පුරා විදේශ ප්‍රතිපත්ති උපදෙස් විමසීම් මාලාවක් පැවැත්වූයෙමු. අවුල් සහගත මාස පහක් තිස්සේ පැවති තෙල් හිඟය, පෝලිම් සහ නිමක් නැති විරෝධතා මධ්‍යයේ පවත්වන ලද මෙම උපදෙස් විමසීම්වලින් අපට ඉහළින් සිටින අය විදේශ ප්‍රතිපත්තිය හසුරුවන ආකාරය පිළිබඳ බිම් මට්ටමේ ජනයාට හැඟෙන්නේ කුමක්ද යන්න පිළිබඳ අවබෝධයක් ලැබිණි. සමහර විට වඩාත්ම සංවේදී විය හැකි ප්‍රකාශය සිදුකළේ ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවේ ප්‍රධානියා වන ඌරුවරිගේ වන්නියලැත්තන් විය හැකිය. ශ්‍රී ලංකාවට වැරදුණේ කොතැනදැයි කල්පනා කරමින් ඔහු මෙසේ ප්‍රකාශ කළේය.

> දැනටමත් ජාත්‍යන්තර ප්‍රජාව අතර ශ්‍රී ලංකාව විශ්වාසනීයත්වය ගිලිහී ගොස් ඇති බැවින් විනාශ වී ඇති ගෝලීය ප්‍රතිරූපය යළි ගොඩනැගීම කෙරෙහි ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතුය.

උතුරු පළාතේ අපගේ උපදෙස් විමසීම් මගින් තවත් වැදගත් කරුණක් පිළිබඳ අවබෝධයක් ලැබිණි: එනම්, අපට දැන් අවශ්‍ය වන්නේ නැවත ආරම්භ කිරීම නොව, අලුතින් ආරම්භ කිරීම බවයි. ''අලුත් ශ්‍රී ලංකාවක් සඳහා ප්‍රවේශයක්" යන අපගේ අනු මාතෘකාවට හේතු වූයේ එයයි. ශ්‍රී ලංකාව සාම්ප්‍රදායික රාජ්‍ය තාන්ත්‍රිකභාවයෙන් ඔබ්බට සිතිය යුතු බවත් රාජ්‍ය තාන්ත්‍රික අලෙවිකරණය ගැන සිතිය යුතු බවත් දකුණු පළාතේ එක් අයෙකු සිය ප්‍රතිචාරය තුළ සඳහන් කළේය.

මහියංගනයේ වනගත කැලෑවල සිට කොළඹ කොන්ක්‍රීට් වනාන්තර දක්වා සහ උතුරේ සිට දකුණට පවතින ජන හඬ එසේය. ශ්‍රී ලංකාව දියුණු වීමට නම්, එහි ප්‍රතිරූපය හෙවත් විදේශයන්ට ශ්‍රී ලංකාව පෙනෙන ආකාරය පිරිසිදු කරගත යුතුය. ශ්‍රී ලංකාවට කිසිදා මිතුරන්ගෙන් අඩුවක් නොවීය. සිදු වී තිබෙන්නේ මිත්‍රත්වයන් පවත්වා ගෙන යාමට සහ අලුත් මිත්‍රත්වයන් ඇති කර ගැනීමට අවශ්‍ය අධිෂ්ඨානය අඩු වීමයි. මෙම ප්‍රකාශනය මේ සියලු ගැටලු ආමන්ත්‍රණය කරන බව කිව නොහැකිය. කෙසේ වෙතත්, එය අවසානයේ අපට මුහුණ දීමට සිදුවන ඇතැම් ප්‍රධාන ගැටලු සහ තේමාවන් ගැඹුරින් සාකච්ඡා කරන්නට උත්සාහ කරයි.

**උදිත දේවප්‍රිය**
ප්‍රධාන ජාත්‍යන්තර සබඳතා විශ්ලේෂක



# භූ දේශපාලනය

ශ්‍රී ලංකාව 2022 වසරට පිවිසුණේ දැඩි අවිනිශ්චිතභාවයක් සහ අවුල් සහගත තත්ත්වයක් මැදය. ඊට පෙර වසරේ එවකට රජය විසින් දේශීය හා විදේශීය වශයෙන් ප්‍රතිපත්තිමය බලපෑම් ඇති කරන ක්‍රියාමාර්ග මාලාවක් ක්‍රියාවට නංවා තිබුණි. රසායනික පොහොර ආනයනය තහනම් කිරීම එවැනි එක් ක්‍රියාමාර්ගයකි. 2021 දෙසැම්බරය වන විට රජය රට නමැති නැව මෙහෙයවමින් සිටියේ කිසිදු දිශානතියකින් තොරවය. එය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පවා මතු කළ කරුණකි. ආර්ථිකය ආපසු හැරවිය නොහැකි තැනකට පැමිණ තිබුණද, සුපුරුදු පරිදි ව්‍යාපාර ඉදිරියට ගියේය. 2022 මාර්තු වන විට, බාහිර සාධක නිසා, ව්‍යාපාර බිඳ වැටීමට පටන් ගත්තේය. රජයේ වැරදි කළමනාකරණය හේතුවෙන් බිඳ වැටීම තීව්‍ර විය.

අර්බුදය ඇතිවීමට හේතුව කුමක්ද යන්න පිළිබඳව වාද විවාද දිගටම පවතී. සමහර ආර්ථික විද්‍යාඥයන් රටේ වෙළඳපොළ ලිහිල් කිරීමට සහ ණය තිරසාරභාවය සහතික කිරීමට අසමත් වීම හේතුව ලෙස ඉස්මතු කරන අතර තවත් සමහරුන් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ ණයගැතිභාවයට වඩා ගැටලුව වන්නේ ප්‍රාග්ධන වෙළඳපොළ මත යැපීම බවයි. කෙසේ වෙතත්, අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව පළමු වරට ජාත්‍යන්තර ණය ගෙවීම අත්හිටුවන බව ප්‍රකාශ කර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදි. එම තීරණයත් සමගම, ශ්‍රී ලංකාව තරඟකාරී භූ දේශපාලනික අවශ්‍යතා සමූහයක් මැද සිර විය. ඇතැම් ඒවා අභිසාරී වන අතර සමහර ඒවා අනෙක් ඒවාට වඩා වෙනස් අපසාරී ඒවා විය. නිදසුනක් වශයෙන්, චීනය හිදැස පුරවනු ඇතැයි බොහෝ දෙනා අපේක්ෂා කළ මුත්, ඉන්දියාව ඊට පෙර අවශ්‍ය පියවර ගත්තේය. එහි ප්‍රතිඵලය නම්, දිල්ලිය ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වඩා බොහෝ දේ තමන් කළ බව ඉන්දියාවට ප්‍රකාශ කළ හැකි තත්ත්වයක සිටීමයි. ඇත්ත වශයෙන්ම එහි විදේශ කටයුතු අමාත්‍යවරයා එසේ ප්‍රකාශ කර තිබේ.

සමාලෝචනයට ලක්වන අර්බුදකාරී කාලපරිච්ඡේදයේ භූ දේශපාලනික ඇඟවුම් සම්බන්ධයෙන් ගත් කල, මූලික සාධකය වූයේ සහ බොහෝ විට සෑම විටම වන්නේ ද ඉන්දියානු සාගරයේ ශ්‍රී ලංකාවේ පිහිටීම සහ ඉන්දියන් සාගරය සඳහා ඉන්දියාවේ අභිලාෂයන්ය. වෙනත් කිසිදු රටක් මැදිහත් වීමට කැමැත්තක් නොදැක්වූ අවස්ථාවක ඉන්දීය රජය විසින් කරන ලද අතිමහත් උපකාරය නොසලකා හැරිය නොහැකිය. කෙසේ වෙතත්, ඉන්දියාව තම සමීපතම අසල්වැසියාට ආධාර සහ උපකාර ලබා දීමෙන් පැහැදිලි භූ දේශපාලනික වාසියක් ලබා ගත්තේය. තත්ත්වය කෙතරම් දුර්වලද යත් ශ්‍රී ලංකාව තිබෙන්නේ නූලක එල්ලෙමින් ඇති තත්වයකය. මතුපිටින් දේවල් සාමාන්‍ය තත්ත්වයට පත්ව ඇතත්, සත්‍යය නම්, ඉන්දියාව ඩොලර් බිලියන 4 සිට 5 දක්වා වන තම ණය මාර්ග සහ ආධාර වැඩසටහන් සඳහා ආපසු ගෙවීම් කරන්නැයි ඉල්ලා සිටියහොත්, ශ්‍රී ලංකාව නැවතත් අර්බුදයකට ඇද වැටීමයි.

ඉන්දියාව එසේ නොකිරීමෙන් කරුණු දෙකක් පෙන්නුම් කරයි. පළමුව, ආත්මාර්ථකාමීත්වයේ පටු දෘෂ්ටිකෝණයෙන් බලන කල, ශ්‍රී ලංකාව ඉක්මනින් ගෙල සිර කිරීමෙන් ඉන්දියාවට කිසිවක් නොලැබේ. ඉන්දියාව 1980 දශකයේදී එම පාඩම ඉගෙන ගත්තේය. රජයට සහ එල්ටීටීඊයට එරෙහිව තම තුරුම්පු ඕනෑවට වඩා ගසන්නට ගිය විට සිදු වූයේ, ලෝකයේ ප්‍රබලතම හමුදාවක් තරුණ ගරිල්ලා සටන්කරුවන් අතින් නින්දිත පරාජයකට මුහුණ දීමයි. එහි නායකයා අවසානයේදී, ඉන්දීය අගමැතිවරයා ඝාතනයට සැලසුම් කර එය ක්‍රියාත්මක ද කළේය. ශ්‍රී ලංකාවෙන් ප්‍රයෝජන ලබාගත හැක්කේ එහි ස්ථාවරත්වය ඇති කිරීමෙන් බව ඉන්දියාව වටහාගෙන තිබේ. එක් ආකාරයකින් සලකා බැලූ විට මෙන්ම අපගේ මතය ද අනුව, 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියාවේ බල කිරීම සඳහා හේතු වන්නේ මෙයයි. ඉන්දියාව 13වන සංශෝධනයෙන් ඔබ්බට යාමට කැමති නැත. මන්ද එසේ කිරීමෙන් ජාතිකවාදී කොටස් අවදි වී නැවතත් අවුල් ජාලයක් නිර්මාණය විය හැකිය.

ශ්‍රී ලංකාවේ අර්බුදයට ඉන්දියාවේ ප්‍රතිචාරය තීරණය කරන දළ තර්කය ද එයයි. අර්බුදකාරී කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාව සමඟ සබඳතා තහවුරු කරගැනීමෙන් ඉන්දියාව පැහැදිලි, ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභ ලබා ගත්තේය. එහෙත් එය එහි සීමාව ඉක්මවා ගියේ නැත. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාව කලින් ලබාගත් ණය සහ අනෙකුත් බැඳීම් පියවන තෙක් තවදුරටත් ඉන්ධන ණය මාර්ග සැපයීම ප්‍රමාද වන බව නිවේදනය කිරීමට පෙර එය මාස ගණනක් බලා සිටියේය. ඉන්දියානු ආයෝජන ව්‍යාපෘති කඩිනම් කිරීම වැනි ක්‍රියාමාර්ග ද ගත්තේ ඉවසීමෙනි. තත්වය ඉන්දියාවට වාසිදායක ලෙස කොතරම් වර්ධනය වී ඇත්ද යත්, වසර දෙක තුනකට පෙර සිතාගත නොහැකි වූ දේ කළ හැකි විය. ශ්‍රී ලංකාව ඉන්දියානු ආයෝජන ප්‍රවර්ධනය කරනවා පමණක් නොව, ඉන්දියානු මුදලින් වෙළඳාම් කිරීම ගැන ද කතා කරයි. රජය සමඟ මීළඟ ගිවිසුමට එළඹීමට පෙර, තත්වය සාමාන්‍ය වන තුරු බලා සිටීමට ඉන්දියාව කැමති බව පෙනේ. ඒ සඳහා දිල්ලිය 2023 මැයි මාසයේදී ඩොලර් බිලියනයක ණය පහසුකමක් තවත් වසරකින් දීර්ඝ කිරීමට එකඟ විය.

මෙහිදී අප සිත්ගන්නා කරුණ නම්, විශේෂයෙන්ම රුසියානු-යුක්රේන යුද්ධයෙන් පසුව සහ බ්‍රසීලයේ ජනාධිපති ලෙස ලූලා ද සිල්වා තේරී පත්වීමෙන් පසු මෑත මාසවල ඉහළ ගිය ප්‍රවණතාවක් වන්නේ ඩොලරය ඉවත් කිරීම සඳහා ඉන්දියාව දරන උත්සාහයයි. ඒ සමග ශ්‍රී ලංකාවේ ඉන්දියාව සමග භූ දේශපාලනික රඳාපැවැත්ම සම්බන්ධ වී තිබේ. මෙමගින් දෙරටටම හානියක් සිදුවන්නේ නැත. ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශාලතම ප්‍රතිලාභියා ලෙස පැවතීම හා ශ්‍රී ලංකාව අර්ධ වශයෙන් ඩොලර් ඉවත් කිරීම කරා ගමන් කරමින් සිටීම අතර සමීප බැඳීමක් ඇත. මෙහිදී ශ්‍රී ලංකාවේ පරමාර්ථය වන්නේ දිල්ලිය සමඟ සබඳතා තහවුරු කර ගැනීම මිස බහු ධ්‍රැවීයතාවක් සඳහා කිසිදු මතවාදී බැඳීමක් නොවේ. ඒ සඳහා එක් උදාහරණයක් නම්, රුසියානු යුක්රේන ආක්‍රමණය සම්බන්ධයෙන් ගෝලීය දකුණේ සෙසු රටවල් සමග පොදුවේ මධ්‍යස්ථ ස්ථාවරයක් අනුගමනය කරන අතර, ශ්‍රී ලංකාව මේ දක්වා රුසියාවෙන් තෙල් ආනයනය කිරීමට තිබුණු අවස්ථාව පාවිච්චි කර නොතිබීමයි. ඒ වෙනුවට, ඉන්දියාව හරහා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව කැමැත්තක් දක්වයි.

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාව විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් එක මතයක සිට නැති තරම්ය. මෙහි ඇති ප්‍රශ්නය වන්නේ ශ්‍රී ලංකාව අනුගමනය කරන ප්‍රතිපත්තිය සහ අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය කුමක්ද යන්නයි. මෙම වසර මුලදී, විපක්ෂ මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න බහු පක්ෂපාතීත්වයන් සහිත ප්‍රතිපත්තියක් වෙනුවෙන් තර්ක කළ අතර විදේශ අමාත්‍ය අලි සබ්රි ද ඊට එකඟ විය. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාව විදේශයන්හි සිය (ආර්ථික) අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දිය යුතු අතර, නොබැඳී සිටීම වැනි අතීත මූලධර්මවලට ඇති ඕනෑම මතවාදී බැඳීමක් ඊට අඩුවෙන් සැලකීමට සිදුවනු ඇත. එහෙත්, මෙම ප්‍රතිපත්තියට අනුගත වන අතර, අවම වශයෙන් න්‍යායාත්මකව, ශ්‍රී ලංකාව නොබැඳි ගෝලීය දකුණ සමඟ ඇති සබඳතා අත්හැර නැත. Yuang Wang 5 චීන නෞකාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දෙබිඩි ප්‍රතිචාරයට හේතුව එයයි. එයට හම්බන්තොට ඉඩ දීමෙන් ඉන්දියාව කැළඹීමට ලක්වන බව පැහැදිලි වුවද, එය ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ ශ්‍රී ලංකා නිලධාරීන්ගේ ව්‍යාකූලත්වය හේතුවෙන් එම යාත්‍රාව ප්‍රතික්ෂේප කිරීමට ද ශ්‍රී ලංකාවට නොහැකි විය. එය ශ්‍රී ලංකා මුහුදු සීමාවට ළඟා වූ පසු රටට ඇතුල් වීම ප්‍රතික්ෂේප කළ නොහැකි විය. එම ව්‍යාකූලත්වය 2022 ජූලි මාසයේදී රුසියාවේ Aeroflot ගුවන් යානය සම්බන්ධයෙන් ද දැකිය හැකි විය.

චීනය තවත් අවුල් ජාලයකි. අර්බුදය සහ ඒ සම්බන්ධයෙන් චීනයේ නොසැලකිලිමත් ප්‍රතිචාරය, චීන ණය උගුල් සහ මිලිටරි උපායන් පිළිබඳ බටහිර ආඛ්‍යානවලට ඉඩ සපයයි. මතවාදී දිශානතිය කුමක් වුවත්, ශ්‍රී ලංකාවේ ආර්ථික විද්‍යාඥයන් චීනයට දොස් පැවරීම හෝ බටහිර ආඛ්‍යාන නිෂ්ප්‍රභ කිරීම ප්‍රතික්ෂේප කර තිබේ. බටහිර විචාරකයෝ අර්බුදයේ වරද චීනයට පටවති. ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් චීනයේ ප්‍රහේලිකාමය හැසිරීම සැලකිල්ලට ගෙන, බීජිං වෙත ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිචාරය බොහෝ දුරට ධ්‍රැවීකරණය වී ඇත. පසුගිය වසරේ අපගේ උපදෙස් විමසීම්වලදී අපි මෙම ධ්‍රැවීකරණය පිළිබඳ අත්දැකීම් ලැබුවෙමු. දකුණු පළාතේ එකගතාවය ලෙස පෙන්නුම් කෙරුණේ එක් මූලාශ්‍රයකින් මෙතරම් ණය කන්දරාවක් ගැනීමෙන් රජයට වැරදී ඇති බවයි. උතුරේ චීනය සම්බන්ධයෙන් දැඩි විද්‍රෝහීත්වයක් දක්නට ලැබිණි. චීනය රාජපක්ෂවරුන් සමග ඇති සම්බන්ධය එම ආවේගයට හේතු විය හැකිය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ අර්බුදයේදී ඉන්දියාව චීනයට සාපේක්ෂව පැහැදිලි වාසියක් ලබාගෙන තිබේ. චීනයේ හැසිරීම කිසිදු පදනමක් නොමැති බව පැවසීම වැරදිය. ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාවලට චීනයේ ව්‍යාකූල ප්‍රතිචාරය බොහෝ දුරට සම්බන්ධ වූයේ ශ්‍රී ලංකාවට ණය සහන ලබා දෙන්නේ නම්, වෙනත් රටවලට, විශේෂයෙන් එහි අප්‍රිකානු හවුල්කරුවන්ට ද, එසේ සහන ලබාදීමට සිදුවනු ඇතැයි යන බියයි. හොඳ හෝ නරක වේවා, ශ්‍රී ලංකාවේ IMF සාකච්ඡා බටහිර ප්‍රාණ ඇපයට ලක්වී ඇති බව චීනයට හැඟී ඇති බව පෙනේ. බටහිර රටවල සහ එක්සත් ජනපදයේ නිලධාරීන් මෙහි සංචාරය කරමින් ඔවුන්ට ලැබෙන ඕනෑම අවස්ථාවක චීනයට දොස් පැවරීම සඳහා භාවිතා කිරීමෙන් චීන ස්ථාවරය සාධාරණීකරණය වේ. වික්ටෝරියා නුලන්ඩ් මේ වසරේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ කළ සංචාරයේදී චීනය සම්බන්ධයෙන් කළ ප්‍රකාශය මේ සඳහා මෑතකාලීනම උදාහරණය විය හැකිය.

මෙය අපව එක්සත් ජනපදය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා වෙත ගෙන එයි. එය හොඳම තත්වයන් යටතේ දෙගිඩියාවෙන් යුක්ත වන අතර නරකම තත්වයන්හිදී දුර්වලය.. එක්සත් ජනපදයේ අභිප්‍රාය කුමක් වුවත්, ශ්‍රී ලංකාවේ ජාතිකවාදී කොටස් දිගින් දිගටම එක්සත් ජනපදය දෙස බලන්නේ සතුරු ආකල්පයෙනි. මෙම සතුරු ආකල්පය බොහෝ විට මනඃකල්පිත බිය මත පදනම් විය හැකිය. එහෙත්, විශේෂයෙන්ම වෙනත් රටවල කටයුතුවලට අත පෙවීම සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ 'කීර්ති නාමයී' එය සාධාරණීකරණය

කරයි. ශ්‍රී ලාංකිකයන් පොදුවේ එම කටයුතු දෙස බලන්නේ අප්‍රසාදයෙනි. මේ සම්බන්ධයෙන්, එක්සත් ජනපදය රට තුළ සිය රාජ්‍ය තාන්ත්‍රික ව්‍යාපාරය ප්‍රතිසංස්කරණය කළ යුතුය. ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර දුර්වල සම්බන්ධතාවලට ජාතිකවාදී කොටස්වලට පමණක් දොස් පැවරීම නිෂ්ඵලය. 2019 දී MCC ගනුදෙනු මතභේදය විසින් පෙන්නුම් කළ පරිදි, වොෂින්ටනය ද වරදකාරී වේ. දිවයින සමඟ ඇති සංස්කෘතික සම්බන්ධතා භාවිතා කර එක්සත් ජනපදයට මෙය විසඳිය හැකිව තිබූ ආකාරය පැහැදිලි කිරීමට අපි XX පරිච්ඡේදයේ උත්සාහ කළෙමු.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පමණක් නොව, අධික ලෙස එකිනෙකාගෙන් වෙන්ව බලවත් වූ වූ බහු ධ්‍රැවීය ලෝකයක වෙනස්වීම් සහ විචල්‍යයන් කෙරෙහි සංවේදී ගෝලීය දකුණේ සෙසු රටවල් සම්බන්ධයෙන් ද එක්සත් ජනපදය විසින්ම මෙම උභතෝකෝටික තත්ත්වය අවබෝධ කරගෙන එකඟ වී ඇති බවට ලකුණු තිබේ. ”එක්සත් ජනපදය, චීනය සහ 'නව නොබැඳි' රටවල්” යන මාතෘකාව යටතේ Brookings ආයතනය විසින් සම්පාදනය කරන ලද මෑත කාලීන ප්‍රතිපත්ති සාරාංශයක දී, විද්වතුන් තිදෙනෙකු දකුණු ආසියාවේ, මැදපෙරදිග සහ දකුණුදිග අප්‍රිකා රටවල් සමඟ සම්බන්ධ වීමට අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි. චීනයට වඩා වැඩි ඉඩක් ලබාගැනීම සඳහා තරඟ කරනවාට වඩා එය හොඳ බව පවසයි. මෙම කලාපවල චීනයට සැලකිය යුතු ආර්ථික පැවැත්මක් ඇති බැවින් “එක්සත් ජනපදය නායකත්වය දෙන ගෝලීය අනුපිළිවෙල” අනුගමනය කරන්නැයි රටවලට ඒත්තු ගැන්වීමට එක්සත් ජනපදය අසමත් වී තිබේ. සීතල යුද්ධය සමයේ මෙන් “අප සමඟ නොමැති නම් අපට විරුද්ධය” යන පදනමින් තවදුරටත් කටයුතු කළ නොහැකිය. එම නිසා, විකල්ප පරාසයක් ක්‍රියාත්මක කළ යුතුව තිබේ. එක් විකල්පයක් නම්, ”චීනයේ නායකත්වයෙන් යුතු ක්‍රමය බාධාවකින් තොරව අඩපණ වීමට ඉඩහැරිය යුතුය.”

මෙමගින් අවධානය සම්බන්ධ වෙනසක් නිරූපණය වේ. චීනය සමග සෘජුව ගැටුමට එරෙහිව එහි කතුවරුන් අනතුරු අඟවා තිබියදීත්, එම ලේඛනය විසින් ද ශක්තිමත් කරන්නේ තමන් අත්හළ බව කියන පැරණි චීන විරෝධී අධ්‍යානයමය. එනම්, මෙම රටවල් සහ කලාප සමඟ බීජිං හි මැදිහත්වීම්වලට හාත්පසින්ම වෙනස් ප්‍රවේශයකට එළැඹීමක් එමගින් සිදුවන්නේ නැත. වෙනත් වචන වලින් කිවහොත්, විශේෂයෙන් අප වැනි රටවල් සම්බන්ධයෙන් ගත් කල, එක්සත් ජනපද ශාස්ත්‍රාලිකයින් බොහෝමයක් ද්විපාර්ශ්වික සබඳතා දකින්නේ චීනය සමඟ ඇති තරඟකාරිත්වය මත පදනම්වය. මෙම නිශ්චිත ලියවිල්ලේ ඇති එකම වෙනස වන්නේ, එක්සත් ජනපදය චීන අරමුදල් සපයන ව්‍යාපෘති වළක්වාලීමට නිර්දේශ කිරීම වෙනුවට ඒවා ලබාග න්නා රටවල පවතින මූල්‍ය අර්බුදය නිසා එවැනි ව්‍යාපෘති අසාර්ථක වන තෙක් එක්සත් ජනපදය බලා සිටිය යුතු බව නිර්දේශ කිරීමයි. මෙය වෙනත් වචන වලින් කිවහොත්, අලුත් බෝතල්වල පැරණි වයින්ම වේ.

එපමණක් නොව, පසුගිය වසරේ විරෝධතා සහ එක්සත් ජනපදයේ මැදිහත්වීම සලකිල්ලට ගත් විට ගැටලුව වඩාත් සංකීර්ණ වේ. ප්‍රකට ජාතිකවාදී මන්ත්‍රීවරු වේදිකාවට ගොඩවී විරෝධතා හැඩගැස්වීමේදී එක්සත් ජනපද තානාපතිවරයාගේ හස්තයක් ඒ පසුපස තිබුණු බව අවධාරණය කරන අතර, වත්මන් රජය සහ එහි පූර්වගාමියා යන දෙඅංශයේම විවේචකයින් එක්සත් ජනපද රජයට චෝදනා කරන්නේ ඔවුන් බලයට ගෙන ඒමට එක්සත් ජනපද රජය කුමන්ත්‍රණය කළ බව පවසමිනි. මේ චෝදනා හුදු චෝදනා පමණකි. කෙසේ වෙතත්, ඒවා ඉක්මනින් අමතකව යන්නේ නැත. අනෙක් අතට, චීනය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතාවල සහ එක්සත් ජනපද චීන ආතතිවල ප්‍රිස්මය හරහා රට දෙස බලන එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාව උපායමාර්ගික සාගරයක උපායමාර්ගික මුරපොලක් ලෙස සලකනු ඇතැයි අනාවැකි කීම සාධාරණ ය. ඒ සම්බන්ධයෙන් ගත් කල, ඉන්දියාව, චීනය සහ එක්සත් ජනපදය යන රටවල් තුනම සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා තීරණය කිරීමෙහිලා ඉන්දීය සාගරය දිගටම වැදගත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නිර්වචනය කිරීමෙහිදී භූ දේශපාලනික ආතතීන් තුනක් මෙලෙස අදාළ වේ. ඒවා නම්, රුසියා-යුක්රේන යුද්ධය, චීන-එක්සත් ජනපද ගැටුම සහ චීන-ඉන්දියා ස්ථාවරය වේ. මෙම ගැටුම්වලින් දෙකක් ශ්‍රී ලංකාවේ බලවත්ම කලාපයෙන් බැහැර හවුල්කරුවා වන චීනය සමග සම්බන්ධ වන නිසාත්, චීනය උපාය මාර්ගික හවුල්කරුවෙකු ලෙස රුසියාවට සම්බන්ධ වී ඇති නිසාත්, භූ දේශපාලනික සාධකයක් ලෙස බීජිං ශ්‍රී ලංකාවේ බාහිර සබඳතා තුළ සැලකිය යුතු ලෙස ඉස්මතු වේ. ශ්‍රී ලංකාව මෙහිදී බරපතල අවුලකට මුහුණ දෙයි. එයට පැත්තක් ගත නොහැක. එසේම, පැත්තක් නොගෙන සිටීමට ද නොහැක. අප පෙන්වා දී ඇති පරිදි බහු පාක්ෂිකභාවය යන යෙදුම බොහෝ දෙනෙකුට බොහෝ දේ අදහස් කළ හැකි වුවද, රජය නිල වශයෙන් බහු පාක්ෂිකභාවයේ උපාය මාර්ගයක් අනුගමනය කර ඇත්තේ මෙම ප්‍රහේලිකාව විසඳීමට විය හැකිය. හොඳම දෙය නම්, එමගින් වියට්නාමය දැන් චීනය සහ එක්සත් ජනපදය යන දෙරට විෂයෙහි කටයුතු කරන ආකාරය ආදර්ශයට ගත් තුලනයක් ඇති කිරීමට හැකි වීමයි. නරකම දෙය නම්, එය විසින් අපව පාර්ශ්ව කිහිපයක් සමඟ ගැටගසා තැබීමේ අක්‍රමවත් ප්‍රතිපත්තියක් නිර්මාණය

කිරීමයි. ශ්‍රී ලංකාව වෙනුවෙන් බහු පාක්ෂික උපාය මාර්ගයක් සාර්ථක වීම සඳහා, රජය සිය ගනුදෙනුවලදී වඩාත් ස්ථාවර විය යුතු බව අපි විශ්වාස කරමු. විශ්‍රාමික රාජ්‍ය තාන්ත්‍රිකයෙකු විසින් එය ශ්‍රී ලංකාවේ ත්‍රිත්ව අර්බුදය ලෙස පෙන්වා දෙන ලදි. එනම්, චීනය-ඉන්දියාව-එක්සත් ජනපදය යන පාර්ශ්ව තුන සමග සබඳතාවයි.

මෙය කිරීම කියන තරම් පහසු නැත. මන්ද, කුඩා රාජ්‍යයක් වන අතරම, තවත් අතකින් කලාපීය ආධිපත්‍යයක බලපෑමට ලක් වූ රාජ්‍යයක් ද වෙමින්, සමහර විට ලෝකයේ වඩාත්ම උණුසුම් තරඟකාරී සාගරය මධ්‍යයේ, ශ්‍රී ලංකාව එහි බොහෝ අසල්වැසියන් භුක්ති විඳින ස්ථාවරත්වයේ සුවපහසුව භුක්ති විඳින්නේ නැත. කෙසේ වෙතත්, එම හේතුව මත ස්ථාවර, පරිපූර්ණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාව වැළකිය යුතු නැත. උදාහරණයක් ලෙස පසුගියදා ජපානයේ පැවති නිකේ සමුළුවේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැහැදිලිවම හඳුනාගත් කරුණක් වන්නේ නැඟී එන ආසියාවේ ජාතීන් එක්සත් විය යුතු බවයි. මේ සම්බන්ධයෙන් ආසියාවට වාසිදායක විය හැකි සන්ධාන ස්වරූප මොනවාද යන්න ඔහු පැහැදිලිව සඳහන් කළේ නැත. එහෙත්, ඔහු තීරය සහ මාර්ගය මුලපිරීමේ (Belt and Road Initiative) මූලෝපායේ පමණක් නොව, එක්සත් ජනපදයේ ඉන්දු-පැසිෆික් උපායමාර්ගයේ ද සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව සඳහා විශිෂ්ට දැක්මක් ඔහු ගෙනහැර දැක්වීය. ශ්‍රී ලංකාව අද පැටලී සිටින භූ දේශපාලනික සංකීර්ණතා සැලකිල්ලට ගෙන, ධ්‍රැව දෙකක් සේ වෙන්ව පවතින BRI සහ ඉන්දු පැසිෆික් උපායමාර්ගය ශ්‍රී ලංකාව විසින් තුලනය කරන්නේ කෙසේදැයි අපට ප්‍රශ්න කළ හැකිය. එහෙත් එවැනි ප්‍රකාශයන් මගින් වඩාත් සංයුක්ත, සාකල්‍ය විදේශ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ වත්මන් රජයට දැනුවත්භාවයක් ඇති බව හෙළි කරයි.

ශ්‍රී ලංකාව මෙම ප්‍රතිපත්තිය සමඟ සම්බන්ධ වීමෙන් වැළැක්වූ සහ ඒ අතර එය නිල වශයෙන් ප්‍රවර්ධනය කිරීමට රජයට බල කළ කරුණ වන්නේ බලවත් රාජ්‍යයන්ට බැඳී ඇති ශ්‍රී ලංකාවේ පරායත්ත සම්බන්ධතා ජාලයයි. ආර්ථික වශයෙන්, එය බටහිර වෙළඳපොළවල් සමග බැඳී ඇත. විශේෂයෙන් එක්සත් ජනපදය හා යුරෝපීය රටවල් සමග එසේ බැඳී සිටියි. මෙම රාජ්‍යයන් මත ශ්‍රී ලංකාවේ යැපීම මානව හිමිකම් ගැටලුව වෙළඳාම සමග සම්බන්ධ කිරීමේ ඊනියා "ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ" ප්‍රවණතාව නිසා තීව්‍ර වී ඇත. යුරෝපා සංගමයේ ජීඑස්පී ප්ලස් පහසුකම මේ සඳහා කදිම උදාහරණයකි. මෙම පහසුකම අත්හිටුවීම ශ්‍රී ලංකා ආර්ථිකයට දරාගත නොහැක. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සහ යෝජිත විකාශන අධිකාරී පනත වැනි මහජන උපදේශන නොමැති නීති. එවැනි නීති මගින් රටේ ජීඑස්පී ප්ලස් තත්ත්වය අවදානමට ලක්විය හැකි බව යුරෝපීය නිලධාරීන් නිතර ඇඟවුම් කර ඇත. කාරණා තව දුරටත් සංකීර්ණ කරමින්, මෙම නිලධාරීන් රුසියා-යුක්රේන යුද්ධය ප්‍රමුඛ කාරණා කිහිපයක් සම්බන්ධයෙන් බහුපාර්ශ්වික ආයතනවලදී ශ්‍රී ලංකාවේ සහයෝගය ලබාගැනීම සඳහා බලපෑම් කර ඇත. කෙසේ වෙතත්, යුද්ධය පිළිබඳ ශ්‍රී ලංකාවේ ඡන්ද වාර්තාව පෙන්නුම් කරන පරිදි, එවැනි උත්සාහයන් මෙතෙක් පල දරා නැත.

මෙම වර්ධනයන් අනුව, ශ්‍රී ලංකාවේ උපාය මාර්ගය කුමක් විය යුතුද? නොබැඳි ව්‍යාපාරය තුළ, අපගේ සම්බන්ධතා දිගටම පවත්වාගෙන යාම සඳහා අපට කටයුතු කළ හැකිය. විශේෂයෙන්ම ඩොලර් භාවිතය අවම කිරීමේ සංදර්භය තුළ එසේ කළ  හැකිය. දැනටමත් SWIFT වෙනුවට විකල්ප ජාත්‍යන්තර ගෙවීම් ජාලයක් දියත් කිරීමට ශ්‍රී ලංකාව ඇතුළු රටවල් නවයක මහ බැංකු තාවකාලිකව එකඟ වී ඇත. අනෙකුත් රටවල් අට වන්නේ බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය, මියන්මාරය සහ ඉරානයයි. මෙම රටවල් තුන්වන ලෝකය හෝ ගෝලීය දකුණ පමණක් නොව නැඟී එන ආසියා-පැසිෆික් කලාපය ද පුළුල් ලෙස නියෝජනය කරයි. මේ සමඟ බැඳී, බහුපාක්ෂිකත්වය ප්‍රවර්ධනය කරන බහුපාර්ශ්වික සංසද සමඟ ශ්‍රී ලංකාව සිය සබඳතා තහවුරු කරගත යුතුය. මේවා අතර ප්‍රමුඛයා වනුයේ ෂැංහයි සහයෝගිතා සංවිධානය හෙවත් SCO ය. SCO වැනි සංවිධානවල සාමාජික රටවලට, විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි කුඩා රටවලට, බහුපාර්ශ්වික කණ්ඩායම් රාමුවක් තුළ ද්විපාර්ශ්වික සබඳතා සහ අවශ්‍යතා ලුහුබැඳීමට අවස්ථාව ලබා දෙන බව අපි විශ්වාස කරමු. මෙවන් පසුබිමක දීර්ඝ කාලයක් දකුණු ආසියාව දෙස බලා සිටි කලාපයක් වන මධ්‍යම ආසියාව සමඟ ශ්‍රී ලංකාවට සිය සබඳතා තහවුරු කර ගත හැකිය.

BRICS සංවිධානයේ මෑතකාලීන නැගීම මගින් විශේෂයෙන්ම මධ්‍යම සහ ලතින් ඇමරිකාවේ ගෝලීය දකුණ සමඟ ඇති සබඳතා පුළුල් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට අවස්ථාවක් ලැබේ. ඇත්ත වශයෙන්ම, අපගේ කණ්ඩායම සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකදී විදේශ අමාත්‍ය අලි සබ්රි මෙක්සිකෝව වැනි රටවල් සමඟ සම්බන්ධතා තහවුරු කර ගැනීමේ වැදගත්කම සඳහන් කළේය. අප ඇමරිකානු සබඳතා එක්සත් ජනපදය සමඟ පමණක් සීමා කරගෙන ඇත. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ ප්‍රබලතම හවුල්කරුවන් සමග, විශේෂයෙන් චීනය සමග, ආර්ථික සම්බන්ධතාවලින් සැලකිය යුතු ප්‍රතිලාභයක් ලබා ඇතත්, අප්‍රිකාව වැනි කලාප සම්බන්ධයෙන් කිසි විටෙකත් සොයා බලා නොමැත.

ඇත්ත වශයෙන්ම, 2019දී විදේශ අමාත්‍යාංශය අප්‍රිකාව පිළිබඳ ප්‍රතිපත්ති පත්‍රිකාවක් ලියා ඇති අතර, කලාප දෙක අතර හවුල් සංස්කෘතික උරුමයන් එමගින් ඉස්මතු කරයි. කෙසේ වෙතත්, බොහෝ ප්‍රතිපත්ති පත්‍රිකාවලට සිදු වූ ආකාරයටම මෙය ද අතහැර දමා ඇති බවක් පෙනේ. අප්‍රිකාවේ ආර්ථික ගැටලු ද, ඔවුන්ව සමඟ සබඳතා වඩා විධිමත් කරගන්නට ඉවහල් කරගත හැකිය. විශේෂයෙන් සීතල යුද සමයේදී, අප්‍රිකාව ආසියාව සමග සහයෝගීතාවයෙන් සිටි මහාද්වීපයකි. එවැනි ස්ථාවරයක් සමඟ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ බහු පාක්ෂිකත්ව උපායමාර්ගය ගැලපේද යන්න ගැටලු සහගතය. කෙසේ වෙතත් අප්‍රිකාව තක්සේරු කරගත යුතු බව අපි තරයේ විශ්වාස කරමු.

අවසාන වශයෙන් මෙය ද සඳහන් කළ යුතුය. ආසියාව නැගී එමින් පවතින්නා සේම වෙනස් වෙමින් ද පවතී. මැතිවරණ හා ආර්ථික වශයෙන් එය වසර 30කට පෙර පැවති ආසියාව නොවේ. ප්‍රධාන ධාරාවේ පක්ෂ දිගින් දිගටම බලයේ සිටියද විවිධ රටවල ප්‍රධාන ධාරාවේ දේශපාලනය ප්‍රතික්ෂේප වෙමින් පවතී. පසුගිය දා තායිලන්තයේ පැවති මැතිවරණයෙන් මේ බව බොහෝ දුරට පැහැදිලි වේ. ඉන්දියාවේ ද, විපක්ෂ නායකවරයා සිරගත කර ඇතත් භාරතීය ජනතා පක්ෂයේ ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි අප්‍රසාදයක් ඇති බව පෙනේ. අපගේ අදහස වන්නේ ශ්‍රී ලංකාවේ දේශීය දේශපාලනය එහි විදේශ ප්‍රතිපත්තියෙන් හුදකලා කළ නොහැකි බවයි. එබැවින් එහි විදේශ ප්‍රතිපත්තිය නැවත ක්‍රමාංකනය කිරීමේ ඕනෑම උත්සාහයක් අර්ථවත් දේශීය දේශපාලන ප්‍රතිසංස්කරණ සමඟ සැසඳිය යුතුය. එමඟින් විදේශ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වඩාත් ඵලදායී කළ හැකිය. මේ වන විට, ශ්‍රී ලංකාවේ ප්‍රධාන මතභේදය හෝ සාකච්ඡාවේ ලක්ෂ්‍යය වන්නේ දැනට පවතින ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියයි. එහෙත් ගණන් කළ නොහැකි තරම් සංඛ්‍යාවක් වෙනත් රටවල අත්දැකීම් මගින් පෙන්නුම් කරන පරිදි, එවැනි ක්‍රියාවලීන් අර්ථවත් දේශපාලන ප්‍රතිසංස්කරණ සමඟ ගැලපීම අවශ්‍ය වේ. රට පුරා සිටින ශ්‍රී ලාංකිකයන් කෑගසා ඉල්ලා සිටින්නේ ද එයයි. මෙම වර්ධනයන් දිවයිනේ විදේශ ප්‍රතිපත්තියෙන් හුදකලා කර බැලීම අති සරල ක්‍රියාවකි. ඒවා එකිනෙක සමග සම්බන්ධ වී ඇති අතර ශ්‍රී ලංකාව එසේ නොවේය හෝ එසේ වීම අවශ්‍ය නැත යන මිථ්‍යාවට ගොදුරු නොවිය යුතුය. ඒ සඳහා, රටේ අර්බුද රාජ්‍ය තාන්ත්‍රිකභාවය මනාව සකස් කර ගැනීමට උත්සාහ කළ යුතු අතර, එය අද දවසේ දැඩි අවශ්‍යතාවක් ලෙස පවතී.




# ආරක්ෂක සහයෝගීතාව

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආරක්ෂක සහයෝගීතා යාන්ත්‍රණයන් දෙස ආපසු හැරී බලන විට, ශ්‍රී ලංකාව භූගෝලීය හා වාණිජමය වශයෙන් ඉතා වැදගත් ස්ථානයක පවතින දූපතක් බව සඳහන් කිරීම වැදගත් කරුණකි. මෙම වැදගත්කම මූලික වශයෙන් අපගේ දකුණු වෙරළට ආසන්නව ඇති කාර්යබහුල නාවික මාර්ග නිසා ඇති වූවක් බව හඳුනා ගත හැකිය.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව කෙරෙහි ද බලපා ඇති වැදගත්ම සාධකයක් වන්නේ පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව වෙනත් තැන්වල ඇති වූ ගැටුම් සම්බන්ධයෙන් තරමක් දුරට නොබැඳි ප්‍රතිපත්තියක සිට කටයුතු කිරීමයි.

2022 අප්‍රේල් මාසයේදී ආණ්ඩු විරෝධී විරෝධතා උත්සන්න වීමට හේතු වූ වත්මන් ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිරූපය බිඳ වැටී ඇති බව සහ එහි ප්‍රතිවිපාක මේ වන විට නිරීක්ෂණය කළ හැකි බව ද කෙනෙකුට තර්ක කළ හැකිය.

රට තුළ උද්ගතව ඇති අර්බුදකාරී පසුබිම තුළ ජාතියක් වශයෙන් සහ පුද්ගලයන් වශයෙන් මතුවිය හැකි වෙනත් ජාතික ආරක්ෂක තර්ජනවලට සාමූහිකව මුහුණ දිය හැකි ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීම ද අතිශයින් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ ඇති වී තිබෙන අර්බුදයෙන් ජාතිය මුදාගත හැකි රටවල් සමඟ ඇති සබඳතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට ආර්ථික අර්බුදය විසින් බලධාරීන්ට බල කර ඇත. මේ නිසා, අප අපගේ සමීපතම අසල්වැසියන්ගේ ආරක්ෂාව, විශේෂයෙන්ම ඉන්දියාවේ ආරක්ෂාව, සම්බන්ධයෙන් අපගේ තීරණ සහ ක්‍රියාවන් හරහා නිශේධනීය බලපෑමක් නොවීමට අප වගබලා ගැනීම අතිශය වැදගත්ය.

කොළඹ වරායට බොහෝ නැව් පැමිණෙන ඉන්දීය සාගරයේ නැගෙනහිර-බටහිර ප්‍රධාන මුහුදු මාර්ග ආසන්නයේ රට පිහිටා තිබීම හේතුවෙන් රට තුළ ඇති වූ අර්බුදය වෙළෙඳාමට දැඩිව බලපා ඇත. කොළඹ වරාය දකුණු ආසියා කලාපයේ කාර්යබහුලම ප්‍රති නැව්ගත කිරීමේ වරායක් ලෙස සැලකිය හැකි අතර එබැවින් මුළු කලාපයටම වෙළෙඳාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඉතා වැදගත් වේ.

කෙසේ වෙතත්, 2022 මුල් භාගයේදී රටේ ආර්ථික අර්බුදය උග්‍ර අතට හැරිණි. අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව විදේශ ණය ගෙවීම අත්හිටවූවාය. 2022 මැයි මාසයේ විරෝධතා හේතුවෙන් ජනාධිපති ඉල්ලා අස් වූ අතර, ජුනි මාසයේදී කොළඹ වරාය විසින් මෙහෙයවනු ලබන බහාලුම් පරිමාවේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. ඉන් පසු මාස කිහිපය තුළ ඇති වූ ඉන්ධන හිඟය නිසා භාණ්ඩ බහාලුම් ප්‍රවාහනය කළ හැකි ට්‍රක් රථ සංඛ්‍යාව පහත වැටුණි. වරායේ කටයුතුවල පසුබෑමක් ඇති වූ අතර, අවසානයේදී නැව් සමාගම්වලට ඔවුන්ගේ භාණ්ඩ ඉන්දියාවේ වරායන් වැනි වෙනත් වරායන් වෙත හරවා යැවීමට සිදු විය. මෙම ක්‍රියාවලිය විදේශයන්හි ද සැපයුම් දාම කඩාකප්පල් කර ඇති බව දැකිය හැකිය.

මූලෝපායික භූ පිහිටීම ශ්‍රී ලංකාවේ විශාලතම ශක්තීන්ගෙන් එකකි. ඉන්දියාව වැනි අසල්වැසි රටවල් සමඟ යහපත් සබඳතා පවත්වමින් එහි පිහිටීමෙන් ප්‍රතිලාභ ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ශ්‍රී ලංකාව වැඩි අවධානයක් යොමු කළ යුතුය. සෑම තත්වයකදීම ඉන්දියාව දැනුවත් කිරීම රටේ ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීමේ ප්‍රධාන ගාමක බලවේගයකි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සමීපතම අසල්වැසියා වන නමුත්, ඉන්දියාව උතුරු නැගෙනහිර බෙදුම්වාදීන්ට ආධාර කිරීම හා බලහත්කාරී ඉන්දු ලංකා ගිවිසුම හේතුවෙන් දෙරට අතර මිත්‍රත්වයට බලපෑමක් සිදු විය. පසුගිය වසර 70 තුළ ඔවුන් ශ්‍රී ලංකාවට ලබා දුන් ආධාර ද සිහිපත් කරමින් ඉන්දියාව සමඟ සුපරීක්ෂාකාරී මිත්‍රත්වයක් පැවැත්වීම වැදගත්ය.

මෑතකදී ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරායට චීන නිරීක්ෂණ යාත්‍රාවක් පැමිණීම වැනි සිදුවීම් සමීපතම අසල්වැසියා හට ආරක්ෂක ගැටලු නිර්මාණය කළ හැකිය. එමගින් රටට අතිශයින්ම අහිතකර ප්‍රතිවිපාක ඇති කළ හැකිය. මෙම සිදුවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අසල්වැසි සුපිරි බලවතුන් දෙදෙනා අතර ආතතීන් ඇති වූ අතර කලාපය මත බීජිංහි බලපෑම වැඩි වීම ගැන ඉන්දියානු නායකයෝ සැලකිලිමත් වූහ.

ශ්‍රී ලංකාවට එහි මූලෝපායික පිහිටීමේ ප්‍රතිලාභ ලබා ගත හැකි වඩාත් ඵලදායී ක්‍රමයක් විය හැක්කේ හමුදා රාජ්‍ය තාන්ත්‍රිකභාවය හරහා ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කරගැනීමයි. මෘදු බලයක් හරහා විදේශ ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රටක් සතුව ඇති ආරක්ෂක සම්පත් භාවිතා කිරීම ලෙස මෙම හමුදා රාජ්‍ය තාන්ත්‍රිකභාවය නිර්වචනය කළ හැකිය. මෙය රටවල් අතර ගිවිසුම්වල ස්වරූපයක් ද

විය හැකිය. ලෝකයේ වඩාත්ම කුරිරු ත්‍රස්තවාදී සංවිධානයක් පරාජය කිරීමට සමත් වූ බවට තර්ක කළ හැකි ශ්‍රී ලංකා හමුදාවට තම හමුදා පුහුණුව වෙනත් රටවලට ලබා දීම සඳහා පුහුණු ගිවිසුම්වලට එළැඹිය හැකිය.

කෙසේ වෙතත්, වඩාත්ම වැදගත් දෙය නම්, මෙම සියලු ගිවිසුම් අසල්වැසි රටවල් විසින් ඔවුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් ලෙස නොසැලකිය යුතු වීමයි. මෙම ගිවිසුම් ශ්‍රී ලංකාව මුහුණ දී සිටින ආර්ථික අර්බුදයෙන් ගොඩවීමේ මාධ්‍යයන් බවට පත් කළ හැකිය. මෙම ආකාරයේ ආරක්ෂක සහයෝගීතාවන්ට එළඹෙන අතරම, ශ්‍රී ලංකාව කෙරෙහි සෘජු උපායමාර්ගික උනන්දුවක් දක්වන අසල්වැසි රටවල් සම්බන්ධ වර්ගීකරණයක් කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් ය. එම රටවල් සමග මෙම ගිවිසුම් ක්‍රියාත්මක කළ හැකිදැයි විමසා බැලිය යුතුය. එසේ වුවද, මෙය අසල්වැසි රටවලට පමණක් සීමා නොවිය යුතු අතර, ශ්‍රී ලංකාවෙන් බැහැරව පිහිටි, පසුගිය දශක කිහිපය තුළ රට සමඟ සමග සමීප ආරක්ෂක සහයෝගීතාවක් තිබුණු රටවල් සමග ද, සැලකිය යුතු ශ්‍රී ලාංකික ප්‍රජාවක් හෝ ශ්‍රම බලකායක් සිටින රටවල් සමඟ ද සමීප ආරක්ෂක සහයෝගීතාවක් පවත්වා ගෙන යා යුතුය.

විශේෂයෙන්ම විශාල ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් දැනට වෙසෙන බටහිර ආසියාවේ රටවල් මෙම රාජ්‍ය ලැයිස්තුවට ඇතුළත් විය හැකිය. ශ්‍රී ලංකාවට ආරක්ෂක සහයෝගීතාව ඇතිකරගත හැකි රටවල් වර්ගීකරණයේදී මැලේසියාව වැනි ගරිල්ලා ත්‍රස්තවාදී මෙහෙයුම්වල සැලකිය යුතු පළපුරුද්දක් ඇති රටවල්ද සොයා බැලිය යුතුය. අභ්‍යන්තර කැරැල්ලක් මර්දනය කළ මුල් කාලීන රටක් ලෙස මැලේසියාව සැලකිය හැකිය.

අපගේ මූලෝපායික පිහිටීම අනුව මෙම සියලු රටවල් වර්ග සමඟ ආරක්ෂක ගිවිසුම්වලට හෝ ආරක්ෂක සහයෝගීතා ගිවිසුම්වලට එළැඹීමෙන් ශ්‍රී ලංකාවට බොහෝ ප්‍රතිලාභ අත්කර ගත හැකිය. එහෙත්, මින් පෙර ද අවධාරණය කළ පරිදි, මෙම ගිවිසුම් කිසිදු ආකාරයකින් රටේ ආරක්ෂාවට හානියක් නොවිය යුතුය. මෙම ආරක්ෂක සහයෝගීතා ගිවිසුම්වලට එළඹීමේදී අසල්වැසි රටවල ආරක්ෂාවට ප්‍රමුඛත්වය දීම පිළිබඳව අප සෑම විටම සැලකිලිමත් විය යුතුය.

ශ්‍රී ලංකාව සහ අනෙකුත් රාජ්‍යයන් අතර, විශේෂයෙන්ම සමීපතම අසල්වැසියන් සමඟ, ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කිරීම පිළිබඳව සොයා බලන අතර, ශ්‍රී ලංකාවේ බාහිර හා අභ්‍යන්තර ආරක්ෂක සහ ආරක්ෂක සබඳතා තුළ මෙම රාජ්‍යයන් සමඟ පවතින විවිධ අභියෝග සහ අවදානම් අමතක නොකළ යුතුය.

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් ඉන්දියාව සමඟ බාහිර සහ අභ්‍යන්තර ආරක්ෂක සබඳතා ශක්තිමත් කර ගැනීම වැදගත් වේ. ඇමරිකා එක්සත් ජනපදය සහ චීනය වැනි අනෙකුත් රාජ්‍යයන්ට සාපේක්ෂව, ඉන්දියාව සමඟ ඇති සබඳතා නොසලකා හැරීම හේතුවෙන් ශ්‍රී ලංකාව සාම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ආරක්ෂක අවදානම් රැසකට නිරාවරණය වේ. ඒවා නම්, ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය, ආයුධ ජාවාරම් සහ විවිධ ආකාරයේ සයිබර් අපරාධ වැනි තර්ජනයි.

ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු විය හැකි අනෙකුත් ආරක්ෂක තර්ජන වනුයේ අප දැනට අත්විඳිමින් සිටින ආර්ථික පසුබෑම්, රටේ ජාතික ආරක්ෂාවට බලපෑම් ඇති කළ හැකි ස්වභාවික විපත් සහ සහ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ ඉතිරි වූ කොටස්වල බලපෑම විය හැකිය. විවිධ ස්වරූපවලින් සහ හැඩවලින් පවතින අන්තවාදය මෑත කාලයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන ආරක්ෂක ගැටලුවක් ලෙස ද සැලකිය හැකිය.

ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවී ඇති ආරක්ෂක අභියෝගයන් අතරින් වැදගත්ම කරුණක් වන්නේ සමාජය වෙත මත්ද්‍රව්‍ය ගලා ඒම වැඩි වීමයි. ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය එක්ව මෙය ජය ගැනීමට කටයුතු කළ යුතුය.

මත්ද්‍රව්‍ය හෝ භයානක ඖෂධවල ආරක්ෂක තර්ජනය පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාව තුළ ඉහළ යමින් පවතින තත්වයකි. මත්ද්‍රව්‍ය ජාවාරම් මෙන්ම ඒවා පරිභෝජනය ද රටේ ආරක්ෂාවට සෘජු හා වක්‍ර ප්‍රතිවිපාක රැසක් ඇති කළ හැකිය. දේශපාලන ආරක්ෂාව කෙරෙහි මත්ද්‍රව්‍යවල බලපෑම මෑත වසරවල බහුලව සිදු වූ සිදුවන මහජන නොසන්සුන්තා සහ අනෙකුත් සියලුම අපරාධ තුළින් දැකගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂාවට ද බලපෑම් සිදුවන අතර එය රට තුළ එවැනි තවත් බොහෝ ආරක්ෂක අභියෝගවලට ප්‍රමුඛ හේතුවක් විය හැකිය.

අනෙක් අතට බොහෝ ව්‍යාපාර සහ රාජ්‍ය අංශ ඩිජිටල්කරණය වෙමින් පවතින බැවින් සයිබර් තර්ජන ශ්‍රී ලංකාවේ තවත් ප්‍රධාන ආරක්ෂක ගැටලුවකි. අපගේ සයිබර් අවකාශය ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් සම්පත් අප සතුව තිබීම වැදගත් වේ. නීති විරෝධී දත්ත එක්රැස් කිරීම හා ඒවා අයථා කටයුතු සඳහා භාවිතා කිරීම හේතුවෙන් නිර්මාණය වන සයිබර් තර්ජනවලට මුහුණ දීම සඳහා හමුදාවට පෙරමුණ ගත හැකි වුව ද, බැංකු අංශය වැනි අනෙකුත් අංශ ද මෙම අභියෝග අවම කිරීමට පියවර ගත යුතුය.

මේ අතර පසුගිය මාස කිහිපය තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය සයිබර් ආරක්ෂණ ගැටලු රැසකට බලපෑ ආකාරය ද දැක ගත හැකිය. රුපියල අවප්‍රමාණය වීමත් සමඟ සයිබර් ආරක්ෂණ වැඩසටහන්වල බලපත්‍ර අලුත් කිරීමේ පිරිවැය අහස උසට නැගෙනු දැකිය හැකි විය.

පසුගිය මාස කිහිපය තුළ ෆිෂිං (phishing) ප්‍රහාර, මූල්‍ය වංචා සහ රැන්සම්වෙයාර් (ransomware) ප්‍රහාරවල වැඩිවීමක් දක්නට ලැබුණි. ඒවා සියල්ල සංවිධානාත්මක කණ්ඩායම් විසින් සිදුකළ ඒවා නොවේ. ද්වේෂසහගත චේතනා ඇති අවස්ථාවාදීන් විසින් ඒවා සිදු කරන ලද බව නිරීක්ෂණය විය. මෙම ෆිෂිං ප්‍රහාර වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ නිෂ්පාදන, අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා යන ක්ෂේත්‍රවල වන අතර ඇතැම් වින්දිතයන් ආර්ථික අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ කර්මාන්ත වේ. එම නිසා සයිබර් ආරක්ෂාව සඳහා අවශ්‍ය නිෂ්පාදන වෙනුවෙන් ආයෝජනය කිරීම ඔවුන්ට දුෂ්කර වේ.

මේවාට අමතරව බලශක්ති, සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාව වැනි විශේෂ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන එම ක්ෂේත්‍ර රාජ්‍යයේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම ද වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ විවිධ අමාත්‍යාංශවල සන්නිවේදන නාලිකාවලට ද රට වරින් වර මුහුණ දෙන මෙවැනි ජාතික ආරක්ෂක තර්ජනවලට මුහුණ දීමේදී විශාල වගකීමක් ඇත. කාර්යක්ෂම සන්නිවේදනයක් ඇති වීමට නම් විදේශ කටයුතු අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ තම රාජ්‍ය තාන්ත්‍රික හා මහජන සන්නිවේදන අංශ වර්තමාන යුගයේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලන පරිදි වැඩිදියුණු කළ යුතුය.

සමාජ මාධ්‍ය සහ වෙනත් සමාන නාලිකා හරහා සිදුකරන ඕනෑම ආකාරයක සෘණාත්මක පණිවිඩ යැවීමකට හෝ ප්‍රචාරණයකට ප්‍රතික්‍රියා කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට මෙම අමාත්‍යාංශ දක්ෂ විය යුතුය. එබැවින් රටට මුහුණ දීමට සිදු විය හැකි විවිධ ජාතික ආරක්ෂක තර්ජනවලින් රට ආරක්ෂා කර ගැනීම සඳහාත්, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අභ්‍යන්තරව සහ බාහිරව ධනාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සඳහාත් නවීන තාක්ෂණික ප්‍රවණතාවලට අනුගත වෙමින් විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන ද මහජනතාව සමඟ ප්‍රගාමීව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

ඉන්දියන් සාගරය දැන් ලෝකයේ වඩාත්ම බලගතු වෙළඳ මාර්ගය වන නිසා සහ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මූලෝපායික වශයෙන් වැදගත් ස්ථානයක පිහිටීමත් නිසා මුහුදු කොල්ලකෑම්, මුහුදේ සන්නද්ධ මංකොල්ලකෑම්, මිනිස් ජාවාරම්, ආයුධ ජාවාරම් වැනි විවිධ ආකාරයේ සමුද්‍ර ආරක්ෂක ගැටලු සාගරයේ සිදුවීම ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට ද දැවැන්ත තර්ජනයක් විය හැකිය. මීට අමතරව, කලාපය සතුව පවතින ප්‍රධානම බලය වන සාරවත් ස්වභාවික සම්පත් තොගය වැනි ප්‍රතිලාභ කලාපය තුළ බොහෝ භූ දේශපාලන එදිරිවාදිකම් ඇති වීමට හේතුව බවට පත්ව ඇත.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහාත්, විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සයිබර් අපරාධ වැළැක්වීම සඳහාත් ආරක්ෂක ගිවිසුම්වලට වැඩි වැඩියෙන් එළැඹීමට අප අවධානය යොමු කළ යුතුය. තොරතුරු තාක්ෂණය හා වෙනත් තාක්ෂණයන්ගේ ප්‍රමුඛ හා බලවත් රාජ්‍යයක් වන ඇමරිකා එක්සත් ජනපදය සමඟ ආරක්ෂක ගිවිසුම්වලට එළඹීම සයිබර් තර්ජනවලට එරෙහිව ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් විය හැකිය.

ඉන්දියාවේ, පකිස්ථානයේ සහ බංග්ලාදේශයේ ආරක්ෂක ආයතන සමඟ සුහද සබඳතා වර්ධනය කර ගැනීම සඳහා ෂැංහයි සහයෝගිතා සංවිධානයේ (SCO) පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීම ශ්‍රී ලංකාවට මේ අවස්ථාවේදී ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව වැනි රටවලට SCO හි අනෙකුත් රටවල් සමඟ වෙළඳ අවස්ථා සඳහා ප්‍රවේශය ලබා දීමට ද SOC-TEM වේදිකාවලට උපකාර කළ හැකිය. දැඩි ආර්ථික පීඩනයක් පවතින අවස්ථාවක ශ්‍රී ලංකාවට නව අපනයන වෙළෙඳපොළ හඳුනා ගැනීමට මෙම අවස්ථාව යොදා ගත හැකි අතර එමගින් වැඩි ආර්ථික අවස්ථා විවෘත වේ.




# පර්යේෂණ සහ නවෝත්පාදනය

නිදහසින් පසු රට මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදය හේතුවෙන් නිර්මාණය වී තිබෙන ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික තත්ත්වය තුළ, ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දිගින් දිගටම මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ අපනයනය බව සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය දශක ගණනාවක් තිස්සේ එක තැන පල්වෙමින් තිබේ. අපනයන විවිධාංගීකරණයක් නොමැතිකම, විශේෂයෙන් කලාපයේ රටවල් සමඟ සහ වෙනත් රටවල් සමඟ තරඟ කිරීමට අපහසු වීම සහ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වීමේදී විදේශීය රටවල් මුහුණ දෙන බාධා වැනි බොහෝ හේතු නිසා එසේ සිදු වේ. දශක ගණනාවක් පුරා රට තවමත් සාම්ප්‍රදායික අපනයන මත අධික ලෙස යැපෙමින් පවතින අතර වර්ධනය වන අපනයන තරඟකාරීත්වය හේතුවෙන් රටෙහි විදේශ සංචිත ඉහළ නැංවීමට සහාය වීමට අපනයනයට තවදුරටත් නොහැකි වී තිබේ.

එපමණක් නොව, සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමේදී ද ශ්‍රී ලංකාව සාර්ථක වී නැත. පර්යේෂණ හා සංවර්ධනය සම්බන්ධ සීමාවන් දශක ගණනාවක් තිස්සේ මෙරට අධිතාක්ෂණික අපනයන සංවර්ධනයට බාධාවක් වී ඇත.

2000 දශකයේ මුල් භාගයේ සහ මැද භාගයේදී, සෘජු විදේශ ආයෝජන නොමැතිකම හේතුවෙන් අපනයනවල අඩුවීමක් තිබියදීත්, ශ්‍රී ලංකාව ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධනයක් සහිත රටක් විය. පශ්චාත් යුද සමය තුළ සේවා අංශයේ වර්ධනයක් ඇති විය. කෙසේ වෙතත්, මෙම වර්ධනය ද බොහෝ දුරට දේශීය ආර්ථිකය පාදක කරගත් වර්ධනයක් වූ අතර, විශේෂයෙන්ම දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල් හා සැසඳීමේදී අපනයන සම්බන්ධයෙන් රට තවමත් පෙන්නුම් කරන්නේ අඩු කාර්ය සාධනයකි.

ශ්‍රී ලංකාව තම අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කර ගැනීම සඳහා විශේෂයෙන් කලාපය තුළ අනෙකුත් රටවල සාර්ථකත්වයේ කතාවලින් පාඩම් ඉගෙනගත යුතුය. ශ්‍රී ලාංකික සමාජ, සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික සංදර්භයට අනුව එම අත්දැකීම් වඩාත් යෝග්‍ය අන්දමින් ගලපා ගනිමින් ඓන්ද්‍රියව පවතින නවෝත්පාදනයට ප්‍රමුඛත්වය දිය යුතුය.

බොහෝ විට මිනිසුන්ගේ මනස තුළ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සංකල්ප බටහිර ලෝකය සමඟ සම්බන්ධ වේ. මේවා නූතනත්වය සමග සම්බන්ධ බව ඔවුන් විශ්වාස කරන අතර අවසානයේ ශ්‍රී ලංකාව වැනි රටවල් ඔවුන්ගේ පැරණි දේශීය සම්ප්‍රදායන් විද්‍යාත්මක ලෙස හඳුනා නොගත යුතු බව විශ්වාස කළහ. මේ අනුව, ශ්‍රී ලංකාව සහ "විද්‍යාත්මක" සම්ප්‍රදායන්ගෙන් පොහොසත් අනෙකුත් රටවල් විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ එකම නිර්වචනය "නවීන විද්‍යාව" ලෙස සලකනු ලබන සංකල්පයෙන් නිදහස් විය යුතුය. මෙම රටවල් දේශීය බුද්ධිමය දැනුම හඳුනාගෙන නවෝත්පාදනයන් සහ සමස්තයක් ලෙස විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ ක්ෂේත්‍ර තවදුරටත් දියුණු කිරීම සඳහා ඔවුන් විසින් අනුගමනය කරන ලද සංකල්පීය පදනම භාවිතා කිරීම වැදගත් වේ.

ඉපැරණි ශ්‍රී ලාංකේය ද්‍රව්‍යමය සංස්කෘතිය දෙස බලන විට ශ්‍රී ලාංකිකයන් එදා ස්වභාවික ලෝකයේ ද්‍රව්‍ය සමඟ අන්තර් ක්‍රියා කරමින් ජීවිතය ගත කළ බව අවධාරණය කිරීමට සාධක ගණනාවක් සොයා ගත හැක. අවම වශයෙන් ක්‍රිස්තු පූර්ව 2000 වන විට මෙරට සමාජයට ස්වභාවික ලෝකයේ ගතිකත්වය සහ ක්‍රියාකාරීත්වය පිළිබඳව යම් තරමක දැනුමක් තිබූ බවට පුරාවිද්‍යාත්මක සාධක ඇත.

මේ රටේ පැරණි සමාජයට සාපේක්ෂව සංකීර්ණ බව පෙනෙන ඇතැම් විද්‍යාත්මක සංකල්ප එනම් සමමිතිය හා බලයේ ගතිකත්වය, කාලය හා අවකාශය, පදාර්ථ මැනීම, ද්‍රවස්ථිතික සහ පීඩනය යන සංකල්ප සියල්ල සියවස් ගණනාවකට පෙර සිට පැවත එන ඒවා බව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් සනාථ වේ.

ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තුළ පවතින වඩාත් සිත්ගන්නාසුලු ඇතැම් නව නිපැයුම් මගින් මුල් ශිෂ්ටාචාරයේ කාලවලදී පවා රට සම්පත්වලින් පොහොසත්ව තිබූ බව අඟවයි.

ස්වභාවික සම්පත්වලින් පොහොසත් රටක් වශයෙන්, විශේෂයෙන්ම මිනිරන් විශාල සංචිතයක් තිබෙන බැවින්, ශ්‍රී ලංකාව මෙම සම්පත් අධි තාක්ෂණික අපනයනයන් බවට සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. නවෝත්පාදනයන් නිෂ්පාදනය කිරීම සඳහා මෙම ස්වභාවික සම්පත් භාවිතා කරන අතරම, භාණ්ඩ අලෙවිය ගැන පමණක් සොයා බැලීමට වඩා ඩොලර් රටට ගෙන ඒමට හැකි විදේශ ඉල්ලුමක් ඇති නිෂ්පාදන නිර්මාණය කිරීම කෙරෙහි ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතුය. මෙය කළ හැකි

හොඳම ක්‍රමය වනුයේ අධි තාක්ෂණික අපනයනවලට ප්‍රමුඛත්වය දීම සහ නැනෝ තාක්ෂණය සහ ජෛව තාක්ෂණය සඳහා ජාතික මාර්ග සිතියමක් සකස් කිරීම ය.

ශ්‍රී ලංකාවේ අපනයන විවිධාංගීකරණය සිදු නොවීම නිසා අධි තාක්ෂණික අපනයන එකතැන පල්වෙමින් තිබේ. නැනෝ සහ ජෛව තාක්ෂණ සඳහා ජාතික මාර්ග සිතියම සංවර්ධනය කිරීම මෙම ගැටලුව විසඳීම සඳහා විධිමත් පියවරක් වනු ඇත. බුද්ධිමය ප්‍රාග්ධනය අල්ලා ගැනීමට සහ ශක්තිමත් ස්ථාවරයකින් යුතුව එය භාවිතා කිරීම සඳහා රට තුළ සුසමාදර්ශී වෙනසක් ඇති කළ යුතුය. පසුගිය කාලය තුළ රට මුහුණ දුන් ආර්ථික අර්බුදය වැනි ජාතික ගැටලු බොහොමයක් විසඳීමට ශ්‍රී ලංකාව වැනි රටකට ඇති හොඳම විකල්පය නවෝත්පාදනයයි.

මේ සම්බන්ධයෙන් ඊශ්‍රායලය, සිංගප්පූරුව, ඉන්දියාව වැනි රටවල සාර්ථකත්වයේ කතාවලින් ශ්‍රී ලංකාවට පාඩම් උගත හැකියි. මෙම රටවල් නැනෝ තාක්ෂණය සහ ජෛව තාක්ෂණයේ දියුණුව සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබා දුන් ජාතීන් ලෙස දැක්විය හැකි අතර ඔවුන් වසර ගණනාවක් පුරා තම ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා මෙම නවෝත්පාදනයන් භාවිතා කර ඇත.

ශ්‍රී ලංකාව සතුව ඇති දුර්ලභ ඛණිජ සම්පත් ඇතුළු වටිනා සම්පත් සමූහයෙන් ඇඟවෙන්නේ දැනුම හා තාක්ෂණය යොදා ගනිමින් මෙම සම්පත් දියුණු කර ගනිමින් ආර්ථිකය නංවාලීම සඳහා නවෝත්පාදන සහ අධි තාක්ෂණික අපනයන භාවිතා කිරීමට ශ්‍රී ලංකාවට ද හැකියාව ඇති බවයි. සිය අපනයන විවිධාංගීකරණය කරමින් රට ඉදිරියට ගෙන යාමට උපකාර වන පරිදි නවෝත්පාදනයේ නිර්මාණාත්මක සංරචක උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව බොහෝ දේ කළ යුතුව තිබේ.

කෙසේ වෙතත්, රටක ස්වභාවික සම්පත් නිර්මාණශීලී, නව්‍ය අධි තාක්ෂණික නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සඳහා ක්‍රියාමාර්ගවලට රජයේ සහාය අත්‍යවශ්‍ය සාධකයකි. බොහෝ විට ශ්‍රී ලංකාව වැනි රටවල නව්‍යකරණයේ ඌනතාවය ඒ සඳහා බාධාකාරී රාජ්‍ය ප්‍රතිපත්තිවල පැවැත්ම සමග සෘජුවම සම්බන්ධ වේ. සම්පත්වලට අගය එකතු කිරීම රට තුළ සිදුවන බව සහතික කරන රාජ්‍ය ප්‍රතිපත්ති තිබීම රටකට වැදගත්ය. ශ්‍රී ලංකාව ඉල්මනයිට් වැනි සම්පත් කිසිදු අගයක් එකතු කිරීමකින් තොරව අඩු මිලට අපනයනය කරමින් සිටින බව පෙනේ.

නවෝත්පාදනයන් වර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් දෙස බලන විට, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු (R&D) සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව අපි බොහෝ විට දකිමු. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව විසින් කරන්නේ ඉතා අඩු පර්යේෂණ සහ සංවර්ධන වියදමක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 1% කට වඩා අඩු ප්‍රමාණයකි. ඒ අතරින් විශාල ප්‍රමාණයක් රජයේ වියදම් වේ. රටේ පෞද්ගලික අංශය නවෝත්පාදන සඳහා ආයෝජනය කිරීම ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් ප්‍රගතියක් ලබා ගැනීම සඳහා කාලීන අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාව තුළ නව්‍ය හා නිෂ්පාදන සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා නවෝත්පාදනය සහ නිෂ්පාදනය අතර සම්බන්ධයක් පැවතිය යුතුය.

2009 දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) මෙරට විද්‍යා හා තාක්ෂණ අංශයේ, විශේෂයෙන් නැනෝ සහ උසස් තාක්ෂණ පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නිරත වන ආයතන කීපයකින් එකකි. මෙම ආයතනයේ මූලික අරමුණ වන්නේ රට සතු දැවැන්ත ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකය ශක්තිමත් කිරීමට උපකාරී වන නිෂ්පාදන සංවර්ධනය කිරීමයි. කෙසේ වෙතත්, රට තුළ ප්‍රතිඵල නැඹුරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා වැඩි දායකත්වයක් සපයන එවැනි ආයතන ශ්‍රී ලංකාවට තවත් අවශ්‍ය වේ.

නවෝත්පාදක පරම්පරාවක් නිර්මාණය කිරීම සෑම විටම ආරම්භ වන්නේ පුද්ගලයන්ට ලැබෙන මූලික පාසල් අධ්‍යාපනයෙනි. මේ අනුව නවෝත්පාදන ප්‍රවර්ධනයට සහ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ දියුණුවට අත දීම සඳහා පාසල්වලට උපකාර කරන්නේ කෙසේද යන්න පිළිබඳව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය අවධානය යොමු කළ යුතුය.

විවිධ අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කිරීමෙන් සහ පාසල්වල විෂයමාලා සංශෝධන කිරීමෙන් පාසල්වලට මෙය කළ හැකිය. එම අන්තර්ගතයන් සිසුන්ගේ නිර්මාණශීලීත්වය තවදුරටත් ඉහළ නැංවීමට සහාය විය යුතුය. රටේ පාසල් මට්ටමින් නව්‍යකරණයේ සහ නිර්මාණශීලීත්වයේ අඩුවක් ඇති වීමට ප්‍රධාන හේතුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අතිශයින් විභාග කේන්ද්‍ර කරගත් ක්‍රමයක් වීම විය හැකිය.

ශ්‍රී ලංකාවේ උසස් පෙළ විභාග සඳහා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වාදීම මෙම ගැටලුව විසඳීම සඳහා ගත් එලදායී පියවරක් ලෙස හඳුනාගත හැකිය. ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය සහ තාක්ෂණය සඳහා විද්‍යාව වැනි විෂයන් සිසුන්ට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු කර ගැනීමට යම් තාක් දුරට හැකියාව ලබා දී ඇත.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ද පාසල් මට්ටමේ නවෝත්පාදන සහ නව නිපැයුම් දිරිගැන්වීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත. ඔවුන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සමහර ක්‍රියාමාර්ග වූයේ පාසල් තුළ නව නිපැයුම්කරුවන්ගේ සමාජ හඳුන්වා දීම සහ සිසුන්ට ඔවුන්ගේ පහසුකම් දියුණු කර ගැනීමට අරමුදල් සපයන කර්මාන්ත ව්‍යාපාර සමඟ පාසල් සම්බන්ධ කිරීමයි. ග්‍රාමීය ප්‍රදේශවල පාසල්වලට ඔවුන්ට අලුත් වූ නව තාක්ෂණය සම්බන්ධ විෂයයන් පිළිබඳව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ නිර්මාණශීලීත්වය මතුකර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම කෙරෙහි ද කොමිෂමෙහි අවධානය යොමු වී ඇත.

විද්‍යාව හා තාක්ෂණය දැන් ආර්ථික සංවර්ධනයේ පුරෝගාමී දර්ශකවලින් එකක් බවට පත්ව ඇති බැවින්, මෙම අංශය පුනර්ජීවනය කර සංවර්ධනය කිරීම වැදගත් වන අතර, රටේ තවත් නව්‍යකරණයන් දිරිගැන්වීමේ පොදු අරමුණ සහිතව පාසල්වලට අමතරව විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන සහ වෙනත් තනි පුද්ගල පර්යේෂකයන් සහ විද්‍යාඥයන් වැනි ආයතන ද එක්ව වැඩ කිරීම වැදගත් වේ.

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවලට සහභාගී වීමට ප්‍රජාව තුළ ඇති අකැමැත්ත පිළිබඳ නිරීක්ෂණය කළ හැකි බොහෝ හේතු අතරින් එකක් විය හැක්කේ මෙම ක්ෂේත්‍රය මුළුමනින්ම ඉංග්‍රීසි භාෂාව පාදක කර ගැනීමයි. එබැවින්, රටේ ස්වභාෂාවන්ගේ සන්නිවේදනය කරනු ලබන වඩාත් සරල ක්‍රමවේද අනුගමනය කිරීම මගින් විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන යන ක්ෂේත්‍රවල විශාල ප්‍රජා සහභාගීත්වයක් සිංහලයට දැකගත හැකි වනු ඇත.

2019 වර්ෂයේදී ශිල්පසේනා වැඩසටහන හඳුන්වා දුන්නේ එම අරමුණ පෙරදැරි කරගෙනය. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන මූලික වශයෙන් ඉලක්ක කර ගත්තේ සාමාන්‍ය ජනතාව සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍ර අතර ඇති පරතරය අවම කිරීමයි.

“බලගැන්වීම තුළින් සෞභාග්‍යය” තේමා කරගත් ශිල්පසේනා වැඩසටහන ප්‍රධාන වශයෙන් ගොඩනැගී ඇත්තේ තාක්ෂණය, ව්‍යවසායකත්වය සහ රැකියා වෙළඳපොළ, නවෝත්පාදනය, නීල හරිත ආර්ථිකය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පර්ෂද පහක් මත ය. මෙම පර්ෂද පහ අතරින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය සමාජය අතර ප්‍රචලිත කරමින් පාසල් හා විශ්වවිද්‍යාල සිසුන්ට සහ තනි පුද්ගල පර්යේෂකයන්ට තාක්ෂණික දැනුම ලබා දීම තාක්ෂණ පොකුරෙහි මූලික අරමුණයි.

ශිල්පසේනා වැඩසටහනේ නවෝත්පාදන පර්ෂදය මගින් දේශීය නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන 500කට අධික ප්‍රමාණයක් ප්‍රදර්ශනය කිරීම පිළිබඳව සොයා බලන ලද අතර මෙම නව නිපැයුම් වාණිජකරණය කිරීමේ වැඩසටහන් ද එහි තිබුණි. මෙම නව නිපැයුම් වාණිජකරණයට පෞද්ගලික අංශය දායක වීම වැදගත් වන බැවින්, මෙම ප්‍රදර්ශනය මගින් නව නිපැයුම්කරුවන්ට පුද්ගලික අංශය සමඟ සම්බන්ධයක් ඇති කර ගැනීමට අවස්ථාව සලසා දෙන ලදී. එමඟින් එය රටේ ආර්ථික සංවර්ධනයට උපකාරී වේ. ශිල්පසේනා ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගතියට දායක වී ඇති බව සටහන් කළ හැකි අතර 2019 වසරේ 89 වැනි ස්ථානයේ සිට 2022 දී 85 වැනි ස්ථානය දක්වා මෙරට නවෝත්පාදන දර්ශකය ඉහළ යාම මෙයට සාක්ෂියක් විය හැකිය.

ශ්‍රී ලංකාව වේගයෙන් වෙනස් වන ගෝලීය භූ දර්ශනයට අනුගත විය යුතුය. ලාභ ශ්‍රමය මත පමණක් යැපීමට නොහැකි බැවින් ලෝක මට්ටමේ තාක්ෂණික කර්මාන්තයක් ගොඩනඟන අතරම ගුණාත්මක නිෂ්පාදන සැපයීමට රට යොමු විය යුතුය. නව්‍යකරණයන් දිරිගන්වන ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සහ රට තුළ දක්ෂතා රඳවා තබා ගැනීම සඳහා ඒවා වැදගත් වේ.

කෙසේ වෙතත්, රටක නවෝත්පාදනයන් සහ අධි තාක්ෂණික නිෂ්පාදන සිදුකිරීම සඳහා, මෙම පුද්ගලයින් සඳහා යම් යම් ආයතනික වැඩපිළිවෙල ද තිබිය යුතුය. ඒ සඳහා විශේෂයෙන්ම අල්ලස් සහ වෙනත් ආකාරයේ දූෂණ නොඉවසන සංස්කෘතියක් තිබිය යුතුය. මේ වන විට, නව්‍ය නිෂ්පාදන නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටින අයට ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ (WIPO) ප්‍රතිලාභ ලබා ගත හැකිය.

පේටන්ට් බලපත්‍රයේ නව නිපැයුම්කරු වැනි නිශ්චිත තොරතුරු සෙවීමට ඉඩ සලසන ප්‍රමිතිගත ආකෘති සහිත, නොමිලේ ලබාදෙන බොහෝ පේටන්ට් දත්ත සමුදායන් හරහා මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වැනි රටවලට සහාය වීමට WIPOට හැකිය. දළ දේශීය නිෂ්පාදිතය සහ නවෝත්පාදනය වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික දත්ත විශ්ලේෂණය කිරීම සඳහා WIPO විසින් නොමිලේ ලබාදෙන පේටන්ට් දත්ත සමුදායන් සහ සම්පත් භාවිතා කිරීමට ශ්‍රී ලංකාව ද කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකාවේ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත 2022 මුල් භාගයේදී සංශෝධනය කරන ලද අතර එමගින් රටට නිශ්චිත භූගෝලීය සම්භවයක් ඇති නිෂ්පාදන පිළිබඳ භූගෝලීය දර්ශක (GI) ලියාපදිංචි කිරීමට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට (NIPO) අවසර ලැබුණි. ඒ අනුව, ශ්‍රී ලංකාව සිලෝන් සිනමන්, සිලෝන් පෙපර් සහ සිලෝන් පොල් සහ ඒ හා සමාන වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ඨෂ සහතිකය ලබා ගත්තේය.

මෙම ක්‍රියාමාර්ගවලට අමතරව දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් බුද්ධිමය දේපළ පිළිබඳ දැනුවත් කිරීම, තරුණ තරුණියන් සවිබල ගැන්වීම සඳහා පාසල් පද්ධතියට තාක්ෂණික පුහුණුව ගෙන ඒම සහ තරඟකාරීත්වය ඇති කිරීම වැනි වෙනත් උපාය මාර්ග ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අංශයේ වර්ධනයට විශාල වශයෙන් දායක විය හැකිය.

එපමණක් නොව, ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන හා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා ඉහළ මට්ටමක පවතින බව කෙනෙකුට නිරීක්ෂණය කළ හැකිය. බොහෝ කාන්තාවන් තම නවෝත්පාදනයන් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීමට අකමැති බවත්, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ අවබෝධය නොමැතිකම වැනි බොහෝ හේතු නිසා එසේ සිදුවන බවත් වාර්තා වේ. මෙම සංඛ්‍යා දත්තය නවෝත්පාදන සහ නිර්මාණශීලීත්වය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය තීරණය කිරීමේ තීරණාත්මක සාධකයකි. කාන්තාවන් සතු පේටන්ට් හිමිකම් අඩුකම නවෝත්පාදනය පිළිබඳ රටේ සංඛ්‍යාලේඛනවලට බලපායි.

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) විසින් 2010 සහ 2022 වසර අතර සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව, පසුගිය වසර පහ තුළ දළ වශයෙන් කාන්තා පේටන්ට් අයදුම්පත් 25ක් ලැබී ඇති බව දැක ගත හැකිය. මේ කාලය තුළ සමස්ත පේටන්ට් බලපත්‍ර අයදුම්පත් වලින් 8%ක් පමණ කාන්තා පේටන්ට් අයදුම්පත් වේ.

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ කාන්තාවන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ඉහළ දායකත්වයක් දක්වන බව සඳහන් කිරීම සිත්ගන්නා කරුණකි. එහෙත්, විශේෂයෙන් පේටන්ට් බලපත්‍ර, අධ්‍යයන ප්‍රකාශන සහ වෙනත් ආකාරයේ වාණිජකරණයන් සම්බන්ධයෙන් ඵලදායීතාව පවතින්නේ ඉතා අඩු මට්ටමකය.

නවෝත්පාදන සහ නිර්මාණ ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය අඩුවීමට හේතු විය හැකි බොහෝ හේතු තිබේ. ඒ අතරින් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය නොමැතිකමට අමතරව දිරිගැන්වීම් නොමැතිකම සහ ආයතනික සහයෝගය ද එයට බලපාන සාධක බව දැකිය හැකිය.

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතාවයෙන් මිදීම සඳහා ශ්‍රී ලංකාවට අනුගමනය කළ හැකි බොහෝ උපාය මාර්ග තිබේ. පේටන්ට් බලපත්‍ර සමග සම්බන්ධ පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රවලට සහභාගී වීමට කාන්තාවන් වැඩි වැඩියෙන් දිරිමත් කළ යුතු අතර බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වල වැදගත්කම පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි වැඩියෙන් ස්ථාපිත කළ යුතුය. NIPO, WIPO සහ ජාතික නවෝත්පාදන ඒජන්සිය වැනි රටේ සමහර ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සංවිධාන සමග සහයෝගයෙන් පර්යේෂණ විශ්ව විද්‍යාල මගින් මෙය කළ හැකිය.

ශ්‍රී ලංකාව ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් නවෝත්පාදන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ද සොයා බැලිය යුතු අතර, නව්‍යකරණයන්හි කාන්තා සහභාගිත්වය ග්‍රහණය කර ගන්නා නිවැරදි සහ යාවත්කාලීන කරන ලද දත්ත ගබඩාවක් රට විසින් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. (*Mirror Business*, 27/04/2023)

ශ්‍රී ලංකාව සිය විද්‍යා හා තාක්ෂණ අංශය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා කලාපයේ අනෙකුත් රටවල් සමඟ කරන අන්තර්ක්‍රියා දෙස බලන විට, අපජල තාක්ෂණය, තිරසාර කෘෂිකර්මාන්තය,

අභ්‍යවකාශ ඉංජිනේරු විද්‍යාව වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව ඇති කිරීම රට සහ කලාපය තුළ නවෝත්පාදන මට්ටම ඉහළ නැංවීම සඳහා සාර්ථක පියවරක් බව පෙනේ.

ජෛව තාක්ෂණය, පුනර්ජනනීය බලශක්තිය සහ වෛද්‍ය පර්යේෂණ වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ඉන්දියානු ආයතන කිහිපයක පුහුණුව ලබා ගැනීමට ශ්‍රී ලාංකිකයන් 550 දෙනෙකුට පමණ e-ITEC වැඩසටහන යටතේ හැකි වී ඇති බව සඳහන් වේ. අසල්වැසියන්ට පළමු තැන දෙන ඉන්දීය ප්‍රතිපත්තිය හේතුවෙන්, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සහයෝගීතා ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාව සමඟ ඇති සහයෝගීතාවයෙහි යම් දියුණුවක් අපේක්ෂා කළ හැකිය. විද්‍යාව සහ තාක්ෂණය තිරසාර සංවර්ධනයේ ප්‍රධාන සක්‍රියකාරකයක් වන බැවින්, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති කිරීමට පියවර ගැනීම, 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ සඳහා ශ්‍රී ලාංකීය ජනගහනයේ සහභාගීත්වය උපරිම කර ගැනීමට නම් රටේ නව්‍ය සංස්කෘතියට සම්බන්ධ වීමට ප්‍රජාව දිරිමත් කරන ක්‍රමානුකූල යාන්ත්‍රණයක් තිබීම අත්‍යවශ්‍ය වේ. විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන්ද විශ්වාසදායක ප්‍රතිපත්ති රටට තිබිය යුතුය.

1990 දශකයේ මුල් භාගයේ සිට අනුප්‍රාප්තික රජයන් විසින් ඉදිරිපත් කරන ලද ස්ථාවර විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ගණනාවක් තිබේ. 1990 දශකයේ මුල් භාගයේ ජනාධිපති කාර්ය සාධක බලකායක් විසින්, 1995දී ස්වභාවික සම්පත් බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA) විසින් සහ 2002 සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) විසින් සකස් කරන ලද පරිපූර්ණ ප්‍රකාශයන් ඒ සඳහා උදාහරණ වේ.

අද වන විට භාවිතයේ පවතින ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියෙහි අරමුණ වන්නේ දැනුම හා තාක්ෂණ භාවිතය තුළින් සහ ධාරිතා වර්ධනය තුළින් විද්‍යාව හා තාක්ෂණය ශක්තිමත් කිරීමයි. රටේ ජනතාවගේ ද්‍රව්‍යමය හා සමාජීය යහපැවැත්ම පවත්වාගෙන යාම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, පරිසරය ආරක්ෂා කරමින් හා තිරසාර සංවර්ධන අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කරමින් මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇත.

ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියේ ප්‍රතිපත්තිමය අංග සමහරක් මෙසේ විය හැකිය: "රටේ සෑම පුරවැසියෙකුටම ඵලදායී ලෙස ළඟා වන ජාතික විද්‍යා හා නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම", රටේ සංවර්ධන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වන විද්‍යාඥයින්ගේ සහ තාක්ෂණවේදීන්ගේ සම්පත් පදනම ගොඩනැගීම, තිරසාර කිරීම සහ ක්‍රමානුකූලව වැඩි කිරීම සහ ජාතික සංවර්ධනයේ වැදගත් සහ අත්‍යවශ්‍ය කොටසක් ලෙස විද්‍යාවේ සහ තාක්ෂණයේ ප්‍රධාන භූමිකාව හඳුනා ගැනීම.

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන අතින් ශ්‍රී ලංකාව පසුගාමී වීමට හේතු රැසක් තිබිය හැකිය. මේ සඳහා අඛණ්ඩව දායක වන බාධක ගණනාවක් පවතින අතර මෑත වසරවලදී මෙම බාධක අඩුවෙමින් පවතින බව පෙනෙන්නට තිබුණද, ඒවා තවමත් රටේ නිර්මාණශීලී නවෝත්පාදකයින් සහ නව නිපැයුම්කරුවන් සීමා කිරීමට හේතු වේ. නීත්‍යානුකූල පිළිගැනීමක් නොමැතිකම, විවිධ අවස්ථාවලදී අරමුදල් සැපයීමේ ගැටලු, මෙම නවෝත්පාදකයින් සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික සමාජයෙන් සහාය නොමැතිකම සහ මූලික පදනම නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය අධ්‍යාපන ක්‍රමයක් නොමැතිකම විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වූ ශක්තිමත් ප්‍රජාවක් ගොඩනැගීම සඳහා පවතින බාධකවලින් සමහරකි.

විද්‍යාව හා තාක්ෂණය යනු ශ්‍රී ලංකාව වැනි රටවල් විශේෂයෙන් එහි එකතැන පල්වෙන ආර්ථික වර්ධනයත් සමඟ වැඩිදියුණු කිරීම සඳහා සොයා බැලිය යුතු ප්‍රධාන ක්ෂේත්‍රවලින් එකක් විය හැකිය. අධි තාක්ෂණික අපනයන නිෂ්පාදනයෙන් ඉදිරියට යාමට විශාල විභවයක් ඇති රටක් ලෙස මෙම අපනයන ඉලක්ක කරා රට ගෙන යන, ක්‍රියාත්මක කළ හැකි සැලසුම් තිබිය යුතුය.




# ඩිජිටල් සහයෝගීතාව

ඩිජිටල් සහයෝගීතාව සහ ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකත්වය යනු අලුත් සංකල්ප දෙකකි. එයට පසුබිම් වන්නේ, ලොව පුරා රජයන් සන්නිවේදනය සඳහා ඩිජිටල් වේදිකාවන්ට අනුගත වීම වැඩි වීමයි. 2020 මුල් භාගයේදී කෝවිඩ්-19 වසංගතය මතුවීමත් සමඟ ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකභාවයේ වර්ධනය ක්ෂණිකව ඉහළ ගියේය. සංචාර සහ සංචලනය සීමා කිරීම එයට හේතුවයි.

නිරෝධායනයට ලක්ව සිටින තම පුරවැසියන් සමඟ සන්නිවේදනය කිරීමේ ඵලදායී මාධ්‍යයක් ලෙස රටවල් සමාජ මාධ්‍ය සහ අනෙකුත් ඩිජිටල් වේදිකා භාවිතා කරන ආකාරය වසංගතය අතරතුර දක්නට ලැබුණි. ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකත්වය මගින් රාජ්‍ය තාන්ත්‍රික සේවා වේගවත් හා ලාභදායී ලෙස බෙදා හැරීමේ හැකියාව තිබෙන නිසා මෙය වසංගතයෙන් පසුව ද අඛණ්ඩව ක්‍රියාත්මකව පවතී.

බොහෝ රටවල් වසංගතය පැතිරීමත් සමඟ ඩිජිටල් වේදිකා හරහා රාජ්‍යතාන්ත්‍රික සේවා සිදු කිරීමට අනුගත වූයේ වෙනත් විකල්පයක් නොමැති බැවිනි. එහෙත්, ජර්මනිය, රුසියාව සහ ඉන්දියාව වැනි තවත් රටවල් කිහිපයක් වසර 2020 ට පෙර සිටම ඔවුන්ගේ විදේශ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල් වේදිකා භාවිතා කළහ. මේ සඳහා මුල්ම උදාහරණයක් ලෙස 1992 රියෝ ද ජැනයිරෝ හි පැවති පෘථිවි සමුළුව සැලකිය හැකි අතර එහිදී ප්‍රථම වරට ඊමේල් හරහා සාකච්ඡා පවත්වන ලදී. එපමණක් නොව, ඩිජිටල් ආයුධකරණයේ මූලාරම්භය ලෙස අරාබි වසන්තය ද හඳුනාගත හැකිය. 2008 දී ජිහාඩ් ව්‍යාපාරය සඳහා තරුණ බඳවා ගැනීම් බහුතරයක් සිදුකරනු ලැබුවේ ඩිජිටල් වේදිකා හරහාය.

ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකත්වය සහ සමස්තයක් ලෙස ෂඩ්ඛ ක්ෂේත්‍රය විසින් ඉහළ වටිනාකමක් ඇති ආර්ථිකයන් සමඟ තරඟ කරමින් ගෝලීය වෙළඳපොළට ඒකාබද්ධ වීමට බොහෝ ඌන සංවර්ධිත රටවල් සඳහා අවස්ථා නිර්මාණය කරයි. ඩිජිටල් ලෝකයේ අතිශය වේගවත් පරිවර්තනය සමඟ ලෝකය දැන් වේගයෙන් පරිවර්තනය වෙමින් පවතී. සාම්ප්‍රදායික වෙළඳාම දේශීය මෙන්ම ජාත්‍යන්තර තලයේදී ද යල් පැන ගොස් අඩු තරඟකාරී තත්වයට පත් වී තිබේ. එම නිසා වෙළඳාම ක්‍රමයෙන් ඩිජිටල් වේදිකා මත රඳා පැවතීම වැඩි වේ.

සංවර්ධිත රටවල් ශීඝ්‍ර ඩිජිටල් පරිවර්තනයකට ලක්වෙද්දී, ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙම තරඟකාරීත්වය සමඟ ඉදිරියට යාමට ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැලසුම් කළ යුතුය.

ලෝක වෙළඳ සංවිධානය (WTO) විසින් ප්‍රකාශ කරන ලද පරිදි, නව තාක්ෂණයේ වර්ධනයත් සමඟ භාණ්ඩ ප්‍රවාහනය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් පිරිවැයට සාපේක්ෂව වෙළඳාම වඩාත් ලාභදායී කළ හැකිය. නිදසුනක් වශයෙන්, GPS භාවිතයෙන් ඵලදායී ලෙස මාර්ග සැලසුම් කිරීම මගින් වෙළඳාමේ ප්‍රවාහන පිරිවැය විශාල වශයෙන් අඩු කළ හැකිය. අවසාන නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය බෙදා හැරීම සහ ලබාදීම මේ අනුව ඉතා ලාභදායී හා කාර්යක්ෂම ආකාරයකින් සිදු කළ හැකිය.

දේශසීමා හරහා නිෂ්පාදන සුමටව ගලා යාමට බාධා කරන වෙළඳ රෙගුලාසි සහ වෙනත් සම්බාධක ද ඩිජිටල්කරණය හරහා මගහරවා ගත හැකිය. විශේෂයෙන්ම වසරකට වැඩි කාලයක් අත්විඳිමින් සිටි දැවැන්ත ආර්ථික පසුබෑමෙන් පසු ආනයනය සම්බන්ධ ගැටලු රැසකට මුහුණ දී සිටින ශ්‍රී ලංකාවට, අනෙකුත් රටවල් බහුතරයක් විසින් අනුගමනය කරනු ලබන ඩිජිටල් පියවර කිහිපයක් වෙත යොමුවීම වැදගත් වේ. ඇතැම් තාක්ෂණික සහ නියාමන ගැටලු විසඳාගැනීම මගින් කෘත්‍රිම බුද්ධියට දේශසීමා තරණය කිරීම සම්බන්ධ වියදම් විශාල වශයෙන් අඩු කර ගත හැක.

කෙසේ වෙතත්, සංවර්ධිත හෝ සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් ඩිජිටල් සම්බන්ධතාව සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් ලබා තිබේ. එහෙත්, මෙම වර්ධනය රටවල් පුරා ඒකාකාරව පවතින බවක් නොපෙනේ. මෙම තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් බහුතරයකට වර්ධනය වන ගෝලීය ඩිජිටල් ආර්ථිකය සමඟ තරග කිරීම අභියෝගයක් වනු ඇත.

ශ්‍රී ලංකාව සිටින්නේ ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකත්වයට හෝ ඩිජිටල් සහයෝගීතාවයට අනුගත වීමේ මුල් අවධියේය. එසේ වුවද වඩාත් ඩිජිටල්කරණය වූ රටක් ඇති කර ගැනීමේ මෙම උත්සාහයන් සාර්ථක කර ගැනීමේ හැකියාව ශ්‍රී ලංකාවට ඇති බව හඳුනාගත හැකිය. ශ්‍රී ලංකා රජයේ ඩිජිටල් වේදිකාවල ක්‍රියාකාරීත්වයේ මට්ටම දැනට බෙහෙවින් සීමා වී ඇත. රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාකාරකම් සිදු කිරීමට සහ බලවත් මෘදු බල මෙවලමක් ලෙස ක්‍රියා කිරීම සඳහා තම සමාජ මාධ්‍ය වේදිකා සහ අනෙකුත් ඩිජිටල් වේදිකා භාවිතා කරන්නේ රාජ්‍ය ආයතන සහ පුද්ගලයන් අතළොස්සක් විසින් පමණි.

තම ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකභාවයේ ඉලක්ක සාක්ෂාත් කරගැනීමේදී ශ්‍රී ලංකාව බොහෝ බාධකවලට මුහුණ දෙන බව පෙනේ. පුරවැසියන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව නොමැතිකම සහ රට තුළ විධිමත් අන්දමින් ප්‍රවේශ විය හැකි ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියා පටිපාටි නොමැතිකම එවැනි ගැටලු වේ. කෙසේ වෙතත්, මෙම අභියෝග තිබියදීත්, ශ්‍රී ලංකාව සිය විදේශ ප්‍රතිපත්ති ඉලක්ක සාර්ථකව සාක්ෂාත් කර ගැනීම සඳහා ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකභාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍යය.

2023 වන විට ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිතා කරන්නන් මිලියන 14.58 ක් වූ අතර අන්තර්ජාලය පැතිරීම සියයට 66.7 ක් වූ බව වාර්තා වේ. 2023 ජනවාරි මාසයේදී ශ්‍රී ලාංකිකයින් මිලියන 7.20 ක් හෙවත් රටේ මුළු ජනගහනයෙන් සියයට 32.9 ක් සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් විය. 2023 මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන සම්බන්ධතා ප්‍රමාණය ජනගහනයෙන් සියයට 165.5 ක් දක්වා විය. 2022 සහ 2023 මුල් භාගය අතර කාලය තුළ රටේ අන්තර්ජාල භාවිතා කරන්නන් සංඛ්‍යාව 43,000 කින් වැඩි වී ඇත. කෙසේ වෙතත්, මෙම සංඛ්‍යා මගින් යථාර්ථය නිවැරදිව නියෝජනය නොවිය හැකි අතර ශ්‍රී ලංකාවේ ඩිජිටල් වර්ධනය සමග සම්බන්ධ සත්‍ය දත්ත මෙම සංඛ්‍යාවලට වඩා බෙහෙවින් වැඩි විය හැකිය. මෙම සියලු සංඛ්‍යාලේඛන රටේ සාර්ථක ඩිජිටල් වර්ධනයකට සාක්ෂි වේ.

2022 දී ශ්‍රී ලංකාව ආරම්භ කළ ජාතික ඉන්ධන අවසරපත්‍ර QR කේත පද්ධතිය මෙම බාධක සහ අභියෝග බොහොමයක් ජය ගනිමින් රට ඉදිරියට තැබූ සාර්ථක ඩිජිටල්කරණ පියවරක් ලෙස සැලකිය හැකිය. 2022 වසරේ ශ්‍රී ලංකාව තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන අර්බුදයක් ඇති වූ අතර එය රටේ තාක්ෂණයේ වර්ධනය සඳහා අවස්ථාවක් ලෙස ද උපයෝගී කරගන්නා ලදි. මෙම QR පද්ධතිය රට සතු ගැටලු විසඳීමේ හැකියාව සහ ඩිජිටල් වේදිකාවල කාර්යක්ෂමතාව සහ පහසුව පිළිබඳ විදහා දැක්වීමක් විය.

මෙම පද්ධතියේ සාර්ථකත්වය රට පුරා ඉන්ධන පෝලිම් අඩු කිරීම හරහා ප්‍රකාශමාන වූ අතර එය ශ්‍රී ලංකාවේ ජාතික තාක්ෂණික සාක්ෂරතාවයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස ද හඳුනාගත හැකිය. විශේෂයෙන්ම කොවිඩ් 19 වසංගතය උග්‍ර වූ අවධියේදී විවිධ අරමුණු සඳහා QR කේත භාවිතය දිරිගැන්වීමට බොහෝ උත්සාහයන් ගෙන තිබුණද, මෙම උත්සාහයන් අතරින් වඩාත්ම සාර්ථක ප්‍රයත්නය ලෙස ජාතික ඉන්ධන අවසර පත්‍රය හඳුනාගත හැකිය.

ඉන්ධන QR කේත පද්ධතියේ සාර්ථකත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව කෙරෙහි විදේශීය අවධානය යොමු විය. මුදල් රහිත ගෙවීම් ක්‍රමවලට ඉක්මන් අනුගතවීම වැනි ඩිජිටල්කරණය සම්බන්ධයෙන් රට ශක්තිමත් කිරීමට ඉවහල් වන තවත් එවැනි බොහෝ මුලපිරීම් රට තුළ වර්ධනය වීමට ඇති දැවැන්ත විභවය පිළිබඳ මෙය සහතිකයකි. මේවාට අමතරව, WEBXPAY, PayHere, HelaPay, FriMi වැනි දේශීය ඩිජිටල් ගෙවීම් වේදිකා ගණනාවක් ඇති අතර ඒවා සියල්ලම Pickme වැනි ජංගම යෙදුම් හරහා විවිධ ප්‍රවාහන, ආහාර බෙදා හැරීම් සහ සිල්ලර අලෙවි ජාල සමඟ කෙටි කාලයක් තුළ මිලියන ගණනක් ගනුදෙනු සිදු කර ඇත. ඩිජිටල් ආකාරයෙන් සංවර්ධනය වීම සඳහා ශ්‍රී ලංකාවට ඇති හැකියාව මෙමගින් ප්‍රකාශ වේ. ශ්‍රී ලංකාව දැනටමත් පිවිසී ඇති අනෙකුත් ප්‍රධාන මූලාරම්භයන් අතර කප්රුක වැනි ඊ-වාණිජ්‍ය වේදිකාවන් ද තිබේ.

Kapruka.lk, දුලිත් හේරත් විසින් ආරම්භ කරන ලද ඊ-වාණිජ්‍ය වේදිකාවකි. එය ශ්‍රී ලංකාවේ විද්‍යුත් ව්‍යාපාර ක්ෂේත්‍රය මුළුමනින්ම පරිවර්තනය කළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ඊ-වාණිජ්‍ය වේදිකාවකි. Kapruka Cross Border යනු Amazon, eBay වැනි ගෝලීය ඊ-වාණිජ්‍ය වේදිකා වෙත ශ්‍රී ලාංකික සන්නාමයන් රැගෙන යාමේ සාර්ථක උපාය මාර්ගයක් වන අතර, ශ්‍රී ලංකාවට දැඩිවම අවශ්‍ය කාල වකවානුවකදී ඩොලර් ගලා ඒම ශක්තිමත් කිරීම සඳහා එය සුවිසල් දායකත්වයක් ලබා දී ඇත.

කප්රුකට අමතරව, දකුණු ආසියානු කලාපයේ තවත් ඊ-වාණිජ්‍ය දැවැන්තයින් විසින් ශ්‍රී ලංකාවේ ඊ-වාණිජ්‍ය අංශය ගෝලීය පිළිගැනීමක් කරා ගෙන යන බව අපට දැකගත හැකි විය. Daraz යනු එවැනි එක් වේදිකාවකි. පාකිස්ථානය මූලස්ථානය කරගත් Daraz යනු පාකිස්ථානය, බංග්ලාදේශය සහ නේපාලය වැනි දකුණු ආසියා කලාපයේ බොහෝ රටවල් තුළ ඊ-වාණිජ්‍යයේ දැවැන්තයෙකි. ශ්‍රී ලංකාවේ අර්බුදකාරී කාල පරිච්ඡේදය පුරාවටම මෙම අන්තර්ජාල වේදිකාව ප්‍රධාන ආර්ථික අභියෝග කිහිපයක් ජයගැනීම සඳහා රටට සහාය වූයේය. Darazහි ක්‍රියාත්මක වන විකුණුම්කරුවන්ගෙන් බහුතරයක් දේශීය විකුණුම්කරුවන් වුවද (97-99% දක්වා), ශ්‍රී ලංකාවේ අර්බුදය සහ ආනයන තහනම හේතුවෙන් සමානව බලපෑමට ලක් වූ විදේශීය විකුණුම්කරුවන් ගණනාවක් ද එහි සිටින බව සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඩිජිටල්කරණය වූ වෙළඳපොළවල් වන වේදිකාවන් විසින් රට තුළ ඊ-වාණිජ්‍ය අංශය තවදුරටත් පුළුල් කිරීමට පියවර කිහිපයක් ගෙන තිබුණි. “Daraz Connect” වැඩසටහන එවැනි එක් මුලපිරීමකි. ග්‍රාමීය වෙළෙන්දන්ට තම නිෂ්පාදන අන්තර්ජාලය හරහා අලෙවි කිරීම පිළිබඳව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ නිෂ්පාදන තවදුරටත් වැඩිදියුණු කර ගැනීමට උපකාර කිරීම සඳහා මෙම වැඩසටහන හඳුන්වා දී තිබුණි.

නිෂ්පාදන විකිණීම සඳහා පමණක් නොවන මෙම ඊ-වාණිජ්‍යය වේදිකාවේ වඩාත්ම සිත්ගන්නා කරුණ වන්නේ රටේ පුරවැසියන් සවිබල ගැන්වීම සඳහා ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති අනෙකුත් වැදගත් ක්‍රියාමාර්ග යි. Daraz Future Leaders වැඩසටහන ද Daraz කණ්ඩායමට සම්බන්ධ වීමට තරුණ තරුණියන් දිරිමත් කිරීම සහ වෘත්තීය වර්ධනය වේගවත් කිරීම සඳහා සමාගම විසින් කරන ලද මුලපිරීමකි. තරුණයින් වෙත ප්‍රධාන අවධානය යොමු කිරීමට හේතු වන්නේ අනෙකුත් වයස් කාණ්ඩ හා සසඳන විට ඊ-වාණිජ්‍ය ක්ෂේත්‍රයේ ඔවුන්ගේ නියෝජනය විශාල වීමයි.

Daraz හි නිර්මාතෘ Bjarke Mikkelsen පසුගිය වසරේ මුල් භාගයේදී ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔහුගේ මෙම සංචාරයේදී ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය වර්ධනයට සහය දැක්වීම සඳහා සමාගමේ කැපවීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. විකුණුම්කරුවන්ට, කාන්තා ව්‍යවසායකයින්ට සහ පාරිභෝගිකයින්ට සහය දැක්වීම සහ සවිබල ගැන්වීම සඳහා සමාගම විසින් ගෙන යන බොහෝ ව්‍යාපෘති සහ වැඩසටහන් පිළිබඳව ද ඔහු අවධාරණය කළේය. මෙම සංචාරයේදී සියලුම ශ්‍රී ලාංකිකයින්ට ප්‍රවේශ විය හැකි වැඩි අවස්ථා ඇති පරිසර පද්ධතියක් ඊ-වාණිජ්‍ය අංශයේ ගොඩනැගීම පිළිබඳව ද සාකච්ඡා විය.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොලේ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීමට ගෙන ඇති මුලපිරීම් රටේ ඩිජිටල් විප්ලවයේ දැවැන්ත පියවරක් බවට පත් විය හැකිය. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC), කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ඩිජිටල්කරණය කිරීමට සහ පුරවැසියන්ට කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ප්‍රවේශය ලබා දීම සඳහා මුලපිරීමක් සිදුකර ඇත.

ප්‍රාග්ධන වෙළඳපොළ ඩිජිටල්කරණය කිරීම මගින් ප්‍රාග්ධනය රැස්කිරීමේ සෑම අංශයක්ම ග්‍රහණය කර ගන්නා නව්‍ය තාක්ෂණික යටිතල පහසුකම් ගෙන ඒමට එම දෙපාර්ශවය කටයුතු කර තිබේ. එමඟින් බොහෝ නව චින්තකයින්ට සහ නවෝත්පාදකයින්ට රට තුළ ව්‍යවසායකත්වය උදෙසා විශාල සහයෝගයක් ලැබෙනු ඇත.

ලොව පුරා තාක්ෂණික ක්ෂේත්‍රයේ නවතම සහ වඩාත්ම පරිවර්තනීය සංවර්ධනය මේ වන විට කතාබහට ලක්ව ඇති ChatGPT ය. එය San Francisco පදනම් කරගත් ආරම්භක ව්‍යවසායක් වන OpenAI විසින් වැඩි දියුණු කරන ලද AI චැට්බොට් එකකි. චැට්බොට් දැන් ව්‍යාපාරික ලෝකයේ කතාබහට ලක්ව ඇති අතර තවත් බොහෝ තාක්ෂණික සමාගම් මෙම වේදිකාවේ තරගකරුවන් ලෙස පැමිණෙන බව දැකගත හැකිය. කෙසේ වෙතත්, මෙම තාක්ෂණය විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තරමක් විවාදාත්මක මාතෘකාවක් බවට පත්ව ඇත. ඇතැම් සිසුන් සම්පූර්ණ රචනා ජනනය කිරීමට මෙම වේදිකාව භාවිතා කර ඇති අතර අනිෂ්ට කේත ජනනය කිරීමට හැකර්වරුන් ද මෙම චැට්බොට් භාවිතා කර ඇත.

ශ්‍රී ලංකාවට තරමක් නව සංකල්පයක් වූ අතථ්‍ය (virtual) අධ්‍යාපනය වසංගත කාලපරිච්ඡේදය තුළ දියුණු වීමට පටන් ගත්තේය. කෙසේ වෙතත්, සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවලට මෙම ඩිජිටල් වේදිකා වෙත ප්‍රවේශ වීම සම්බන්ධ බාධා ඇති අතර එම නිසා එවැනි ප්‍රදේශවල සිසුන්ගෙන් බහුතරයක් අභියෝග රාශියකට මුහුණ දුන්හ. අතථ්‍ය ඉගැන්වීම සඳහා ද බොහෝ කුසලතා අවශ්‍ය වන අතර එම කුසලතා සඳහා අවශ්‍ය පුහුණුව ශ්‍රී ලංකාව තුළ නොමැති බව මෙම කාලය තුළ දක්නට ලැබුණි.

බොහෝ අභියෝග සහ බාධක තිබියදීත්, අද පවා, රජයේ පාසල් සියල්ලම පාහේ සිසුන් සඳහා විවෘතව තිබියදීත්, අන්තර්ජාලය හරහා අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යනු දැකිය හැකිය. විශේෂයෙන් තරුණයින්ට එමගින් බොහෝ වෘත්තීය අවස්ථා සඳහා දොරටු විවර කරන බව ද පෙනේ. බොහෝ සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ගුරුවරු ද ලොව පුරා සිටින සිසුන් දැනුවත් කිරීම සඳහා මෙම අන්තර්ජාල වේදිකා භාවිතා කරති. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, තරුණයින් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා පිළිබඳ පුහුණුව වැඩිදියුණු කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ නවෝත්පාදනයන් උත්තේජනය කිරීම සඳහා ශ්‍රී ලංකාව කටයුතු කිරීම අතිශයින් වැදගත් වේ.

ඩිජිටල්කරණය කරා යොමු වී සිටිනරටක් වන ශ්‍රී ලංකාව ChatGPT වැනි විශේෂාංග වෙත වඩාත් නිරාවරණය විය යුතුය. එහි වාසි සහ අවාසි කිරා මැන බලා එය ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීමට හැකිය. නිදසුනක් වශයෙන්, පාසල් පද්ධතිය තුළ සිසුන්ගේ නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීමට මෙම වේදිකාව භාවිතා කළ හැකි අතර සංචාරක කේන්ද්‍රස්ථානයක් වන ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සහ රට ප්‍රවර්ධනය කිරීම සඳහා ද මෙම විශේෂාංගය භාවිතා කළ හැකිය. බහුතර ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන සිංහල ChatGPT ආකෘතියක් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවේ මෘදුකාංග විශේෂඥයින්ට ද AI චැට්බොට්වල සැලකිය යුතු දියුණුවක් ඇති කිරීමට දායක විය හැක.

කෘත්‍රිම බුද්ධිය වර්ධනය කිරීම සම්බන්ධයෙන් ලොව පුරා බොහෝ වාද විවාද පැවතුනද, ලෝකය තාක්ෂණය මත යැපීම වැඩිවීමත් සමඟ AI ක්ලවුඩ් වැනි දියුණු තාක්ෂණික මෙවලම්වලට බොහෝ අංශවල කාර්යක්ෂමතාව වැඩි කළ හැකි බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. AI මගින් සංකීර්ණ කාර්යයන් බොහොමයක් කිරීමට හැකි වන ක්ෂේත්‍රයක් ලෙස වෛද්‍ය අංශය හඳුනාගත හැකිය. රෝග විනිශ්චය සහ ප්‍රතිකාරවල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම, බොහෝ ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම මගින් සෞඛ්‍ය සේවා පද්ධතිය වඩාත් කාර්යක්ෂම කිරීම සහ ඵලදායී රෝගී අධීක්ෂණ මෙවලමක් ලෙස කටයුතු කිරීම ඒ අතර වේ. AI මගින් රෝගීන්ගේ තථ්‍ය කාලීන දත්ත වෛද්‍ය සංවේදක මගින් නිරීක්ෂණය කළ හැකිය. එමඟින් වෛද්‍ය වෘත්තිකයන්ට අසාමාන්‍යතා පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වේ. එය ඔවුන්ගේ ප්‍රතිකාර වඩා ඵලදායී වීමට උපකාරී වේ.

එසේ වුවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ රටට ලබා ගැනීමට නම් ඩිජිටල්කරණය දිරිගැන්වීම සඳහා පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයටම දිරිගැන්වීම් ලබා දිය යුතුය. විවිධ ක්‍රමෝපායන් ගවේෂණය කිරීමටත්, ගෝලීය වශයෙන් තරඟකාරී ලෙස ICT භාවිතයේදී නව්‍යකරණය වීමටත් වැඩි අවස්ථාවක් ලැබෙන්නේ එවිටය. රජයේ දෙපාර්තමේන්තු සහ නිලධාරීන්ගේ ඔන්ලයින් ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රමිතිගත සැලසුම් තිබිය යුතුය. මෙම රජයේ දෙපාර්තමේන්තු සඳහා විශේෂ විද්‍යුත් සාක්ෂරතා පුහුණු වැඩසටහන් තිබීම අතිශයින් වැදගත් වේ.

ලොව පුරා අනෙකුත් බොහෝ රටවල් උදාහරණයට ගනිමින් ශ්‍රී ලංකාවට ද තම තානාපති කාර්යාල සහ මහ කොමසාරිස් කාර්යාල ට්විටර් සහ ෆේස්බුක් වැනි වේදිකා ඇතුළු සමාජ මාධ්‍ය වැඩියෙන් භාවිතා කිරීම සඳහා යොමු කළ හැකිය.

මීට අමතරව, ඉන්දියාව 2022 ඔක්තෝම්බර් මාසයේදී සිය වාණිජ 5G සේවාවන් දියත් කිරීමත් සමඟ, ශ්‍රී ලංකාව ද අසල්වැසියාගේ අඩිපාරේ යා යුතු බවට සාකච්ඡා එම කාලය තුළ ප්‍රමුඛ විය. කෙසේ වෙතත්, 2022 වසරේ රටේ ආර්ථික අර්බුදය උත්සන්න වීමත් සමඟ පවතින තත්ත්වය අනුව පාරිභෝගිකයින්ට දැරීමට සිදුවන අධික මූල්‍ය බර හේතුවෙන් 5G සේවා දියත් කිරීමට ඇති හැකියාව පිළිබඳව පාර්ශ්වකරුවෝ ප්‍රශ්න කළහ. කෙසේ වෙතත්, ලොව පුරා 5G තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනයත් සමඟම, ශ්‍රී ලංකාවටද මෙම වර්ධනය වන වෙනස්කම්වලට අනුකූලව කටයුතු කිරීමට සිදුවනු ඇත.

ආර්ථික අර්බුදය යනු ඩිජිටල්කරණයේදී ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වන විවිධ අභියෝග සහ බාධක අතරින් එකක් පමණි. පසුගිය වසර කිහිපය තුළ, රටේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ වර්ධනයට බාධා කරන ළද අන්තර්ජාල කුමන්ත්‍රණ සහ ක්‍රියාමාලා ගණනාවක් තිබේ. එපමණක් නොව, සයිබර් අපරාධ ශ්‍රී ලංකාවට විශාල තර්ජනයක් වේ. ශ්‍රී ලංකාව බොහෝ සයිබර් අපරාධකරුවන්ගේ පහසු ඉලක්කයක් වී තිබේ. සයිබර් අපරාධකරුවන්ට ඔවුන්ගේ විවිධ ක්‍රියාකාරකම් හරහා සමාජය කඩාකප්පල් කිරීමේ හැකියාව ඇති බැවින් මෙම අපරාධ කල්තියා හඳුනාගෙන ඒවා අවම කිරීම අතිශයින් වැදගත් වේ.

විද්‍යුත් සාක්ෂරතාව පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීමට සහ දත්ත නීති උල්ලංඝනය කිරීමේ ප්‍රතිවිපාක පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා සයිබර් ආරක්ෂණ අධ්‍යාපන වැඩසටහන් සහ අරමුදල් පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජය පෙරමුණ ගැනීම වැදගත් වේ.

අනෙක් අතට, සයිබර් රාජ්‍ය තාන්ත්‍රිකභාවය මෙම සයිබර් තර්ජන අවම කිරීම සඳහා අතිශයින්ම ඵලදායී පියවරකි. සයිබර් රාජ්‍ය තාන්ත්‍රිකත්වය යනු "සයිබර් අවකාශය සම්බන්ධයෙන් ජාතික අවශ්‍යතා සුරක්ෂිත කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික සම්පත් හා ක්‍රියාකාරීත්වයන් භාවිතා කිරීමයි." සයිබර් රාජ්‍ය තාන්ත්‍රිකභාවය හරහා ජාතීන්ට බහුපාර්ශ්විකව එකට එකතු වී පොදු තර්ජන සහ සයිබර් යුද්ධ අවම කිරීම සඳහා ක්‍රියා කිරීමට හැකි වේ.

ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා ශ්‍රී ලංකාව සිය පූර්ණ හැකියාවන් ප්‍රයෝජනයට නොගන්නා බව නිරීක්ෂණය කළ හැකි වුවද, රට සිය ඩිජිටල් සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා දැනට අනුගමනය කරන යම් යම් උපාය මාර්ග ඇති බව සඳහන් කළ යුතුය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඩිජිටල් පරිවර්තන ගමනක් සඳහා ශ්‍රී ලංකා රජය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාතික ප්‍රතිපත්ති අරමුණුවලින් එකක් වන්නේ රට තාක්ෂණය මත පදනම් වූ සමාජයක් බවට පරිවර්තනය කිරීමයි. පොදු ජනතාවට රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල්කරණය වූ රජයක් නිර්මාණය කිරීම මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය 2009 දෙසැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් වාර්ෂිකව සිදු කරන ලදී. ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසු මුල් වසරවලදී, විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අතිශයින් පහළ මට්ටමක පැවති බව පෙනී ගිය අතර, ඊට හේතු ලෙස සංකීර්ණ ප්‍රතිපත්ති අවශ්‍යතා, ප්‍රතිපත්තිය ඕනෑවට වඩා පුළුල් වීම සහ ප්‍රතිපත්ති අරමුණු පැහැදිලි නොවීම ද හේතු විය.

“ඩිජිටල් ආකාරයෙන් සියල්ලන් ඇතුළත් කරගන්නා ශ්‍රී ලංකාවක්” නිර්මාණය කිරීමේ අරමුණින් ICTA විසින් ඩිජිටල් ශ්‍රී ලංකා වැඩසටහන හඳුන්වා දෙන ලදී. රටේ වැදගත් සංවර්ධන අභියෝග කිහිපයකට මුහුණ දීම සඳහා එමගින් අවධානය යොමුකරන ලදි. ඩිජිටල් ලෙස ක්‍රියාත්මක වන ලෝක ආර්ථිකයෙන් ප්‍රතිලාභ නෙළා ගැනීම සඳහා ශ්‍රී ලංකාව යොමු කිරීමට ඩිජිටල් ශ්‍රී ලංකා මූලෝපාය උත්සාහ කරයි. ඩිජිටල්කරණයේ මූලික පරිවර්තනීය කුලුනු පහක් කෙරෙහි මෙම මූලෝපාය විසින් අවධානය යොමුකරනු ලැබේ. ඒවා නම්, ඩිජිටල් ආර්ථිකය, ඩිජිටල් රජය, ඩිජිටල් නීති සහ ප්‍රතිපත්ති, ඩිජිටල් සේවා සහ ඩිජිටල් තාක්ෂණයයි. ඩිජිටල් ශ්‍රී ලංකා මූලෝපාය වැඩියෙන් ඉලක්ක කරන්නේ ඒකාබද්ධව ජාතික ඩිජිටල් ඉලක්ක සපුරා ගැනීම කෙරෙහිය.

ශ්‍රී ලංකාවේ ඩිජිටල් වර්ධනයට උපකාර කිරීම සඳහා ගෙන ඇති නවතම පියවර වන, 2030 ඩිජිටල් ආර්ථික ප්‍රධාන සැලැස්ම ලෙස DIGIECON2030 වැඩසටහන 2023 අප්‍රේල් මස මුලදී දියත් කරන ලදි. මෙම වැඩසටහනේ ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාව සියල්ලන් ඇතුළත් කරගත් ඩිජිටල් දේශයක් බවට පත් කිරීමයි. මෙම මුලපිරීම හරහා, නව්‍ය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ආරම්භක ව්‍යාපාර රැසක් පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීමට ද රජය අපේක්ෂා කරයි. මෙම වැඩසටහන ද ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණය වූ රාජ්‍ය අංශයක් ඉලක්ක කරගත් මුලපිරීමක් ලෙස සැලකිය හැකිය.

විධිමත් ලෙස රාජ්‍යයන් අතර සබඳතා ශක්තිමත් කිරීමේදී සාම්ප්‍රදායික රාජ්‍ය තාන්ත්‍රිකත්වයට වඩා ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකත්වය ඵලදායී හා කාර්යක්ෂම වේ. රාජ්‍ය සහ රාජ්‍ය නොවන අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සැලසීම සහ සෘජු මහජන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය හරහා ඩිජිටල් රාජ්‍ය තාන්ත්‍රිකභාවය හෝ ඩිජිටල් සහයෝගීතාවය රාජ්‍යයන් අතර හවුල්කාරිත්වය වර්ධනය කිරීමට සහ ශක්තිමත් කිරීමට උපකාරී වේ. එබැවින් ශ්‍රී ලංකාව වැනි රටවල් වර්ධනය වන ගෝලීය තාක්ෂණික අවකාශය සමඟ ඉදිරියට යාමට පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.




# දේශගුණය හා පරිසරය

ගෝලීය උෂ්ණත්වයේ සහ කාලගුණික තත්ත්වයන්ගේ වේගවත් වෙනස්වීම "දේශගුණික විපර්යාස" ලෙස හඳුනාගෙන ඇත. ගෝලීයකරණය සමග වේගවත් කාර්මිකකරණය සහ අනෙකුත් මානව ක්‍රියාකාරකම් ඉහළ යාමත් සමඟ මෑත අතීතයේ දේශගුණික විපර්යාසවල වැඩි වීමක් දක්නට ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශක කිහිපය පුරාවට ස්වභාවික විපත් ද වැඩි වෙමින් පවතින අතර ගෝලීය දේශගුණය තුළ දැන් මුහුදු මට්ටම ඉහළ යාම, ගංවතුර සහ උෂ්ණත්වය ඉහළ යාම වැනි අනතුරු ඇඟවීම් දක්නට ලැබේ.

දකුණු ආසියානු කලාපයේ දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් ගැඹුරින් සාකච්ඡා කිරීම අවශ්‍යය. වරින් වර සිදුවන ගංවතුර, නායයෑම්, සුනාමි වැනි ස්වාභාවික විපත් විශාල සංඛ්‍යාවක් සහිත මෙම කලාපයේ බොහෝ රටවලට දේශගුණික විපර්යාසවල ප්‍රතිවිපාකවලට නිරතුරුව මුහුණ දීමට සිදුව ඇත. අනාවැකි අනුව, මෙම කලාපයේ දේශගුණික ගැටලු හේතුවෙන් 2050 වන විට මිලියන 62 ක් පමණ ජනයා අවතැන් වනු ඇතැයි සැලකේ. ලෝක බැංකු වාර්තාවලට අනුව, දකුණු ආසියාව මේ වන විට "නව දේශගුණික සාමාන්‍ය තත්වයක්" වැළඳ ගනිමින් සිටින අතර තීව්‍ර වන තාප තරංග, ගංවතුර, නියඟ යනාදියට කලාපය යටත් වේ.

මේ වන විට ලොව පුරාම සහ විශේෂයෙන් දකුණු ආසියානු කලාපයේ ප්‍රධාන සංවාද මාතෘකාවක් බවට පත්ව ඇති දේශගුණික විපර්යාස, වරින් වර විවිධ ආකාරයේ ස්වාභාවික විපත්වලට මුහුණ දෙන මෙම කලාපයේ රටවල ආර්ථිකයේ සුමට ක්‍රියාකාරිත්වයට ද තර්ජනයක් විය හැකිය.

දේශගුණික විපර්යාස සහ එහි ප්‍රතිවිපාක සියල්ල වන විනාශය, පරිසර දූෂණය, ඉඩම් හා ජල සම්පත් දූෂණය සහ වෙනත් එවැනි මානව ක්‍රියාකාරකම්වල ඍජු ප්‍රතිඵලයක් බැවින් මෙම ප්‍රශ්නය විසඳීම පහසු කාර්යයක් නොවන බව පෙනේ. මෙම හේතූන්වලට අමතරව දකුණු ආසියාවේ සාගර සම්පත් සූරාකෑම හේතුවෙන් මෙම ගැටලුව විසඳීම තවදුරටත් අපහසු වන බව අපි දකිමු. ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව, වියට්නාමය, මියන්මාරය, පිලිපීනය සහ තායිලන්තය පසුගිය වසර 20 තුළ ලෝකයේ දේශගුණික විපර්යාසවලට වැඩියෙන්ම ගොදුරු වූ රටවල් 10 අතරට පැමිණේ.

දකුණු ආසියාවේ කුඩා දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව ද පසුගිය දශක කිහිපය තුළ දේශගුණික විපර්යාසවල බලපෑමෙන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත. වසර ගණනාවක් තිස්සේ රටට බලපෑ අති විශාල සංඛ්‍යාවක් වන ස්වාභාවික විපත් ඊට සාක්ෂි වේ. මුහුදු මට්ටම ඉහළ යාම, අධික උෂ්ණත්ව මට්ටම්, වරින් වර ගංවතුර සහ නායයෑම් ඇතිවීම යන ප්‍රශ්න ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ එදිනෙදා ජීවිතයට මෙන්ම රට සතු ස්වභාවික සම්පත්වලට ද දිගින් දිගටම බලපායි.

දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ සිදුවන වඩාත්ම සුලබ ස්වාභාවික අනතුරු වන්නේ ගංවතුර, කුණාටු, නායයාම් සහ නියඟයයි.

ශ්‍රී ලංකාව බොහෝ දුරට සංචාරක කර්මාන්තය මත රඳාපවතින දේශයකි. දේශගුණික විපර්යාසවල මෙම අහිතකර බලපෑම් එහි සංචාරක කර්මාන්තයට සහ එහි සමස්ත ආර්ථිකයට මඳක් බලපාන අතර ගංවතුර, නියඟ, නායයෑම් සහ විශේෂයෙන් සංචාරක ආකර්ෂණයන් ලෙස ක්‍රියා කරන ස්වාභාවික සම්පත් ක්ෂය වීම හේතුවෙන් සංචාරක පැමිණීම අඩු වේ. විශේෂයෙන්ම මෙය රටේ වෙරළබඩ ප්‍රදේශයට බලපායි. එපමණක් නොව, රටේ ග්‍රාමීය ජනතාවගෙන් බහුතරයක් කෘෂිකර්මාන්තය මත දැඩි ලෙස රඳා පවතින බැවින් ඔවුන්ගේ ජීවනෝපායට ද මෙම ආපදා අහිතකර ලෙස බලපායි. මුහුදු මට්ටම ඉහළ යාම, කුණාටු සහ වෙරළ ඛාදනය ශ්‍රී ලංකාවේ සමස්ත වෙරළ කලාපයටම බලපායි. රටේ ජනගහණයෙන් ආසන්න වශයෙන් 50% ක් ජීවත් වන්නේ එහි වේ.

මෑත අතීතයේ ශ්‍රී ලංකාව මුහුණ දුන් ස්වාභාවික විපත්වල බහුලම සහ සුලභම ආකාරයන් වන්නේ ගංවතුර, නාය යෑම්, තද සුළං ආදියයි. මේ සියල්ල සිදුවන්නේ මෝසම් සුළංවල ප්‍රතිඵලයක් ලෙසයි. 2022 අගෝස්තු මස මුල් සතිය තුළ ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය තීව්‍ර වූ අතර, නිරිතදිග මෝසම සක්‍රිය වීමත් සමඟම උතුරු, මධ්‍යම, බස්නාහිර, දකුණ සහ සබරගමුව වැනි පළාත් රැසකට දැඩි බලපෑම් එල්ල වී දේපළ හා ජීවිත හානි සිදු විය. අධික වර්ෂාව, අධික සුළං, ගංවතුර සහ නායයෑම් හේතුවෙන් 2022 අගෝස්තු 8 වන විට දිස්ත්‍රික්ක දහයක් පුරා පවුල් 4000ක් පීඩාවට පත්ව ඇති බව ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා සම්බන්ධ 30 වසරක දත්ත අනුව, 1974 සහ 2004 අතර කාලය තුළ ගංවතුර හා නියඟ මට්ටම් ඉහළ යමින් තිබේ. වාර්ෂිකව මැයි සහ සැප්තැම්බර් මාස අතර කාලය තුළ නිරිතදිග මෝසම ප්‍රධාන වශයෙන් බස්නාහිර සහ නිරිතදිග පළාත්වල දැඩි ගංවතුර ඇති කරන අතර දෙසැම්බර් සහ පෙබරවාරි අතර වාර්ෂිකව ඇති වන ඊසානදිග මෝසම නැගෙනහිර, උතුර සහ උතුරු මැද පළාත්වල ගංවතුරට හේතු වේ. වසරේ අනෙකුත් කාලවලදී ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශ නියඟයෙන් පීඩා විඳිති.

නායයෑම්, ගල් පෙරළීම් සහ බෑම් කඩා වැටීම හේතුවෙන් නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කවල ප්‍රධාන මාර්ග සහ දුම්රිය මාර්ග රැසක් අවහිර විය. මීට අමතරව රත්නපුර දිස්ත්‍රික්කයේ නිවාස රැසකට ද ගංවතුරින් හානි සිදු විය. විශේෂයෙන්ම පසුගිය දශක දෙකක කාලය තුළ දිවයිනේ කඳුකර ප්‍රදේශයේ මෙම නායයෑම් වල තීව්‍රතාවය ඉහළ යමින් පවතින බව පෙනේ. මෙම වැඩිවීමට හේතු ලෙස උස්බිම් ප්‍රදේශවල භූගෝලීය විපර්යාස, විටින් විට ඇදහැලෙන අධික වර්ෂාවට අමතරව වන විනාශය බව හඳුනාගත හැකිය.

මෙම මෝසම් වැසි ඇතිවීමට මූලික හේතුව ගොඩබිමේ සහ ජලයේ උෂ්ණත්වයේ සිදුවන වෙනස්වීම් හේතුවෙන් සුළංවල ඍතුමය මාරුවීම් වුවද, කාලගුණික විපර්යාස සහ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් මෝසම් උච්චාවචනයන් වැඩි වන බව පර්යේෂණවලින් පෙනී යයි. මෙමගින් ඉතා දිගු වියළි කාල පරිච්ඡේදයන් හෝ අධික වර්ෂාපතනයන් සහිත කෙටි කාල පරිච්ඡේදයන් ඇති විය හැක. ගෝලීය උණුසුම වැඩි වන තරමට මෝසම් ශක්තිමත් වී සමස්ත වර්ෂාපතනය වැඩි වන බවට අනාවැකි පළ කර තිබේ.

මෙම මෝසම් වැසි ඇතිවීමට මූලික හේතුව ගොඩබිමේ සහ ජලයේ උෂ්ණත්වයේ සිදුවන වෙනස්වීම් හේතුවෙන් සුළංවල ඍතුමය වෙනස්වීම් වුවද, කාලගුණික විපර්යාස සහ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් මෝසම් උච්චාවචනයන් වැඩි වන බව පර්යේෂණවලින් පෙනී යයි. මෙය නිසා ඉතා දිගු වියළි කාල සීමාවන් හෝ අධික වර්ෂාපතනයේ කෙටි කාල පරතරයන් ඇති විය හැක. ගෝලීය උණුසුම වැඩි වන තරමට සමස්ත වර්ෂාපතනය සමඟ මෝසම් ශක්තිමත් වන බව අනාවැකි ද සඳහන් කරයි.

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය ද වරින් වර සුළි කුණාටු අත්විඳින අතර ඒවා අනෙකුත් බොහෝ ස්වාභාවික ආපදා තරම් දරුණු නොවන නමුත් අනාගතයේදී ඒවායේ පරිමාණයේ හා නිරන්තරභාවයේ වැඩි වීමක් අපේක්ෂා කෙරේ. මෙම සුළි කුණාටු ප්‍රධාන වශයෙන් ඇති වන්නේ නොවැම්බර්-දෙසැම්බර් කාලය තුළය.

අධික වර්ෂාපතනයේ මෙම ප්‍රතිවිපාකවලට ශ්‍රී ලංකාවට පසුගිය වසර කිහිපය තුළ නිරන්තරව මුහුණ දීමට සිදු විය. ඒවාට මුහුණ දීමට රටට සිදු වූයේ වායු සහ ජල දූෂණය වැනි අනෙකුත් ප්‍රධාන පාරිසරික තර්ජන පිළිබඳව කටයුතු කරන අතරම බව සඳහන් කළ යුතුය. රට තුළ සිදුවන ශීඝ්‍ර වන විනාශය වායුගෝලයේ පවිත්‍රතාව කෙරෙහි ඍජු බලපෑමක් ඇති කර තිබේ. එමගින් ස්වාභාවික සිසිලන පද්ධතියක් හරහා තාපයට එරෙහිව සටන් කිරීමේ ක්‍රියාවලිය දුෂ්කර කාර්යයක් බවට පත් කරයි. විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන විනාශය බොහෝ කලක සිට ප්‍රශ්නයක්ව පැවතියද මීට වසර කිහිපයකට ඉහතදී සිදුකෙරුණු වන විනාශය පිළිබඳ සාකච්ඡා සමඟ ශ්‍රී ලංකාවේ වන විනාශය පිළිබඳ ප්‍රශ්න අවධානයට ලක්විය. එක්දහස් අටසියග ණන්වල අගභාගයේදී ශ්‍රී ලංකාවේ වන ඝනත්වය 82% ක් වූ අතර 1990 සිට 2000 දක්වා කාලය තුළ රටේ වනාන්තර කලාපයේ සාමාන්‍ය වාර්ෂික වන හානිය හෙක්ටයාර් 26,800 ක් වූ බව පැවසේ. ඒ අනුව එකල සාමාන්‍ය වාර්ෂික වන විනාශය සියයට 1.14ක් විය.

2002 සිට 2021 දක්වා වසර 19 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ වන හානිය 5.3% කි. 2010දී ශ්‍රී ලංකාවේ ස්වභාවික වනාන්තර කලාපය හෙක්ටෙයාර මිලියන 3.53 වූ අතර 2021 වසර තුළ රටට වනාන්තර හෙක්ටෙයාර 13,300ක් අහිමි වී ඇත. එයින් අදහස් වන්නේ කාබන් ඩයොක්සයිඩ් විමෝචනය ටොන් මිලියන පහකට සමාන බවයි.

තවද, ගංගා සහ වැව් වැනි ජල මූලාශ්‍රවලට විවිධ රසායනික ද්‍රව්‍ය වැනි අපද්‍රව්‍ය මුදාහරින කාර්මික හා වාණිජ කටයුතු හේතුවෙන් රටේ පිරිසිදු ජලය සඳහා ප්‍රවේශය සීමා වී ඇත. එමෙන්ම, රටේ පුරවැසියන් අතර සෞඛ්‍ය අවදානමකට ද එය හේතු වී ඇත.

ශ්‍රී ලංකාවට බලපෑ දේශගුණික විපර්යාසවල මෑත කාලීන ප්‍රතිවිපාකවලින් එකක් වූයේ 2022 දෙසැම්බර් මස මුලදී රටේ බොහෝ ප්‍රදේශවල වාතයේ ගුණාත්මකභාවය හදිසියේ පහත වැටීමයි. මෙම කාල සීමාව තුළ රටේ බොහෝ ප්‍රදේශවල වායු තත්ත්ව දර්ශකය 150 සහ 200 අතර විය. අනපේක්ෂිත ලෙස වාතයේ ගුණාත්මකභාවය මෙසේ පහත වැටීමට හේතුව වූයේ වායුගෝලයේ සියුම් අංශු මට්ටම සාමාන්‍ය යැයි

සැලකෙන මට්ටමට වඩා බෙහෙවින් ඉහළ මට්ටමකට වැඩි වීමයි. මෙම කාලය තුළ මහජනතාව ස්වසන ආබාධ රැසකට ගොදුරු වූහ.

බෙංගාල බොක්ක ආශ්‍රිතව වර්ධනය වූ අඩු පීඩනය හේතුවෙන් සුළි සුළං තත්ත්වයන් ඇති වේ. ඒ හේතුවෙන් සුළං රටාවේ වෙනසක් ඇති වන අතර වායු දූෂක ද්‍රව්‍ය ඉන්දීය උප මහාද්වීපයෙන් ශ්‍රී ලංකාවේ ගුවන් කලාපයට ඇතුළු විය. මෙම තත්ත්වය වායුගෝලයේ දූෂක මට්ටම සමඟ වඩා විශාල දාම ප්‍රතික්‍රියාවක් නිර්මාණය කළ අතර එය සූර්ය විකිරණය කපා හැරීමෙන් අවසානයේ රට පුරා අසාමාන්‍ය සීතල කාලගුණයක් ඇති විය. එය සංවේදී සතුන්ගේ සහ මිනිසුන්ගේ සෞඛ්‍යයට අහිතකර විය.

කෙසේ වෙතත්, අපේක්ෂා කළ පරිදි, වායු තත්ත්ව දර්ශකයේ මෙම පහත වැටීම දින කිහිපයක් ඇතුළත වැඩිදියුණු විය. එසේ වුවද, ශ්‍රී ලංකාව තවමත් නිරන්තරව ඉහළ වායු දූෂණයක් අත්විඳින බව සඳහන් කළ යුතුය. කොළඹ, මහනුවර, පුත්තලම, වවුනියාව සහ යාපනය දිස්ත්‍රික්ක ඇතුළු ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල වායු දූෂණය ඉහළ ගොස් ඇති බව වාර්තා වේ. වැඩිම වායු දූෂණයක් ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේයි.

වායු දූෂණයට ප්‍රධාන හේතු ලෙස කාබනික අපද්‍රව්‍ය පිළිස්සීම, කෘෂිකර්මාන්තයේ අතුරු නිෂ්පාදන සහ වාහනවලින් සිදුවන වායු විමෝචනය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම දකුණු ආසියානු කලාපයේ වායු දූෂණයට වඩාත් ප්‍රමුඛතම හේතුව වාහන විමෝචනයයි. විමෝචන පාලනය පිළිබඳ රෙගුලාසි අනුව බොහෝ වාහන ධාවනයට නුසුදුසු වීම එයට හේතුවයි. වායු දූෂණය ඉහළ යාමට හේතු වී ඇති මෙම ගැටලු විසඳීමට රටවල් පියවර ගැනීම අතිශයින් වැදගත් ය.

ශ්‍රී ලංකාවේ බොහෝ දිස්ත්‍රික්ක මේ වසරේ අප්‍රේල් මාසයේ සහ මැයි මස මුල් භාගයේදී මුහුණ දුන් අධික උෂ්ණත්වය හේතුවෙන් පරිසරයට සහ ජනතාවට දැඩි දුෂ්කරතාවන්ට ලක්වීමට සිදු විය. මෙම කාලසීමාව තුළ බොහෝ දිස්ත්‍රික්කවල සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 35ක් පමණ වූ අතර තාප තරංගවල බලපෑමෙන් ඇති වන විජලනය වැනි තත්වයන්ගෙන් ආරක්ෂා වීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට මහජනතාවට නිරන්තරයෙන් සෞඛ්‍ය උපදෙස් ලබා දීමට සිදු විය. විශේෂයෙන්ම වැඩිහිටියන්, ළදරුවන් සහ ළමුන්, ගැබිණි මව්වරුන් සහ කම්කරුවන් සඳහා මෙම උණුසුම් කාලගුණය අතිශය අවදානම් තත්ත්වයක් විය.

විජලනයට අමතරව උෂ්ණ ආඝාත, උෂ්ණ කැක්කුම, උෂ්ණ විඩාව වැනි දරුණු සෞඛ්‍ය ගැටලු පිළිබඳව මහජනතාවට අනතුරු අඟවන ලදි. උෂ්ණාධික රෝග හේතුවෙන් මරණ කිහිපයක් ද රට පුරා වාර්තා විය. මේ වසරේ අප්‍රේල්-මැයි මාසවල ශ්‍රී ලංකාව අත්විඳින ලද උෂ්ණ තරංග දේශගුණික විපර්යාස කෙරෙහි ද විශාල බලපෑමක් ඇති කළ හැකිය. නියඟ, ලැව්ගිනි බලාපොරොත්තු වන්නට සිදු වේ. මෙම තාප තරංගවල වක්‍ර ප්‍රතිවිපාක වනුයේ අධික උෂ්ණත්වය හේතුවෙන් බලශක්ති පරිභෝජනය වැඩිවීමයි. එමගින් හරිතාගාර වායු විමෝචනය ද වැඩි විය හැකිය.

දේශගුණික විපර්යාසවල මෙම ප්‍රතිවිපාක වැඩිපුර බලපානුයේ දුප්පතුන්ට සහ ජනගහනයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කොටස්වලටය. උෂ්ණත්වය ඉහළ යාම සහ වරින් වර වෙනස් වන වර්ෂාපතන රටා කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවයට බලපාන අතර ගොවීන්ට අතිශය දුෂ්කර කාලවලට මුහුණ දීමට සිදු වේ. එපමණක් නොව, දේශගුණික විපර්යාස සහ ආන්තික කාලගුණික තත්ත්වයන් හේතුවෙන් බොහෝ බෝවන රෝග හා වාහකයන් මගින් බෝවන රෝග ඇති විය හැකි බැවින්, බොහෝ පුද්ගලයින්ගේ සෞඛ්‍යයේ පිරිහීමක් දක්නට ලැබේ. එය ඔවුන්ගේ ඵලදායිතාවට සහ අවසානයේ ඔවුන්ගේ ජීවන තත්ත්වයට බලපානු ඇත. මෙය සිදුවන්නේ ශ්‍රී ලංකාව දැනටත් ආර්ථික වශයෙන් අභියෝගයන්ට මුහුණ දී සිටියදීය.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදකාරී තත්ත්වය පාරිසරික ගැටලු සඳහා දායක වී ඇති ආකාරය ද සිත්ගන්නා කරුණකි. ආනයනික පොහොර සඳහා යන වියදම කපා හැරීමේ උත්සාහයක් ලෙස, රසායනික පොහොර තහනම් කිරීමත් සමඟ කාබනික ගොවිතැනට මාරුවීමේ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා රජය හඳුන්වා දුන්නේය. නිසි සැලසුමකින් තොරව මෙම ප්‍රතිපත්තිය හඳුන්වා දුන් බැවින් එකල ගොවීන් කාබනික ගොවිතැනට හදිසියේ මාරුවීම සඳහා සූදානමක් නොතිබිණි. මෙම හදිසි වෙනස සම්පූර්ණයෙන්ම රසායනික පොහොර මත යැපෙන ගොවීන්ගේ අස්වැන්නට විශාල බලපෑමක් ඇති කළේය.

එහි ප්‍රතිඵලයක් ලෙස සහල් වැනි ප්‍රධාන භෝග කිහිපයක නිෂ්පාදනය දැඩි ලෙස පහත වැටුණු අතර එය රට තුළ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටලුවක් නිර්මාණය කළේය. එම භෝග ආනයනය කිරීමට ද සිදු විය.

කෙසේ වෙතත්, දේශගුණික විපර්යාස සහ පරිසරය පිළිබඳ ගැටලු විසඳීම සඳහා ලෝක නායකයින් බොහෝ අවස්ථාවලදී එකට එකතු වී ඇත. රටවල් 195 ක සාමාජිකත්වය මත ගොඩනැගුණු එවැනි එක් මුලපිරීමක් ලෙස එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන මගින් දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) පිහිටුවන ලදි. මෙම මණ්ඩලය සාමාන්‍යයෙන් දේශගුණික විපර්යාස පිළිබඳව දැඩි විමසිල්ලෙන් සිටින අතර ගෝලීය දේශගුණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ විධිමත් වාර්තාවක් වාර්ෂිකව සම්පාදනය කරයි. කමිටුවේ 2022 වාර්තාව විසින් අවධාරණය කරන්නේ ඉදිරි දශක දෙක තුළ ගෝලීය උෂ්ණත්වය වැඩි වීම සෙල්සියස් අංශක 1.5 සීමාව තුළ රඳවා ගත යුතු බවයි.

පැරිස් සම්මුතිය ද දේශගුණික විපර්යාස පිළිබඳ ගැටලු ආමන්ත්‍රණය කළ අතර එය ලෝක අවධානයට ගෙන ආවේය. දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීමට සහ ගෝලීය උෂ්ණත්වය වැඩිවීම සෙල්සියස් අංශක 1.5 ක මට්ටමක තබා ගැනීමට අත්සන් කර ඇති සියලුම රටවල සාමූහික ප්‍රයත්නයක් වන මෙම ගිවිසුම දුප්පත් ජාතීන්ට ගැටලුව සමඟ කටයුතු කිරීමට උපකාර කිරීම ද අරමුණු කරයි.

මේ අතර, එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ කාර්යරාමු සම්මුතියේ (COP27) පාර්ශ්වයන්ගේ 27 වැනි සමුළුව 2022 නොවැම්බර් 20 වැනි දින සිට සති දෙකක කාලයක් ඊජිප්තුවේ වෙරළබඩ නගරයක් වන Sharm el-Sheikh හිදී පැවැත්විණි. මෙම සමුළුව ද පැවැත්වුණේ දේශගුණික විපර්යාස සහ එහි ප්‍රතිවිපාක සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීමේ ක්‍රියා පටිපාටි සාකච්ඡා කිරීම මූලික අරමුණ කරගෙනය.

සමුළුවේදී සාකච්ඡා කරන ලද සමහර ප්‍රධාන කරුණු අතරට ෆොසිල ඉන්ධනවලින් තීරණාත්මක ලෙස ඉවත් වීමට රටවල් අසමත් වීම, වායු විමෝචනය ඉහළ යාම පිළිබඳ ගැටලුව දිගටම පැවතීම ඇතුළත් වේ. ගෝලීය මට්ටමෙන් හරිතාගාර වායු විමෝචනය ගැඹුරු, වේගවත් සහ තිරසාර අන්දමින් අඩු කිරීමේ හදිසි අවශ්‍යතාවක් පවතින බව එහිදී ප්‍රකාශ විය.

එපමණක් නොව, COP27 හි අවසාන ගිවිසුම විසින් පහත දැක්වෙන කරුණ අවධාරණය කරන ලදි: ”2030 දක්වා පුනර්ජනනීය බලශක්තිය සඳහා වසරකට ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 4 සිට ට්‍රිලියන 6 දක්වා ආයෝජනය කළ යුතුය. 2050 වන විට ශුද්ධ-ශුන්‍ය විමෝචනයකට ළඟා වීමට අපට ඉඩ සැලසීම සඳහා තාක්ෂණය සහ යටිතල පහසුකම් සඳහා වන ආයෝජන එයට ඇතුළත් විය යුතුය.

එක්සත් ජාතීන්ගේ තාක්ෂණ විධායක කමිටුව සහ දේශගුණික තාක්ෂණ මධ්‍යස්ථානය සහ ජාලය දේශගුණික අර්බුදයට මුහුණ දීම සඳහා පරිවර්තනීය තාක්ෂණයන් භාවිතය ඉහළ නැංවීමේ සැලසුම්වල අවශ්‍යතාව පිළිබඳව තවදුරටත් අවධාරණය කළේය.

මීතේන් විමෝචනය, හානියට පත් පරිසර පද්ධති යළි පණ ගැන්වීම වැනි අනෙකුත් කරුණු පිළිබඳව ද මෙම සමුළුවේදී සාකච්ඡා කෙරිණි. COP27 සම්මන්ත්‍රණය අවසන් වූයේ ගංවතුර සහ නියඟය වැනි ව්‍යසනවලින් විටින් විට පීඩාවට පත්වන අවදානමට ලක්විය හැකි රටවල් සඳහා අලාභ හා හානි අරමුදලක් ලබාදීමේ එකඟතාවක් සමඟිනි. ආපදාවලින් සිදුවන අලාභ හා හානිවලට ප්‍රතිචාර දැක්වීම සඳහා මූල්‍ය අවශ්‍යතාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ පළමු අවස්ථාව මෙය වූ බැවින්, මෙම ගිවිසුම ලොව පුරා බෙහෙවින් ප්‍රශංසාවට ලක් විය.

අරමුදල් විධිවිධාන ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳ ක්‍රියාවලිය පිළිබඳ නිර්දේශ සහ ඒවාට අනුගත වීම සඳහා වන අරමුදල පිළිබඳ සලකා බැලීම මෙම වසරේ පැවැත්වීමට සැලසුම් කර ඇති කඩප්28හිදී සිදුවනු ඇත.

දේශගුණික විපර්යාසවලට මූලික හේතුව සංවර්ධිත රටවල වේගවත් කාර්මීකරණය වන අතර එමඟින් අවසානයේ දුප්පතුන්ට පාරිසරික ගැටලුවල ප්‍රතිවිපාක විඳීමට සිදු වන බව 2022 නොවැම්බරයේ පැවති COP27 සමුළුව අමතමින් ශ්‍රී ලංකාවේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ප්‍රකාශ කළේය. ඌන සංවර්ධිත රටවලට ප්‍රමාණවත් අරමුදල් නොමැති බැවින් මෙම ගැටලු බොහොමයක් සමඟ සටන් කිරීම ඔවුන්ට දුෂ්කර වී ඇති

බවත්, මේ නිසා, පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම කෙරෙහි ද අවධානය යොමු කරන අතර, ආර්ථික සංවර්ධනය සඳහා අරගල කිරීමේදී එම රටවලට දෙගුණයක අවදානමකට මුහුණ දීමට සිදුවී ඇති බවත් ඔහු සඳහන් කළේය.

2030 වන විට කාබන් විමෝචනය 14.5% කින් අඩු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම, සමුද්‍ර අවකාශීය සැලසුම්කරණයක් ආරම්භ කිරීම සහ දේශගුණික කාර්යාලයක් පිහිටුවීම වැනි දේශගුණික විපර්යාසය හා සම්බන්ධ ගැටලු විසඳීමේදී ශ්‍රී ලංකාවේ ප්‍රගතිය පිළිබඳව ද ජනාධිපතිතුමා මෙහිදී අවධානය යොමු කළේය. දේශගුණික ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාවට නැංවීමේදී ඇති ලොකුම බාධාව වන ධාරිතා මඳකම පිළිබඳ ගැටලුව විසඳීම සඳහා, ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට යෝජනා කළේය.

මෙම විශ්ව විද්‍යාලය, ජනාධිපතිවරයාට අනුව හරිත සහ නීල අධ්‍යයන සඳහා විෂයාන්තර ගෝලීය මධ්‍යස්ථානයක් වනු ඇති අතර, දේශගුණික අර්බුදය අවම කිරීම සඳහා හැකියාවන් ගොඩනැගීම සඳහා විශ්ව විද්‍යාලය කෙටිකාලීන පාඨමාලා සහ අනෙකුත් පශ්චාත් උපාධි වැඩසටහන් සපයනු ඇත. දේශගුණික විපර්යාස සහ අනෙකුත් පාරිසරික ගැටලුවලට එරෙහිව සටන් කිරීමේදී සාමූහික ක්‍රියාමාර්ගයේ වැදගත්කම අවධාරණය කරමින් ජනාධිපතිවරයා සිය දේශනය අවසන් කළේය.

කෙසේ වෙතත්, දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රශ්නය විසඳීමට දරන ප්‍රයත්නයන්හිදී ලොව පුරා අනෙකුත් සියලුම රටවල් මෙන්ම ශ්‍රී ලංකාව ද අභියෝග හා බාධා රැසකට මුහුණ දෙන බව සඳහන් කළ යුතුය. වන විනාශය, නාගරික ව්‍යාප්තිය, කෘෂිරසායන ද්‍රව්‍ය භාවිතය, වාහන මගින් වායුගෝලය දූෂණය වීම සහ නීති විරෝධී ද්‍රව්‍ය අපද්‍රව්‍ය ලෙස බැහැර කිරීම වැනි පොදු පාරිසරික ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමට මූලික වශයෙන් රට අවධානය යොමු කළ යුතුය. අනෙක් අතට, සුළං සහ සූර්ය බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්තියට පරිවර්තනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට ශ්‍රී ලංකාවට ද අවශ්‍ය වේ.

විශේෂයෙන්ම සූර්ය බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා වඩාත් විවෘත වීමෙන් මෙය කළ හැකිය. සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් ලැබී ඇති වර්තමාන ආයෝජන සමඟ, වෙනත් රටවලින් ද පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා වැඩි ආයෝජන ලබා ගැනීමට අපට අවස්ථාව ලබාගත හැකිය. ශ්‍රී ලංකාව ද පාරිසරික බලපෑම් ඇගැයීමේ (EIA) ක්‍රියාවලිය සංවර්ධන මෙවලමක් ලෙස අනුගමනය කළ යුතු අතර එය සංවර්ධනය සඳහා බාධාවක් කරගත යුතු නැත. පරිසර දූෂකයන්ට එරෙහිව මැදිහත් වීමට පරිසර ආයතනවලට වැඩි බලතල ලබා දීමෙන් පරිසර දූෂණය පිළිබඳ ප්‍රශ්නය බොහෝ දුරට විසඳා ගැනීමට හැකි වනු ඇත.

අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සසඳන විට, ශ්‍රී ලංකාව වගවිය යුතු වන්නේ අඩු හරිතාගාර වායු විමෝචනයකටය. එසේ වුවද, ගෝලීය දේශගුණික විපර්යාස සඳහා දැනට සිදුවන දායකත්ව මට්ටම අවම කිරීමට රට විසින් පියවර ගත යුතුව තිබේ. පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ වැඩිදියුණු කිරීම් ඔස්සේ පොදු ප්‍රවාහනය ප්‍රචලිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මගින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචන මට්ටම අඩු කිරීම, කාර්මික අංශයේ තිරසාර පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම, අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම, අපද්‍රව්‍ය නිසි ලෙස වෙන් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කෘෂිකාර්මික අංශය අනුව, ගොවීන්ගේ බෝග ඵලදායිතාව ඉහළ නැංවීමට පියවර ගන්නා අතරම පසු අස්වනු හානි ද අඩු කළ හැකිය.

නීති විරෝධී ද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය ලෙස බැහැර කරන දූෂකයින් මර්දනය කිරීමට නාගරික බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය. "හරිත නොවන" නිෂ්පාදන සඳහා අධික ආනයන තීරුබදු පැනවීම පිළිබඳව ශ්‍රී ලංකාව තවදුරටත් විමසා බැලිය යුතු අතර හරිත තාක්ෂණයේ අපනයනකරුවෙකු බවට පත්විය යුතුය. දේශගුණික විපර්යාස සහ පාරිසරික හානියේ වත්මන් ප්‍රවණතා සමඟ COP14 සම්බන්ධයෙන් ධනාත්මක ක්‍රියාමාර්ගයක් ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ.




# පුද්ගලාන්තර සබඳතා

ආර්ථික අර්බුදය විසින් ශ්‍රී ලංකාවට වෙනත් අවස්ථා විවෘත කර ඇත. මේ අතර එහි ඓතිහාසික, සංස්කෘතික සහ විවිධ ආර්ථික නොවන ද්විපාර්ශ්වික සබඳතා ද තිබේ. ඉන්දියානු සාගරයේ ශ්‍රී ලංකාවේ වැදගත් පිහිටීම හේතුවෙන් සහස්‍රයකට වැඩි කාලයක් තිස්සේ මෙම සම්බන්ධතා ශක්තිමත් වී ඇත. පැහැදිලි භූගෝලීය සහ භූ දේශපාලනික හේතූන් මත එවැනි සම්බන්ධතා, ඉන්දියාව වටා කේන්ද්‍රගත වී ක්‍රියාත්මක වෙමින් ඇත. ඉන්දියාවේ දකුණේ සමීපතම අසල්වැසියා ලෙස, ශ්‍රී ලංකාවට සිය විදේශ ප්‍රතිපත්තියේදී නිරන්තරයෙන් නවදිල්ලිය ගැන සැලකිලිමත් වීමට සිදු වේ. අනෙක් අතට, ඉන්දියානු සාගරය තුළ දිවයින පිහිටා තිබීම නිසා ඓතිහාසිකව වෙළඳුන්, සංචාරකයින් සහ අධිරාජ්‍යවාදී බලවතුන් ආකර්ෂණය කරගෙන ඇති අතර, ඔවුන් සියල්ලන්ම දේශීය සංස්කෘතිය සහ සමාජය තුළ ඔවුන්ගේ බලපෑම් සලකුණු කර ඇත.

සාමුද්‍රික කුඩා දූපත් රාජ්‍යයක් වන බැවින් චීනය සහ ඉන්දියාව සතු ආර්ථික බලයේ සහ ආධිපත්‍යයේ වාසිය ශ්‍රී ලංකාවට නැත. නවතම සංඛ්‍යාලේඛනවලට අනුව බංග්ලාදේශය වැනි රටවල් පවා ශ්‍රී ලංකාවට ඉහළින් ස්ථානගත වේ.  විශේෂයෙන් ඇඟලුම් ක්ෂේත්‍රයේ මෙම තත්වය දැකිය හැකිය. මෙම හේතූන් නිසා, ද්විපාර්ශ්වික සබඳතා ගොඩනගා ගැනීමේදී, ශ්‍රී ලංකාව සෑම විටම පාහේ සිය ඓතිහාසික හා සංස්කෘතික සම්බන්ධතා භාවිතා කර ඇත. එක් උදාහරණයක් දක්වන්නේ නම්, මධ්‍යම ආසියාව සමඟ සබඳතා පවත්වද්දී, සේද මාවතට එහි සහභාගීත්වය මෙන්ම මධ්‍යම ආසියාව සමඟ ඇති බෞද්ධ සම්බන්ධය ගැන ද නිලධාරීහු කරුණු දක්වති. විශේෂයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීමෙන් පසුව 1970 ගණන්වල සිට පුරාවිද්‍යා කැණීම්වල දියුණුවත් සමඟ මෙන්ම 1990 දශකයෙන් පසු, චීනය සමඟ රටෙහි සමුද්‍ර සබඳතාව පිළිබඳ ඇති වූ නව උනන්දුව හේතුවෙන් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සඳහා ශක්තිමත් වේදිකාවක් ලෙස ශ්‍රී ලංකාව වැඩි වැඩියෙන් එවැනි පොදුභාවයන් සෙවීම වෙත යොමු විය.

කෙසේ වෙතත්, එම බැඳීම්වලින් ලබාගත හැකි වාසිය රට විසින් සම්පූර්ණයෙන්ම ලබාගෙන තිබේද යන්න සොයා බැලිය යුතුය. මෙම ගැටලුව සම්බන්ධයෙන් පරස්පර කාරණා දෙකක් දැකිය හැකිය. පළමුව, රටේ හවුල්කරුවන් සමඟ සබඳතා ප්‍රවර්ධනය කිරීමේදී, විශේෂයෙන්ම සංස්කෘතිය, වෙළෙඳාම සහ මිනිසුන් අතර සබඳතා ක්ෂේත්‍රය තුළ ඓතිහාසික පොදු කරුණු ඉදිරිපත් කිරීමට නිලධාරීන් මහන්සි වන්නේ නැත. දෙවනුව, රට බොහෝ කලාපවලදී මෙහි විභවය නිසි ලෙස ගවේෂණය කර නැත. අප්‍රිකාව, ලතින් ඇමරිකාව සහ මධ්‍යම ඇමරිකාව මෙන්ම මධ්‍යම ආසියාව සම්බන්ධයෙන් ද මෙම තත්වය දැකිය හැකිය. මෙම විරුද්ධාභාසය වසර ගණනාවක් නොව දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවට බලපා තිබේ. කෙසේ වෙතත්, අප්‍රිකාව සඳහා ප්‍රතිපත්තියක් සංකල්පගත කිරීම සඳහා මෑත කාලීන පියවරයන් දැකිය හැකිය. එහෙත්, ශ්‍රී ලංකාව මෙම කලාප තුළට ගැඹුරට ගොස් ජාත්‍යන්තර සබඳතා තහවුරු කර ගන්නේ කෙසේද යන්න තවමත් නිසි ලෙස සලකා බලා නොමැති බව අපේ නිරීක්ෂණයයි.

අපේක්ෂා කළ පරිදි, අර්බුදය හේතුවෙන් විදේශ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය මෙම කලාපය වෙත යොමු වී ඇත. ලතින් සහ මධ්‍යම ඇමරිකාව තුළ ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් ශක්‍යතා ඇති බව විදේශ අමාත්‍ය අලි සබ්රි, පුවත්පත් කතුවරුන් සමඟ සාකච්ඡාවකට එක්වෙමින් සඳහන් කළේය. මෙක්සිකෝව වැනි රටවල් සමඟ ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් මිලියන 200කට වඩා වටිනා වෙළඳාමක් සිදුකරන මුත්, ඔවුන් සමඟ සෘජු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීමට විදේශ අමාත්‍යාංශය කිසි විටෙකත් සලකා බලා නැති බව ඔහු පෙන්වා දුන්නේය. කිසියම් අද්භූත හේතුවක් නිසා දිවයිනේ රේඩාර්වලට මධ්‍යම ආසියානු කලාපය ද අසුවී නොමැති බව විදේශ අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

අනෙක් අතට, ශ්‍රී ලංකාව ද්විපාර්ශ්වික සබඳතා තහවුරු කර ගැනීමට අපොහොසත් වී තිබෙන්නේ සැලකිය යුතු සංස්කෘතික බැඳීම් සහිත පර්යන්ත කලාප සමග පමණක් නොවේ. ප්‍රහේලිකාව වන්නේ රටේ රාජ්‍ය තාන්ත්‍රික යාන්ත්‍රණය කිසි විටෙකත් එහි සමීපතම හවුල්කරුවන් සමඟ එහි සංස්කෘතික හා ඓතිහාසික බැඳීම් සැබෑ ලෙස ගවේෂණය කර නොතිබීමයි. එක්සත් ජනපදය සමහර විට මෙහි හොඳම උදාහරණය විය හැකිය. පෙබරවාරි මාසයේදී දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතාවලට වසර 75 ක් සපිරුණි. එහෙත්, එක්සත් ජනපද-ශ්‍රී ලංකා සබඳතාවල ඉතිහාසය අඩුම තරමින් වසර 225කට පෙර එනම් 1788 දක්වා විහිදේ. එනම් මෙරට වෙරළබඩ කලාප බ්‍රිතාන්‍ය යටත් විජිතකරණයට ලක්වීමට දශකයකට පමණ පෙර කාලයයි. 2016 දී එක්සත් ජනපද තානාපති කාර්යාල කාර්ය මණ්ඩලය විසින් ලංකාවේ පළමු ඇමරිකානු කොන්සල්වරයාගේ සොහොන් බිම සොයා ගන්නා ලදී. කෙසේ වෙතත්, දේශීය සහ එක්සත් ජනපද පුවත්පත්වල සිරස්තලයක් බවට පත් විය යුතුව තිබූ මෙම ප්‍රවෘත්තිය අප අතපසු කරගත් අතර එය අවධානයට ලක්වුණේ යන්තමින් පමණි.

ඇත්ත වශයෙන්ම මෙය එක් උදාහරණයක් පමණි. එහෙත්, ඇතැම් රටවල් සමඟ ශ්‍රී ලංකාව එකම පොදු සංස්කෘතික, ඓතිහාසික සහ පුද්ගලාන්තර සම්බන්ධකම් සොයා යන බවක් පෙනේ. නිදසුනක් වශයෙන්, ඉන්දියාව සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකාව නිතරම රාමායනය වෙත යොමු වේ. අද එවැනි පොදු ලක්ෂණ සහිත රාමායණ මංපෙතෙහි සන්ධිස්ථාන සංචාරක ආකර්ෂණ ස්ථාන ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. අවාසනාවකට, රාජ්‍යයන් දෙක අතර යුද්ධයක් නිරූපණය කරන මිථ්‍යාවකට යොමු වීමෙන් රටක් එහි සමීපතම අසල්වැසියා සමඟ ඇති සබඳතා වඩාත් හොඳින් ගොඩනැගෙන්නේද යන යුක්ති යුක්ත ප්‍රශ්නය මෙහිදී මතු කළ හැකිය. මේවා ජාතීන්ගේ සාමූහික විඥානයන් තුළ මුල් බැසගෙන තිබේ. අපගේ දැක්මට අනුව, සහජීවනය, එකමුතුකම සහ සුහදතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතික බැඳීම් යොදාගත හැකි අතර එසේ කළ යුතුය. ශ්‍රී ලංකාව එහි සුවිශේෂී සංස්කෘතික අනන්‍යතාවන්ගෙන් එකක් වන බුද්ධාගම වඩාත් සංගත ලෙස මේ සඳහා භාවිතා නොකළේ මන්දැයි අපට කුතුහලයක් ඇතිවන්නේ එම නිසාය.

ඉන්දියාව සම්බන්ධයෙන් ගත් කල, එරට සමඟ ශ්‍රී ලංකාවේ බෞද්ධ සබඳතාව හඹා යෑම වාසිදායකය. ඉන්දියාව විසින් ද ශ්‍රී ලංකාව තුළ එම සබඳතාව සොයා යන බව දැකිය හැකිය. ඉන්දියාව එසේ කිරීමට හේතුව චීනය ශ්‍රී ලංකාව තුළ බෞද්ධ රාජ්‍ය තාන්ත්‍රිකභාවය ක්‍රියාවේ යෙදවීම විය හැකිය. ඉන්දියාව සම්බන්ධයෙන් අපට තිබෙන වාසිය වන්නේ ශ්‍රී ලංකාවේ ස්ථාපිත බුද්ධාගමේ ස්වරූපය ඉන්දියාවට සමීප වීමයි. චීනයේ දීර්ඝ සංස්කෘතික පරිණාම ක්‍රියාවලියක් මගින් සැලකිය යුතු ලෙස ථේරවාද සම්ප්‍රදායෙන් වෙනස් වූ බුද්ධාගමක් චීනයේ නිර්මාණය වී තිබේ. එය දකුණු ආසියානු සහ අග්නිදිග ආසියානු ථේරවාද බුදු දහම් ප්‍රභේදවලින් බොහෝ දුරට වෙනස්ය. චීනය සහ ශ්‍රී ලංකාව අතර "බෞද්ධ සම්බන්ධයක්" නොමැති බව මින් අදහස් නොවේ. එය දුරස්ථය. එහෙත්, සංස්කෘතික වශයෙන් සරුසාර ඉන්දියාව, ථේරවාද බුදුදහමේ පමණක් නොව, ජෛන ආගම වැනි එයට බලපෑ වෙනත් ආගම්වල ද උත්පත්ති ස්ථානය වීම හේතුවෙන්, එහි සමීපතම අසල්වැසියා සමඟ සංස්කෘතික සබඳතා තහවුරු කර ගැනීමේ වාසි ඉතා පැහැදිලිය.

එක්සත් ජනපදය සම්බන්ධයෙන් ගත් කල, මේ අන්දමින් සබඳතා ලුහුබැඳීමේ ප්‍රතිලාභ පැහැදිලිව දැකිය හැකිය. එක්සත් නිදහසේ සිට, විශේෂයෙන් 1952 සිට, ජනපද-ශ්‍රී ලංකා සබඳතා වොෂින්ටනයෙන් ආර්ථික සහන ලබා ගැනීම ඉලක්ක කරයි. එවක ලංකා රජය බටහිර ගැති, එක්සත් ජනපද ගැති පරිපාලනයක් වූ බව පැවසිය හැකිය. එය පැවසීමට වෙනත් ඊට වඩා යහපත් ආකාරයක් නැත. ශ්‍රී ලංකා රජය බටහිර රටවල් සමඟ පෙළගැසෙමින් සිටියදී පවා, නියෝජිත පිරිසක් චීනයට යවා එම වසරේ අගභාගයේදී රබර්-සහල් ගිවිසුමට එළැඹුණේය. එය දුටු ඇමරිකානු නිලධාරීහු එම සහන චීනයට පෙර ලබා දීමට ඉදිරිපත් නොවීම ගැන කණගාටු වූහ. එතැන් සිට, එක්සත් ජනපදය සමඟ සබඳතා බොහෝ විට නරක අතට හැරී ඇත. විශේෂයෙන් 1960 දශකයේදී තෙල් සමාගම් ජනසතු කිරීම වැනි හේතු එයට බලපෑවේය. ඇත්ත වශයෙන්ම, 1977 න් පසු බටහිරට නැඹුරු වුවද, ශ්‍රී ලංකාව තවමත් වොෂින්ටනය සමඟ සංස්කෘතික පෙරමුණෙහිදී නිසි ලෙස සම්බන්ධ වී නැති අතර ආර්ථික හා ආරක්ෂක සබඳතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බව පෙනේ.

ඇත්ත වශයෙන්ම මේ සඳහා හේතු ඉතා පැහැදිලිය. ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවේ පිහිටීම සහ ඉන්දියාව සහ විශේෂයෙන්ම චීනය සමඟ ඇති සබඳතා, එක්සත් ජනපදයේ ඉන්දු-පැසිෆික් උපායමාර්ගයේ අනිවාර්ය අංගයක් බවට පත් වී ඇත. ඉන්දු-පැසිෆික් කලාපයේ බොහෝ කුඩා රාජ්‍යයන් මෙන්ම, ශ්‍රී ලංකාවද ක්වාඩ් (Quad) සන්ධානය ගැන සැලකිලිමත් වන මුත්, වොෂින්ටනය සමඟ එහි සබඳතා, විශේෂයෙන්ම මිලිටරි සබඳතා පවත්වා ගැනීමට ද උනන්දු වෙයි. අනෙක් අතට, එක්සත් ජනපදය දිගටම ශ්‍රී ලංකාව දෙස බලන්නේ එහි මිලිටරි කටයුතුවල දෘෂ්ටි කෝණයෙනි. මෙම හේතුව නිසා එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව වෙනම රාජ්‍යයක් ලෙස නොපෙනෙන අතර දකුණු ආසියාවේ සහ ඉන්දියන් සාගරයේ එහි ස්වාධීනත්වය හඳුනා ගැනීම වළක්වා ඇති බව අවම වශයෙන් එක් විද්‍යාර්ථියෙකු හෝ පෙන්වා දී තිබේ. මේ හේතුවෙන් ආර්ථික නොවන, මිලිටරි නොවන සබඳතා තහවුරු කර ගැනීමේ අවස්ථා දෙරට විසින්ම අහිමි කරගෙන ඇත.

මෙම සබඳතා ලුහුබැඳ යාමෙන් පැහැදිලි වාසි ඇත. බැලූ බැල්මට ශ්‍රී ලංකාව සහ ඇමෙරිකාව අතර පුළුල් සංස්කෘතික පරතරයක් පවතින බව පෙනේ. එහෙත් ශ්‍රී ලංකාවේ පොහොසත් බෞද්ධ උරුමයන් ගණනය කිරීමේදී පවා සංස්කෘතික අංගය ශක්තිමත්ව පවතී. ඇත්ත වශයෙන්ම, එම උරුමය සඳහා එක්සත් ජනපදයේ දායකත්වය, විශේෂයෙන් 19 වන සියවසේ අගභාගයේ බෞද්ධ පුනරුදයේ දී විඥානාර්ථ සංගමයේ මැදිහත්වීම සම්බන්ධයෙන් කිසිදු රටක් සොයා නොබැලීම කුතුහලය දනවන කරුණකි. දෙවැන්න ප්‍රතික්ෂේප කළ නොහැකි සහ පැහැදිලිවම ඇමරිකානු දායකත්වයකි. එයට කිසිදු මිලිටරි හෝ ආර්ථික අංගයක් සම්බන්ධ නොවීය. එය එකිනෙකට වෙනස් සමාජ දෙකක පුද්ගලයන්ගේ සම්භාව්‍ය සිද්ධියක්

වූ අතර, පොදු අවශ්‍යතාවලින් පෙලඹී, දෙකටම වාසිදායක අරමුණක් සඳහා එකට එක්වීම: Track 2 රාජ්‍යතාන්ත්‍රික මුලපිරීම.

ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමය, ඉන්දියාව, චීනය සහ එක්සත් ජනපදයේ සිට මධ්‍යම ආසියාව දක්වා සාම්ප්‍රදායික සහ සම්ප්‍රදායික නොවන අංශවලින් සිය සබඳතා තහවුරු කර ගැනීමට යොදාගත හැකි එක් මාර්ගයකි. අනෙක් පැත්තෙන්, දිවයිනට බෞද්ධ රාජ්‍ය තාන්ත්‍රිකභාවය මත පමණක් විශ්වාසය තැබිය හැකිද? මානව හිමිකම් සහ ප්‍රතිසන්ධාන පෙරමුණු සම්බන්ධයෙන් රටේ අසාර්ථකත්වය වසාගැනීම සඳහා ඉහළ මට්ටමේ බහුපාර්ශ්වික සංසදවලදී ශ්‍රී ලංකාව බුදුදහම ඔසවා තැබීම තරමක් කෘත්‍රිම විය හැකිය. එහෙත්, රාජ්‍ය තාන්ත්‍රික දෘෂ්ටිකෝණයකින් ගත් කල, ශ්‍රී ලංකාව තුළ බුද්ධාගමට හිමි ස්ථානය සම්ප්‍රදායිකව දෙපැත්ත කැපෙන කඩුවකි. එක පැත්තකින් බුද්ධාගම ශ්‍රී ලංකා ඉතිහාසයෙහි ප්‍රමුඛස්ථානයක් ගනියි. එහෙත්, ඒ හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ බුද්ධාගමට රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබේ. එය සෙසු වාර්ගික හා ආගමික කණ්ඩායම්වලට අනර්ථකාරී පසුබිමක් තුළ සිදුවන බව වාර්තා කිරීමට අසුබවාදී ජාත්‍යන්තර මාධ්‍යලට ද ඒ නිසා හැකි වී තිබේ.

අපගේ විමසීම්වලට පිළිතුරු දුන් එක් ප්‍රතිචාර දක්වන්නකු විසින් නිරීක්ෂණය කරන ලද පරිදි 'විදේශ සම්බන්ධතාවලදී සංස්කෘතියේ භූමිකාව සම්බන්ධයෙන් මූලික අනවබෝධයක් තිබේ'. මෙම විග්‍රහය අනුව, ද්විපාර්ශ්වික සම්බන්ධතා විෂයෙහිදී ශ්‍රී ලංකාව සංස්කෘතිය භාවිතා කිරීමට අසමත් වී නැත. අසමත් වී තිබෙන්නේ රට තුළදී මෙම ඓතිහාසික සහ සංස්කෘතික සම්බන්ධතා ශක්තිමත් කරගැනීමටයි. උදාහරණයක් ලෙස බෞද්ධ රාජ්‍යතාන්ත්‍රිකභාවය සැලකිල්ලට ගත් විට, ශ්‍රී ලංකාව සිය දෙදහස් පන්සිය වසරක ඉතිහාසය අවධාරණය කිරීමෙන් තෘප්තිමත් වී තිබේ. වසර 2,500ක් යනු ඇත්තෙන්ම දිගු කාලයකි. ඉතිහාසය විධිමත් ලෙස ලේඛනගත වී තිබෙන රටවල් අතර ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටියි. එහෙත්, ලෝකයේ එවැනි ඉතිහාස විග්‍රහයන් බලපාන්නේ කුඩා ග්‍රාහක පිරිසකටයි. උසස් සංස්කෘතීන් පොදු ජනතාවට දුරස්ථය. එයට හේතුව වන්නේ මෙරට මෙන්ම පිටරට බොහෝ ජනතාවකට බලපාන්නේ ජනප්‍රිය සංස්කෘතිය වීමයි. ශ්‍රී ලංකාව විසින් නිසි පරිදි අවබෝධ කරගත යුතු වන්නේ සහ අවධාරණය කළ යුතු වන්නේ මෙම ජනප්‍රිය සංස්කෘතියයි.

මෙම ජනප්‍රිය සංස්කෘතිය කුමක් විය හැකිද? මෑත කාලීන උදාහරණයක් වනුයේ "මැණිකේ මගේ හිතේ" ගීතයයි. එහෙත්, ඊටත් වඩා හොඳ උදාහරණයක් වනුයේ "සුරංගනී" ය. යොහානිගේ ගීතය මුල් ගැයුමේ වෙනස් පිටපතකි. සුරංගනී මුල් පිටපතක් වන අතර එය අර්ධ වශයෙන් සිංහල බයිලාවක් මත පදනම් විය. එය ශ්‍රී ලාංකීය සංස්කෘතියේ උච්චතම අවස්ථාව නියෝජනය කරන බව අප පවසන්නේ හේතු දෙකක් නිසාය. එය සිංහල සහ දෙමළ පද රචනයට බාධාවකින් තොරව මුසු වූ නිසාත්, එය මහා ප්‍රේක්ෂකයින් වෙත ඉතා සාර්ථක ලෙස ආකර්ෂණය වූ නිසාත් ය. "සුරංගනී" දශක ගණනාවක් පුරා බොහෝ රීමික්ස් සහ කවර්වලට ලක්වුණත් ඒ.ඊ. මනෝහරන්ගේ මුල් පිටපත තවමත් ජනප්‍රියය.

මහා සංස්කෘතියට ආමන්ත්‍රණය කිරීමේ ඉල්ලීම බොහෝ විට නොතකා හැර තිබේ. ජෙරී ස්ටාලින්ගේ "යාර්ල්පනාතිලිරුන්තු කොලවෙරිදා" ධනුෂ්ගේ "වයි දිස් කොලවරි ඩී" ගීතයට ප්‍රතිචාරයකි. බාහිර බලපෑම් මගින් දෙමළ භාෂාව අවමානයට ලක්වේ යැයි දක්වමින් යාපනේ දෙමළ භාෂාවෙන් ලියා ඇති "යාර්ල්පනාතිලිරුන්තු කොලවෙරිදා" යූටියුබ්හි එතරම් සාර්ථක වූයේ නැත. "මැණිකේ මගේ හිතේ" හාත්පසින්ම වෙනස්ය. එය කවර් පිටපතක් වුවත්, සිංහල ගීතයක් වුවත්, එය ඉන්දියානු භාෂා කිහිපයකටම නගන තරමට ජනප්‍රිය විය. දේශීය මෙන්ම විදේශීය දේශසීමා තරණය කරමින් විවිධ ප්‍රජාවන් එකමුතු කිරීමට එවැනි මැදපෙළ හෝ ඇතැමෙකු පහත් ලෙස සලකන කලා කෘතිවලට පවා හැකියාව ඇත. ශ්‍රී ලංකා රජය යොහානිගේ ගීතය නිශ්ශබ්දව සැලකිල්ලට ගත් නමුත්, එවැනි මුලපිරීම්වල ජනප්‍රියත්වය වෙනුවෙන් වැඩි යමක් කර ඇති බවක් පෙනෙන්නට නැත. කෙසේ වෙතත්, "මැණිකේ මගේ හිතේ" ගීතය නිකුත් වූයේ පසුගිය වසරේ අර්බුදය ආසන්නයේ බව ද සඳහන් කිරීම සාධාරණය.

ඇත්ත වශයෙන්ම, මෙය වනාහි රටක්, විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටක්, පිළිබඳ ගෝලීය සංජානනය සැකසීමේදී උසස් සංස්කෘතිය විසින් ඉටු කරන කාර්යභාරය හෑල්ලු කිරීමක් නොවේ. ශ්‍රී ලාංකීය ඉතිහාසය අලෙවි කිරීමේ හැකියාව පෙන්නුම් කරන මෑතකාලීන ප්‍රයත්නයක් වනුයේ "මල්වතු ඔය සොයා" නිර්මාණයයි. ප්‍රමුඛ පෙළේ ඉතිහාසඥයෙකු සහ කලා ඉතිහාසඥයෙකු වන ආචාර්ය සිංහරාජ තම්මිට-දෙල්ගොඩ විසින් රචනා කර අධ්‍යක්ෂණය කරන ලද "මල්වතු ඔය සොයා" මහවැලියට පසු ශ්‍රී ලංකාවේ දෙවන දිගම ගංගාවේ ඉතිහාසය නිරූපණය කරයි. ඒ ඉතිහාසය සිංහල හා පාලි වංශකතාවල මීට පෙරද නොඅඩුව සටහන් වී ඇත. එහෙත්, ජාත්‍යන්තර වශයෙන් සම්මාන කිහිපයක් දිනාගත් මෙම චිත්‍රපටය, මෙම ඉතිහාසය දෘශ්‍යමය වශයෙන්, පැහැදිලි, කාටත් තේරෙන ආඛ්‍යානයක් තුළ ඉදිරිපත් කිරීම ඉතා වැදගත්ය.

මේ සමග සැසඳිය හැකි නිර්මාණයක් වනුයේ බැසිල් රයිට්ගේ Song of Ceylon (1934) ය. රයිට්ගේ චිත්‍රපටය මෙන් 'මල්වතු ඔය සොයිා රාජ්‍ය අනුග්‍රහය නොලද අතර පෞද්ගලික සමාගමක් විසින් එයට අනුග්‍රහය දක්වන ලදී. ශ්‍රී ලංකාවේ නූතනවාදී කලා ව්‍යාපාරයේ පුරෝගාමියෙකු වන හැරී පීරිස් ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය පිළිබඳව පැවසූ දේ මෙමගින් සිහිපත් වේ.

"කලාවට ද විශාල ප්‍රතිලාභ ලබා දිය හැකි වන පරිදි සහ රටට බොහෝ සේ අවශ්‍ය විදේශ විනිමය රැගෙන ආ හැකි වන පරිදි, අපගේ නිර්මාණාත්මක හැකියාවන්ට මෙරට ධනවත් ව්‍යාපාරිකයන් සහාය හා ධෛර්යය සැපයිය යුතු නැද්ද?"

එම අර්ථයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ සංස්කෘතිය හරහා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි අලෙවි කිරීමේ ප්‍රධාන, ඉතා ඵලදායී භූමිකාවක් පෞද්ගලික අංශයට ඉටු කළ හැකිය. මෙය වාර්තා චිත්‍රපටවලින් පමණක් නොව වෘත්තාන්ත චිත්‍රපටවලින් ද කළ හැකිය. ශ්‍රී ලංකාව විදේශීය චිත්‍රපට නිෂ්පාදන සඳහා ඉහළම තත්ත්වයේ ස්ථානයක් ලෙස කීර්තියක් දිනාගෙන ඇති බව මෙහිදී සඳහන් කළ යුතුය. හම්බන්තොට රන්මිණිතැන්න හදන්නටත් පෙර සිට එම තත්වය තිබිණි. අර්බුදය හේතුවෙන් නිෂ්පාදන කිහිපයක් නතර වී ඇති නමුදු Good Karma Hospital වැනි විදේශීය චිත්‍රපට සහ කතා මාලා ගණනාවක් විසින් ශ්‍රී ලංකාව පෙරදිග පාරාදීසයක් ලෙස ස්ථාවර පිළිගැනීමක් නිර්මාණය කර තිබේ. ඇත්ත වශයෙන්ම එය බටහිර ඒකාකාරී සංස්කෘතියට විකල්පයක් ලෙස ශ්‍රී ලංකාව සැලකිය හැකිය. බටහිර. ශ්‍රී ලාංකික අධ්‍යක්ෂවරුන්ටම එවැනි නිර්මාණ සිදු කිරීමට රටේ භූ දර්ශන භාවිතා කළ හැකිද යන්න සොයා බැලිය යුතුය. මහරජ ගැමුණු වැනි මෑතකාලීන ප්‍රයත්නයන් දේශීය ප්‍රේක්ෂකයන්ට සහ ජාතිකවාදී සංස්කෘතික ආඛ්‍යානවලට පමණක් සීමා වූ අතර, ප්‍රසන්න විතානගේගේ ගාඩි වැනි තවත් නිර්මාණ ශ්‍රී ලංකාවේ සුන්දර භූ දර්ශන වඩාත් නිර්මාණශීලී ලෙස භාවිතා කර තිබේ. එවැනි චිත්‍රපට හරහා අධ්‍යක්ෂවරුන් නැවුම් කතා නිර්මාණය කර තිබේ.

ගාඩි විසින් රට තවත් විශාල සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රික මූලාශ්‍රයක් වෙත විවෘත කරන ලදී. එනම් ශ්‍රී ලාංකික විදේශගත ප්‍රජාවයි. අධ්‍යක්ෂවරයා මෙම සමාලෝචනයේ කතුවරුන්ට පැවසූ පරිදි, චිත්‍රපටය විදේශයන්හි, විශේෂයෙන් බටහිර අගනගරවල සහ ශ්‍රී ලාංකික විගමනිකයන් අතර දැවැන්ත සාර්ථකත්වයක් අඛණ්ඩව ලබා ඇත. ලාංකික සංක්‍රමණිකයන් ඔවුන්ගේ උපන් රටෙහි සංස්කෘතික දූතයින් ලෙස ක්‍රියාත්මක කරවීමට වැඩි උත්සාහයක් නොගන්නේ මන්දැයි සම්මුඛ සාකච්ඡාවේදී ප්‍රශ්නයක් මතු විය. ශතවර්ෂ ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව විසින් ගොඩනගා ගන්නා ලද ඓතිහාසික සම්බන්ධතා සමූහයක් තිබේ. රජය සහ විදේශ අමාත්‍යාංශය ඒවා නඩත්තු කිරීම සඳහා සමාජ මාධ්‍ය වැනි සාම්ප්‍රදායික නොවන වේදිකා සහ විදේශගත ප්‍රජාව නිර්මාණශීලීව භාවිතා නොකිරීම කුතුහලය දනවන කරුණකි. චීනය එරට සමඟ ඇති සංස්කෘතික සබඳතා පවත්වා ගැනීමට සමාජ මාධ්‍ය භාවිතා කරන ආකාරය අවධානය ලක්විය යුතුය.

නිල මට්ටමින්, ශ්‍රී ලංකාව මෙම බැඳීම් පවත්වා ගැනීම සඳහා නාලිකා දෙකක් භාවිතා කරයි. එනම්, පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම් සහ සංචාරක ප්‍රචාරණයයි. පසුගිය වසර කිහිපය තුළ එවැනි කණ්ඩායම් කිහිපයක් පිහිටුවා හෝ නැවත පණ ගන්වා තිබේ. ශ්‍රී ලංකා - එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය, ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම සහ ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම වැනි ඒවා උදාහරණ වේ. මේවා බොහෝ දුරට ක්ෂණික ප්‍රමුඛතාවලට ප්‍රතිචාර දැක්වීම් වේ. එක් උදාහරණයක් නම්, 2021 නොවැම්බර් මාසයේදී ඉන්දියාවෙන් නැනෝ පොහොර මිලදී ගැනීමට ශ්‍රී ලංකාව තීරණය කිරීමෙන් පසු ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම නැවත පණ ගැන්විණි. එයට මුලපුරනු ලැබුවේ මාස හතකට පෙර රසායනික පොහොර ආනයනය තහනම් කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණය නිසාය. සාර්ථකත්වය ගැන කුමන පුරසාරමක් දෙඩුවත්, එවැනි කටයුතු දිගුකාලීන බැඳීම් නිර්මාණය කරගැනීම සඳහා පදනම් කරගත හැකිද යන්න ප්‍රශ්නාර්ථයකි.

මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ ශක්තීන් සහ දුර්වලතා සටහන් කිරීම වැදගත් වේ. සංස්කෘතික, ඓතිහාසික සහ පුද්ගලාන්තර පෙරමුණුවල ද්විපාර්ශ්වික සබඳතා තහවුරු කර ගත හැකි ආකාරය අවබෝධ කර ගැනීම සඳහා එවැනි තක්සේරුවක් යොදාගත හැකිය. ශ්‍රී ලංකාවේ භූ දේශපාලනික ගැටලු ප්‍රධාන වශයෙන් රටවල් තුනක් සමඟ සම්බන්ධ වේ: ඒවා නම්, අනුපිළිවෙලින්, ඉන්දියාව, චීනය සහ එක්සත් ජනපදය වේ. අනෙක් අතට, එය සෘජුව හෝ සමගාමීව, විශේෂයෙන් ආසියාවේ සහ ඉහත රටවල් තුන ඇතුළුව රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති සෑම රටක් සමඟම ආර්ථික නොවන සබඳතා පවත්වයි. මෙම බැඳීම් ඇති වී තිබෙන්නේ ඉන්දියන් සාගරය පිහිතුළ ශ්‍රී ලංකාවේ පිහිටීම හෝ 16 වන සියවසෙන් පසු අනුප්‍රාප්තික යුරෝපීය බලවතුන්

විසින්බ රට අත්පත් කර ගැනීම යන කාරණා දෙක හේතුවෙනි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව සංස්කෘතික බැඳීම් ගොඩනගා ගන්නා අතර, එම සබඳතා රටේ ආර්ථික දුර්වලතා මගහරවා ගැනීමට ඉවහල් වන බව අපි විශ්වාස කරමු. මෙය ඉතා සරලව කිවහොත්, ශ්‍රී ලංකාව සංස්කෘතිය හා ඉතිහාසය යන විෂය පථයන් වෙත යොමු වන්නේ එයට එතරම් ආර්ථික ශක්තියක් නොමැති නිසාය

මෙය පසුබිමෙහි තවත් මූලික ගැටලුවක් තිබේ. ශ්‍රී ලංකාවේ සංස්කෘතික-ඓතිහාසික සහ මිනිස් සබඳතා සඳහා වන වැඩපිළිවෙල ආර්ථික සබඳතා සොයා යාමට ප්‍රතිලෝම වී ඇත. මේ අනුව, එය එතරම් වෙළඳ සබඳතා නොමැති රටවල් සමඟ සංස්කෘතික-ඓතිහාසික සබඳතා ගොඩනගා ගැනීම වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටින අතර, ශක්තිමත් සබඳතා තිබෙන රටවල් සමඟ ඓතිහාසික සබඳතා තහවුරු කර ගැනීමෙන් වැළකී සිටියි. එය තේරුම් ගත නොහැකි තත්වයකි. එක්සත් ජනපදය සහ ඉන්දියාව දෙවන තත්වය සම්බන්ධයෙන් පැහැදිලි උදාහරණ දෙකක් වන අතර මධ්‍යම ආසියාව සහ ලතින් සහ මධ්‍යම ඇමරිකාව පළමුව සඳහන් කළ තත්වය සඳහා පැහැදිලි උදාහරණ දෙකකි. ශක්තිමත් ආර්ථික සබඳතා නොමැති විට ශ්‍රී ලංකාව පුද්ගලාන්තර සම්බන්ධතා සම්බන්ධයෙන් උනන්දු වන අතර ශක්තිමත් ආර්ථික බැඳීම් තිබෙන විට එවැනි ක්‍රියාකාරකම් නොසලකා හරින බවට හැඟීමක් මෙමගින් ඇති කරයි. ඇත්ත වශයෙන්ම, මෙය දෙපැත්තටම ඵලදායී නොවන අතර, බාහිර සම්බන්ධතාවලට අදාළව දිගුකාලීනව කිසිසේත්ම හිතකර නොවේ.

මෙය එසේ නොවිය යුතු යැයි අපි විශ්වාස කරමු. ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයන් සඳහා පමණක් නොව ඕනෑම රටකට ද්විපාර්ශ්වික සබඳතාවන්හි පදනම විය යුත්තේ මිනිසුන් අතර සබඳතා සහ වෙනත් බැඳීම් මත පදනම් වූ සංස්කෘතික සබඳතාය. අනෙක් අතට, ද්විපාර්ශ්වික සබඳතා තහවුරු කරගැනීමේ වෙනත් ක්‍රම නොමැති විටදී දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් උත්සාහ කිරීම විසින් ඇතිකරනු ලබන්නේ නිශේධාත්මක ප්‍රතිඵලයකි. එබැවින්, ඉහත නිර්දේශයන්ට අනුකූලව සිය සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ග ප්‍රතිසංස්කරණය කරන අතරම, ශ්‍රී ලංකාව සිය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නිරත විය යුතුය. එයට හේතුව නම් ශක්තිමත් මූල්‍ය පදනමකින් තොරව, කිදු මෘදු බල සංස්කෘතික ප්‍රක්ෂේපනයකට ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ගලවා ගත නොහැකි බැවිනි. පී.කේ. බාලචන්ද්‍රන් මෙම සමාලෝචනයේ කතුවරුන් සමඟ සම්මුඛ සාකච්ඡාවකදී සඳහන් කළ පරිදි, වෙළඳ සබඳතා නොමැති විට සංස්කෘතික බැඳීම් මගින් කිසිවක් අදහස් වන්නේ නැත.

# வெளியுறவுக் கொள்கை மீளாய்வு

## புதியதோர் இலங்கைக்கான தொலைநோக்குப் பார்வை

factum

## வெளியுறவுக் கொள்கை மீளாய்வு
புதியதோர் இலங்கைக்கான தொலைநோக்குப் பார்வை


| | | |
|---|---|---|
| ஆலோசனைக் குழு | : | கலாநிதி ரங்க கலன்சூரிய, மந்தனா இஸ்மாயில் அபேவிக்ரம, ஒமர் ராஜரத்னம், எம்.எஸ்.எம். ஐய்யூப் மற்றும் சந்தி கிரிந்தே |
| தலைமை ஆசிரியர் | : | உதித்த தேவப்பிரிய |
| ஆய்வு ஒருங்கிணைப்பு | : | ஷரண்யா அபேவிக்ரம மற்றும ஸீனத் ஐயூப் |
| ஆய்வு உதவி | : | ஆகில் ரியாஸ் மற்றும் உத்பலா விஜேசூரிய |
| வடிவமைப்பு | : | சஞ்ஜீவ பெத்தவடு |
| வெளியீடு | : | Factum |


Factum என்பது ஒரு சுயாதீன ஆலோசனை நிறுவனம் ஆகும். அத்தோடு, சர்வதேச அரசியல், மூலோபாய தொடர்புகள் மற்றும் தொழில்நுட்ப ஒத்துழைப்பு சேவைகள் பற்றிய முக்கியமான உள்ளடக்கங்கள், பகுப்பாய்வுகள் மற்றும் நோக்குநிலைகளை வழங்கும் ஒரு சிந்தனைக் குழுவாகும். இது, இலங்கை கம்பனிகள் சட்டத்தின் கீழ் இலாப நோக்கமற்ற நிறுவனமாக பதிவுசெய்யப்பட்டுள்ளது. சர்வதேச மற்றும் பிராந்திய அரசியல், பொருளாதாரம், சுற்றுச்சூழல் மற்றும் பாதுகாப்பு பிரச்சினைகள் மற்றும் ஏனைய துறைகள் மீதான சுயாதீன கொள்கை ஆய்வு, ஆழமான பகுப்பாய்வு மற்றும் பக்கச்சார்பற்ற விவரணங்களை மேற்கொள்வதற்காக, சர்வதேச உறவுகள் மற்றும் பொது இராஜதந்திர நிபுணர் குழுவுடன், இலங்கை மற்றும் ஆசிய நிபுணர்களை குயஉவரஅ ஒன்றிணைக்கின்றது.

பன்மைத்துவம், சமமான வாய்ப்புகளை வழங்குதல் மற்றும் அனைத்து தரப்பினரையும் உள்ளடக்கிய தன்மை என்பவற்றை பேண உறுதிபூண்டுள்ளது. அத்தோடு, விளிம்புநிலை மக்கள் குழுக்கள் உட்பட, அனைத்து பால்நிலைகள் மற்றும் சமூகங்களின் உரிமைகளை இது மதிக்கின்றது.

இந்நூலை நிறைவு செய்வதற்கு வழிகாட்டி, ஆலோசனை வழங்கிய மற்றும் வழிகாட்டிய முன்னாள் தூதுவர்கள் மற்றும் வெளியுறவுச் செயலாளர்கள் உள்ளிட்ட இராஜதந்திரிகளின் குழுவிற்கு நூலாசிரியர்கள் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றனர்.

இந்த வெளியீட்டில் இடம்பெற்றுள்ள கார்ட்டூன்களை அவந்த ஆர்ட்டிகல வரைந்தார்.

29யுஇ மெரைன் டிரைவ், கொழும்பு - 3

| | | |
|---|---|---|
| இணையத்தளம் | : | www.factum.lk |
| மின்னஞ்சல் | : | info@factum.lk |


**எம்மை பின்தொடருங்கள்**

| | | |
|---|---|---|
| முகப்புத்தகம் | : | www.facebook.com/Factum.lk |
| X அல்லது டுவிட்டர் | : | www.twitter.com/factumlk |
| இன்ஸ்டாகிராம் | : | www.instagram.com/factum.sl |

இலங்கையின் ஆயுதப் படைகள், இராஜதந்திர சேவை, கூட்டுறவுத் துறை, மற்றும் கலாசாரத் துறைகள், சினிமா உட்பட பல அதிகாரிகள் மற்றும் பணியாளர்களுடன் ஆசிரியர்கள் நடத்திய நேர்காணல்களின் அடிப்படையில் இந்தப் புத்தகத்திற்கான ஆராய்ச்சி அமைந்தது. ஊவாவில் உள்ள தம்பானை உட்பட நாட்டின் ஒன்பது மாகாணங்களிலும் உள்ள பல மாவட்டங்களில் கடந்த ஆண்டு Factum நடத்திய அடிமட்ட ஆலோசனைகளின் அடிப்படையிலும் இது அமைந்துள்ளது. இவை நாட்டின் பழங்குடியினராகிய வேடுவர் சமூகம் உட்படப் பல சமூகங்களை உள்ளடக்கியது.

இந்தப் புத்தகம் நாட்டின் வெளியுறவுக் கொள்கைக்காக தங்கள் சொந்த வாழ்க்கையையும் தொழில் வாழ்க்கையையும் அர்ப்பணித்த பல இராஜதந்திரிகள், தூதுவர்கள் மற்றும் அதிகாரிகளுக்காக அர்ப்பணிக்கப்பட்டுள்ளது.

# உள்ளடக்கம்

**முதல் கட்டம்** **82**

**கருப்பொருள் மற்றும் கரிசனைகள்**

புவிசார் அரசியல் 84

பாதுகாப்பு 91

ஆராய்ச்சி மற்றும் புத்தாக்கம் 96

டிஜிட்டல் ஒத்துழைப்பு 103

காலநிலை மற்றும் சுற்றுச்சூழல் 110

மக்களுடனான மக்கள் உறவுகள் 117



# அறிமுகம்

**ஒரு முதல் முயற்சி**

இலங்கையின் வெளியுறவுக் கொள்கை ஒருபோதும் நிலையானதாக இருந்ததில்லை. சுதந்திரத்திற்குப் பிறகு, பல்வேறு வெளியக மற்றும் உள்ளகத் தீர்மானங்களுக்கு ஏற்ப அது தொடர்ந்து மாறிவிட்டது. இதில் இலங்கை தனிமைப்படுத்தப்பட்ட விதிவிலக்கல்ல. மற்ற நாடுகளின் வெளியுறவுக் கொள்கை, சக்தி வாய்ந்த நாடுகளும் கூட, அடிக்கடி மாற்றமடைவதாக ஆகிவிட்டது. ஒரு காலத்தில் எதிரிகள் இன்னொரு காலத்தில் நண்பர்களாகிவிட்டனர். இன்னும் தாமதமாகவே, இலங்கை ஒரு அடையாள நெருக்கடியிலிருந்து இன்னொரு நெருக்கடிக்குள் தள்ளாடிக்கொண்டிருக்கிறது. கடந்த ஆண்டு ஏற்பட்ட நிதி நெருக்கடி, நாடு, அதன் அரசியல் இயந்திரம் மற்றும் அதன் குடிமக்களை அந்த உறவுகளிலிருந்து ஏதேனும் நன்மைகளைப் பெற்றதா என்பதை மதிப்பிடுவதற்கு அதன் வெளிநாட்டு உறவுகளின் பாதையில் ஈடுபடுவதற்கு கட்டாயப்படுத்தியது.

கடந்த வருட நெருக்கடியிலிருந்து இலங்கை கற்றுக்கொண்ட அல்லது கற்றுக் கொள்ளாத சில பாடங்களை இந்த வெளியீடு முன்வைக்கிறது. இலங்கை இப்போது எங்கே இருக்கிறது, முன்னேறுவதற்கு அதன் வெளியுறவுக் கொள்கையின் அடிப்படையில் என்ன செய்ய முடியும்? இந்த வெளியீடு ஒரு கல்விசார் கட்டுரையாக அதனைக் காட்டிக்கொள்ளவில்லை என்றாலும், நாம் எங்கு தவறு செய்தோம் என்பதையும், நமது சூழ்நிலையையும் நிலையையும் மேம்படுத்த நாம் என்ன செய்ய முடியும் என்பதையும் உணர்த்துவதற்கான சாத்தியமான முதல் முயற்சியாக நாங்கள் கருதுகிறோம். இறுதியில் நமது வெளியுறவுக் கொள்கையானது நமது உள்நாட்டு அரசியலில் அல்லது உள்ளகப் பரிமாணத்தைச் சார்ந்ததென்ற கோட்பாட்டினாலேயே நாம் வழிநடத்தப்பட்டுள்ளோம்.

குயஉவரஅ இல், இலங்கையின் அபிவிருத்திக்கு வெளிநாட்டுக் கொள்கை பற்றிய அறிவு முக்கியமானது என்று நாங்கள் நம்புகிறோம். இதைக் கருத்தில் கொண்டு, கடந்த வருடம் பல மாகாணங்களில் தொடர்ச்சியான வெளியுறவுக் கொள்கை ஆலோசனைகளை நடத்தினோம். முடக்கிப் போடும், குழப்பகரமான ஐந்து மாத எரிபொருள் தட்டுப்பாடு, வரிசைகள் மற்றும் முடிவில்லா போராட்டங்களுக்குப் பிறகு, இந்த ஆலோசனைகள், உயர்மட்டத்தில் உள்ளவர்கள் வெளியுறவுக் கொள்கையை கையாளும் விதம் பற்றி மக்கள் என்ன உணர்ந்தார்கள் என்பதைப் பற்றிய ஒரு நுண்ணறிவை எங்களுக்குத் தந்தது. இலங்கையின் பழங்குடியின சமூகத்தின் தலைவரான ஊறுவரிகே வன்னியல எத்தோவிடம் இருந்து மிகவும் உணர்திறன் வாய்ந்த கருத்து வந்திருக்கலாம். இலங்கை எங்கு தவறிழைத்துள்ளது என்று யோசித்த அவர்,

> ஏற்கனவே சர்வதேச சமூகத்தின் மத்தியில் தனது நம்பகத்தன்மையை இழந்துள்ள நிலையில், அழிந்துபோன உலகளாவிய நற்பெயரை மீளக் கட்டியெழுப்புவதில் இலங்கை கவனம் செலுத்த வேண்டும்.

என அதைப் பிரதிபலித்தார்.

வடமாகாணத்தில் எங்களின் ஆலோசனைகள் இன்னுமொரு சரியான விடயத்தை அளித்தன: இப்போது எமக்குத் தேவை மீள்தொடக்கம் அல்ல, புதிதாகத் தொடங்குவதாகும். இதுவே “புதியதோர் இலங்கைக்கான தொலைநோக்குப் பார்வை” என்ற எங்கள் உபதலைப்பைத் தூண்டியது.இலங்கை பாரம்பரிய இராஜதந்திரத்திற்கு அப்பால் சிந்திக்க வேண்டும், அது சந்தைப்படுத்தல் இராஜதந்திரம் பற்றி சிந்திக்க வேண்டும் என்று தென் மாகாணத்திலிருந்து, ஒரு ஆர்வமுள்ள இளைஞர் அவதானித்தார்.

மஹியங்கனையின் அடர் காடுகளில் இருந்து கொழும்பின் கொங்கிறீற்றுக் காடுகள் வரை, வடக்கிலிருந்து தெற்கு வரை, இலங்கை முன்னேற வேண்டுமானால், அது தனது பிம்பத்தை அல்லது வெளிநாட்டில் அது உணரப்படும் விதத்தை சுத்தம் செய்ய வேண்டும் என்ற கருத்து அப்படியே இருந்தது. இலங்கைக்கு எப்போதும் நண்பர்களுக்கு குறைவில்லை. நட்பைப் பேணுவதற்கும் புதிய நண்பர்களை உருவாக்குவதற்கும் மட்டுமே அது ஒரு தீர்மானம் இல்லாமல் உள்ளது. இந்த வெளியீடு இந்தப் பிரச்சினைகளையெல்லாம் எடுத்துரைப்பது போல் போலியாகக் காட்டிக் கொள்ளவில்லை. எவ்வாறாயினும், இறுதியில் நாம் எதிர்கொள்ள வேண்டிய சில முக்கிய சிக்கல்கள் மற்றும் கருப்பொருள்களை இது சுட்டிக்காட்ட முயற்சிக்கின்றது.

**உதித தேவப்பிரிய**
தலைமை சர்வதேச உறவுகள் ஆய்வாளர்
குயஉவரஅ




# புவிசார் அரசியல்

மிகவும் நிச்சயமற்றதன்மை மற்றும் குழப்பகரமான சூழ்நிலையுடன் 2022 ஆம் ஆண்டினுள் இலங்கை நுழைந்தது. முந்தைய ஆண்டு, உள்நாட்டு மற்றும் வெளியுறவுக் கொள்கை தாக்கங்களைக் கொண்ட இரசாயன உரங்களின் இறக்குமதியைத் தடை செய்தல் போன்ற தொடர் நடவடிக்கைகளை அப்போதைய அரசாங்கம் நடைமுறைப்படுத்தியது. 2021 ஆம் ஆண்டு டிசம்பர் மாதமளவில், அதன் அனைத்து நம்பிக்கையான எதிர்வுகூறல்களுக்கும், அரசாங்கம் எந்த திசை உணர்வும் இல்லாத ஒரு பாதையில் பயணித்தது என்பது வெளிப்படையானது, இது ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களால் கூட சுட்டிக்காட்டப்பட்டது. ஆயினும்கூட, பொருளாதாரம் மீளக் கட்டியெழுப்ப முடியாத நிலைக்கு சென்றாலும், இது வழக்கமானதொரு ஒரு நிலைபோன்றதொரு எண்ணத்தில் நாடு தொடர்ந்து பயணித்தது. 2022 ஆம் ஆண்டு மார்ச் மாதமளவில், வெளிப்புற காரணிகள் காரணமாக, ஆனால் பெருமளவில் அரசாங்கத்தின் தவறான நிர்வாகத்தின் காரணமாக, அது வீழ்ச்சியடைய ஆரம்பித்தது.

முதலில் நெருக்கடிக்கு என்ன காரணம் என்ற விவாதங்கள் தொடர்கின்றன. சில பொருளாதார வல்லுநர்கள் நாட்டின் சந்தைகளை தாராளமயமாக்கி, கடன் நிலைத்தன்மையை உறுதி செய்வதில் தோல்வியடைந்துள்ளதை எடுத்துக்காட்டும் அதேவேளையில், மூலதனச் சந்தைகளில் தங்கியிருப்பதை விட, இலங்கையின் கடன்சுமையுடன் இந்தப் பிரச்சனை குறைவாகவே உள்ளது என மற்றவர்கள் சுட்டிக்காட்டுகின்றனர். எவ்வாறாயினும், ஏப்ரலில் அதன் முதல் வெளிநாட்டுக் கடன் தீர்க்க வகையற்ற நிலையை அறிவித்த பிறகு சர்வதேச நாணய நிதியத்துடனான (IMF) பேச்சுவார்த்தைகளில் நுழைவதற்கான தீர்மானமானது, சில ஏனையவற்றுடன் ஒன்றிணைந்ததாகவும் சில ஏனையவற்றிலிருந்து வேறுபட்டதாகவும் உள்ள போட்டியிடும் புவிசார் அரசியல் நலன்களின் வரிசையில நாட்டை முடக்கியது. உதாரணமாக, சீனா நிரப்பும் என்று பலர் எதிர்பார்த்திருந்த இடைவெளியை நிரப்ப முடியும் என்று நினைத்தபோது, இந்தியா ஆரம்பத்தில் அடியெடுத்து வைத்தது. இதன் விளைவாக, சர்வதேச நாணய நிதியம் (IMF) செய்ததை விட டெல்லி இலங்கைக்கு அதிகம் செய்தது என்று - உண்மையில் அதன் வெளிவிவகார அமைச்சர் கூறியது போல் - இந்தியா கூறக்கூடிய நிலையில் உள்ளது.

மீளாய்வுக்குட்பட்ட நெருக்கடி காலத்தின் புவிசார் அரசியல் தாக்கங்களைப் பொறுத்த வரையில், இந்து சமுத்திரத்தில் இலங்கையின் நிலை மற்றும் இந்து சமுத்திரத்திற்கான இந்தியாவின் அபிலாஷைகளே முதன்மையான காரணியாக இருந்ததுடன் பெரும்பாலான காரணியாகவும் இருக்கும். வேறு எந்த நாடும் உதவி செய்யத் தயாராக இல்லாத நேரத்தில் இந்திய அரசாங்கம் செய்த மகத்தான உதவியைப் புறக்கணிக்காமல், தெற்கிலுள்ள தனது உடனடி அண்டை நாடான ஆதரவு மற்றும் உதவிகளை வழங்கியதன் மூலம் இந்தியா ஒரு வெளிப்படையான புவிசார் அரசியல் நன்மையைப் பெற்றது. இலங்கை ஊசலாடும் அளவுக்கு நிலைமை மிகவும் மோசமாக உள்ளது. மேலோட்டமாகப் பார்த்தால் ஓரளவு இயல்பு நிலைக்குத் திரும்பியிருந்தாலும், உண்மை என்னவென்றால் இந்தியா வழங்கிய 4 முதல் 5 பில்லியன் டொலர் கடன் வசதிகள் மற்றும் உதவித் திட்டங்களைத் திருப்பிச் செலுத்துமாறு கோரும் என அனுமானிப்போமானால், இலங்கை மீண்டும் நெருக்கடிக்குள் தள்ளப்படும்.

இந்தியா அவ்வாறு செய்யவில்லை என்பது இரண்டு விஷயங்களைச் சுட்டிக்காட்டுகின்றது. முதலாவதாக, சுய- அக்கறை என்ற குறுகிய கண்ணோட்டத்தில், இலங்கையை இவ்வளவு சீக்கிரம் கழுத்தை நெரிப்பதால் இந்தியா ஒன்றும் பெறப்போவதில்லை. தனது வலிமை மீது நம்பிக்கை வைத்து, அரசாங்கம் மற்றும் தமிழீழ விடுதலைப் புலிகளுக்கு எதிராகவும் சார்பாகவும் தனது தலையீட்டினை மிகைப்படுத்தியதன் எதிரொலியாக, அதன் தலைவரினால் இந்தியப் பிரதமரின் படுகொலையைத் திட்டமிட்டு நடத்திய இளம் கொரில்லா போராளிகளின் கைகளில் உலகின் மிக வலிமையான இராணுவங்களில் ஒன்று அவமானகரமான தோல்வியை எதிர்கொண்டமை 1980 களில் இந்தியா கற்றுக்கொண்ட பாடமாகும். இலங்கையின் ஸ்திரத்தன்மையை உறுதிப்படுத்தும் அதே வேளையில் இலங்கையிடமிருந்து சலுகைகளைப் பெறுவது அதன் அக்கறையாகும். 13ஆவது திருத்தத்திற்கு அப்பால் சென்றால் நாடு மீண்டும் குழப்பத்தில் சிக்கிக் கொள்ளுமளவிற்கு தேசியவாதக் கூறுகளை மோசமாக்கும் என்பதே 13ஆவது திருத்தத்தை அமுல்படுத்த வேண்டும் என்ற இந்தியாவின் வற்புறுத்தலுக்குக் காரணமாகும் என்பது ஒருவகையில் எமது அபிப்பிராயமாகும்.

ஏறக்குறைய இதே தர்க்கம் இலங்கையின் நெருக்கடிக்கு இந்தியாவின் பதிலிலும் செல்வாக்குச் செலுத்துகின்றது. நெருக்கடியான காலத்தில் இலங்கையுடனான உறவுகளை வலுப்படுத்துவதன் மூலம் வெளிப்படையான, உறுதியான பலன்களைக் கண்டது. ஆயினும்கூட, அது அதன் தனது வலிமை

மீது நம்பிக்கை வைத்து தலையீட்டினை மிகைப்படுத்தவில்லை: முந்தைய கடன் வசதிகள் மற்றும் இந்திய முதலீட்டுத் திட்டங்களை துரிதப்படுத்துதல் போன்ற இலங்கையின் தரப்பில் உள்ள பிற கடமைகளின் தீர்வு நிலுவையில் உள்ள எந்தவொரு எரிபொருள் கடன் வசதிகளும் தாமதமாகிவிடும் என்று அறிவிப்பதற்கு முன், அது பல மாதங்கள் காத்திருந்தது. இந்தியாவுக்கு சாதகமாக நிலைமை மிகவும் முன்னேறி இரண்டு அல்லது மூன்று ஆண்டுகளுக்கு முன்பு கற்பனை செய்ய முடியாதது சாத்தியமாகிவிட்டது: இலங்கை இந்திய முதலீடுகளை ஊக்குவிப்பது மட்டுமல்லாமல், இந்திய நாணயத்தில் வர்த்தகம் செய்வது பற்றியும் பேசப்படுகிறது. இந்தியா தனது பங்கிற்கு அரசாங்கத்துடன் அடுத்த ஒப்பந்தத்தை மேற்கொள்வதற்கு முன் விஷயங்களைத் தீர்க்க காத்திருக்கத் தயாராக உள்ளது. அதற்காக 1 பில்லியன் அமெரிக்க டொலர் கடன் வசதியை மேலும் ஒரு வருடத்திற்கு நீடிப்பதற்கு 2023 மே மாதத்தில் டெல்லி ஒப்புக்கொண்டது.

இங்கு சுவாரசியமான விஷயம் என்னவெனில், அண்மைய மாதங்களில், குறிப்பாக ரஷ்யா-உக்ரைன் யுத்தம் மற்றும் பிரேசில் அதிபராக லூலா டி சில்வா தேர்ந்தெடுக்கப்பட்ட பிறகு, டொலர் பயன்பாட்டினைக் குறைக்கும் நடவடிக்கைகளை நோக்கி நாட்டின் நகர்வுகள் எவ்வாறு இணைந்துள்ளன என்பது இலங்கையின் இந்தியா மீதான புவிசார் அரசியல் தங்கியிருத்தலை வலுப்படுத்துகின்றது என்பது, இரு நாட்டிலும் இழக்கப்படாத உண்மையாகும். இலங்கையின் மிகப்பெரும் கடன்வழங்குவோனாக இந்தியா உள்ளது என்பதும், பகுதியளவிலான டொலர் பயன்பாட்டினைக் குறைக்கும் நடவடிக்கைகளை நோக்கி இலங்கை நகர்கிறது என்பதும் நெருங்கிய தொடர்புடைய விடயங்களாகும். இங்கு இலங்கையின் நோக்கம் டெல்லியுடனான உறவுகளை உறுதிப்படுத்துவதே தவிர, பன்முகத்தன்மைக்கான எந்த கருத்தியல் தொடர்பும் அல்ல: ஒரு உதாரணமாவது, உக்ரைன் மீதான ரஷ்ய படையெடுப்பு தொடர்பான உலகளாவிய தெற்கின் மற்ற நடுநிலை நிலைப்பாட்டைப் பின்பற்றும் அதே வேளையில், ரஷ்ய எண்ணெய் இறக்குமதிக்கான அழைப்புகளை இலங்கை இதுவரை எதிர்த்து இந்தியாவினூடாகச் செயற்பட விரும்புகிறது.

உண்மையில், வெளிவிவகாரக் கொள்கையில் இலங்கை ஒருமனதாக இருக்கவில்லை. இலங்கை என்ன கொள்கையை பின்பற்றுகிறது, பின்பற்ற வேண்டும் என்பதே இங்குள்ள வினாவாகும். 2023 ஆம் ஆண்டின் தொடக்கத்தில், எதிர்க்கட்சி பாராளுமன்ற உறுப்பினர் இரான் விக்கிரமரத்ன வாதிட்டதுடன் வெளிவிவகார அமைச்சர் அலி சப்ரி பலதரப்பு நாடுகளுடனான அணிசேரும் கொள்கைக்கு உடன்பட்டார். இதன் விளைவாக், இலங்கை வெளிநாட்டில் தனது (பொருளாதார) நலன்களுக்கு முன்னுரிமை அளிக்க வேண்டும் என்பதுடன் அணிசேராமை போன்ற கடந்த காலக் கொள்கைகளுடன் எந்தவொரு கருத்தியல் பற்றுதலுககும் குறைந்த முக்கியத்துவம் கொடுக்க வேண்டியிருக்கும். இன்னும் இந்தக் கொள்கையை கடைப்பிடிக்கும் அதே வேளையில், குறைந்தபட்சம் கோட்பாட்டளவில், அணிசேராத உலகளாவிய தெற்குடனான தனது உறவுகளை இலங்கை கைவிடவில்லை.

யுவாங் வாங் 5 என்ற சீன ஆராய்ச்சி/ஆய்வுக் கப்பலின் வருகைக்கு அதன் முரண்பாடான பிரதிபலிப்பினை இது விளக்குகிறது: அம்பாந்தோட்டைக்குள் அதை அனுமதிப்பது இந்தியாவை வருத்தமடையச் செய்யும் என்பது தெளிவாகத் தெரிந்தாலும், இலங்கை அதிகாரிகள் தரப்பில் ஏற்பட்ட குழப்பம், அது இலங்கைக்கு வருவதற்கு வழிவகுத்தது. இலங்கை கடற்பரப்பை நெருங்கியவுடன் கப்பல் நுழைவை மறுக்க முடியாத நிலை ஏற்பட்டது. 2022 யூலை மாதத்தில் ரஷ்யா-உக்ரைன் யுத்தத்துடன் தொடர்புடைய ஏரோ.ஃப்ளோட் விமானத்தைத் தடுத்துவைத்த தோல்விகரமான சம்பவத்திலும் இதே குழப்பத்தைக் காணலாம்.

சீனா மற்றொரு குழப்பவாதியாகவுள்ளது. நெருக்கடியும், அதற்கு சீனாவின் மெத்தனமான பிரதிபலிப்பும், அடிப்படையில் கடன் பொறிகள் மற்றும் அதன் தொடர்பாடல் கடல் வழிகள் பூராகவுமுள்ள சீன இராணுவ மற்றும் வணிக வசதிகள் மற்றும் உறவுகளின் வலையமைப்புப் பற்றிய மேற்கத்திய கதைகளை தூண்டியது. இலங்கைப் பொருளாதார வல்லுநர்கள், அவர்களின் கருத்தியல் நோக்குநிலையைப் பொருட்படுத்தாமல், பெரும்பாலும் சீனாவைக் குற்றஞ் சாட்டவோ அல்லது மேற்கத்திய கதைகளை நிராகரிக்கவோ மறுத்தாலும், மேற்கத்திய வர்ணனையாளர்கள் நெருக்கடிக்கான பழியை சீனாவின் மீதே தொடர்ந்தும் சுமத்துகிறார்கள். இலங்கையின் கடன் மறுசீரமைப்பு செயல்முறை தொடர்பான சீனாவின் நடத்தையின் அடிப்படையில், பீஜிங்கிற்கு இலங்கையர்களின் பிரதிபலிப்பு பல மட்டங்களிலும் வேறுபாடானதாக உள்ளது.

2022 ஆம் ஆண்டில் எங்கள் ஆலோசனையில் இந்த வேறுபாட்டினை நாங்கள் அனுபவித்தோம்: தென் மாகாணத்தில் அரசாங்கம் ஒரு மூலத்திலிருந்து பல கடன்களை குவித்ததில் ஒருமித்த கருத்து தோன்றியது, வடக்கில் சீனாவுக்கு அதிக விரோதம் இருந்தது, ராஜபக்சக்களுடன் அந்த நாட்டிற்கு இருந்த தொடர்பு காரணமாக அந்த உணர்வு தூண்டப்பட்டது என்பதில் சந்தேகமில்லை.

இலங்கையில் ஏற்பட்டுள்ள நெருக்கடிக்கு எதிராக இந்தியா சீனாவின் மீது தெளிவான மேலாதிக்கத்தைப் பெற்றுள்ள போதிலும், சீனாவின் நடத்தை எந்த அடிப்படையையும் கொண்டிருக்கவில்லை என்று கூறுவது தவறானது. இலங்கையின் கடன் மறுசீரமைப்பு பேச்சுவார்த்தைகளுக்கு சீனாவின் குழப்பமான பதில், இலங்கைக்கு கடன் நிவாரணம் வழங்கினால், அது மற்ற நாடுகளுக்கு, குறிப்பாக அதன் ஆபிரிக்க பங்காளிகளுக்கு அவ்வாறு செய்ய வேண்டும் என்ற அச்சத்துடன் தொடர்புடையதாக இருந்தது.

நல்லதோ கெட்டதோ, இலங்கையின் சர்வதேச நாணய நிதியத்தின் பேச்சுவார்த்தைகள் மேற்கு நாடுகளுக்குப் பணயக்கைதியாக சீனாவை உணரவைத்ததாகத் தெரிகிறது, இது மேற்குலகம் மற்றும் அமெரிக்க அதிகாரிகள் தமக்குக் கிடைக்கும் அனைத்து சந்தர்ப்பங்களையும் இங்கு மேற்கொள்ளும் அனைத்து விஜயங்களையும் இலங்கையின் நெருக்கடிக்கு பீஜிங்கினைக் குற்றஞ்சாட்டுவதற்குப் பயன்படுத்திக் கொள்கின்றனர். 2022 பெப்ரவரியில் இலங்கைக்கு விஜயம் செய்த போது விக்டோரியா நுலண்ட்டினது சீனாவைப் பற்றிய கருத்துக்கள் மிகத் தெளிவான, சமீபத்திய உதாரணம் என்று கூறலாம்.

இது சிறந்த நிலையில் தெளிவற்றதாகவும் மோசமான நிலையில் பலவீனமானதாகவும் உள்ள அமெரிக்காவுடனான இலங்கையின் உறவுகளுக்கு நம்மை அழைத்துச் செல்கிறது. அமெரிக்காவின் உள்நோக்கங்களைப் பொருட்படுத்தாமல், இலங்கையில் உள்ள தேசியவாதக் கூறுகள் அமெரிக்காவை தொடர்ந்து விரோதத்துடன் பார்க்கும். இந்த விரோதப் போக்கின் பெரும்பகுதி கற்பனையான அச்சங்களை அடிப்படையாகக் கொண்டதாக இருக்கலாம், ஆனால் அமெரிக்காவின் நற்பெயர் இங்கு முற்றிலும் தகுதியற்றதாக இல்லை, குறிப்பாக மற்ற நாடுகளின் விவகாரங்களில் அமெரிக்கா தலையிடுவது பற்றிய கருத்துக்கள், பொதுவாக இலங்கையர்கள் வெறுப்புடன் பார்க்க முனைகின்றன.

இந்த வகையில், அமெரிக்கா தனது பொது இராஜதந்திர பிரச்சாரத்தை நாட்டில் புதுப்பிக்க வேண்டும். அமெரிக்காவுடனான இலங்கையின் இறுக்கமற்ற பிணைப்பிற்கு தேசியவாத கூறுகளை மட்டும் குறை கூறுவது வீணானதாகும். 2019 ஆண்டில் MCC ஒப்பந்த சர்ச்சை காட்டியது போல், வாஷிங்டனும் பழியில் பங்கு கொள்ள வேண்டும்.

இலங்கையைப் பொறுத்த மட்டுமன்றி, உலகளாவிய தெற்கில் உள்ள பல அதிகாரப் பகிர்வு கொண்ட உலகின் மாற்றங்கள் மற்றும் மாறுபாடுகளுக்கு உணர்திறன் காரணமாக அமெரிக்காவே இந்த இக்கட்டான நிலையை உணர்ந்து இணக்கத்திற்கு வந்திருப்பதற்கான அறிகுறிகள் தென்படுகின்றன. ‘‘அமெரிக்கா, சீனா மற்றும் “புதிய அணிசேரா நாடுகள்” என்ற தலைப்பில் ப்ஷரூக்கிங்ஸ் இன்ஸ்டிட்யூட் (Brookings Institute) சமீபத்தில் வெளியிட்ட கொள்கை விளக்கத்தில், இந்தப் பிரதேசங்களில் சீனா குறிப்பிடத்தக்க பொருளாதார இருப்பைக் கொண்டுள்ளதால் சீனாவை விட அதிக இடத்தைப் பெறுவதற்குப் போட்டியிடாமல் தெற்காசியா, மத்திய கிழக்கு மற்றும் கிழக்கு ஆபிரிக்கா நாடுகள் (Horn of Africa) ஆகிய நாடுகளில் உள்ள நாடுகளுடன் ஈடுபடுவதில் கவனம் செலுத்த வேண்டியதன் அவசியத்தை மூன்று கல்வியாளர்கள் எடுத்துரைத்தனர்.

‘‘அமெரிக்கா தலைமையிலான உலகளாவிய ஒழுங்கை” பின்பற்றுமாறு அமெரிக்காவால் நாடுகளை வற்புறுத்த முடியாத நிலையில், அது பனிப்போரை நினைவுபடுத்தும் வகையில்,
“‘நம்முடன்-அல்லது-எங்களுக்கு எதிராக’ தோரணையை வெளிப்படுத்துவதைத் தவிர்த்தல்” மற்றும் ‘‘சீனர் தலைமையிலான மாதிரியை தடையின்றி தடுமாறுவதற்கு’’ இடமளித்தல் உள்ளிட்ட பல தெரிவுகளைப் பயன்படுத்த வேண்டும். ”

இது கவனத்தை திசைதிருப்புவதைக் குறிக்கிறது. இருப்பினும், சீனாவை நேரடியாக எதிர்கொள்வதற்கு எதிராக அதன் ஆசிரியர்கள் எச்சரித்த போதிலும், இந்த நாடுகள் மற்றும் பிராந்தியங்களுடனான பீஜிங்கின் ஈடுபாடுகளுக்கு முற்றிலும் மாறுபட்ட அணுகுமுறைக்கு மதிப்பளிக்கும் வகையில் அது பிரச்சினை இரகசியமாக வைத்திருப்பதாகக் கூறும் அதே சீன எதிர்ப்புக் கதையை ஆவணம் வலுப்படுத்துகிறது

வேறு வார்த்தைகளில் கூறுவதானால், குறிப்பாக எங்களைப் போன்ற நாடுகளைப் பொறுத்தவரை, பெரும்பாலான அமெரிக்க கல்வியாளர்கள் இருதரப்பு உறவுகளை சீனாவுடனான அதன் போட்டியைச் சார்ந்திருக்கவில்லை என்றால், இந்த குறிப்பிட்ட ஆவணத்தில் உள்ள ஒரே வித்தியாசம் என்னவென்றால், சீன நிதியளிப்பு செயற்றிட்டங்களை அமெரிக்கா குறைமதிப்பிற்கு உட்படுத்த வேண்டும் என்று பரிந்துரைப்பதற்கு பதிலாக, இன்று இந்த நாடுகளில் உள்ள நிதி நெருக்கடியின் காரணமாக, அத்தகைய செயற்றிட்டங்கள் அவையாகவே தோல்வியடையும் வரை அமெரிக்கா காத்திருக்க வேண்டும் என்று அது பரிந்துரைக்கிறது. இது, வேறு வார்த்தைகளில் கூறுவதானால், இது பழைய அதே வழக்கினை புதிய முறையில் பின்பற்றுவதாகும்.

2022 ஆம் ஆண்டின் எதிர்ப்புகள் மற்றும் அமெரிக்க ஈடுபாடு பற்றிய கருத்துக்களில் ஒரு காரணியாக இருக்கும்போது, பிரச்சனை மிகவும் சிக்கலானதாகிறது. முக்கிய தேசியவாத பாராளுமன்ற உறுப்பினர்கள் மேடையில் ஏறி, எதிர்ப்புகளை வடிவமைப்பதில் அமெரிக்க தூதுவரின் தலையீடு இருப்பதாக வலியுறுத்தும் அதே வேளையில், தற்போதைய அரசாங்கத்தையும் அதன் முன்பிருந்த அரசாங்கத்தையும் விமர்சிப்பவர்கள் அமெரிக்க அரசாங்கம் பிந்தையதை மாற்றுவதற்கு சதி செய்வதாக குற்றஞ் சாட்டுகின்றனர். இந்தக் குற்றச்சாட்டுகள், குற்றச்சாட்டுகளாக அப்படியே இருக்கின்றன.

ஆனால் அவை இலகுவில் மறைய மாட்டா. மறுபுறம், இந்து சமுத்திரம் எதுவாகவிருப்பினும், அமெரிக்காவானது, தொடர்ந்தும் சீனாவுடனான உறவுகள் மற்றும் பீஜிங்குடனான அமெரிக்க பதற்றங்களை தவறான கோணத்திலேயே நோக்கி, ஒரு மூலோபாய கடலில் ஒரு மூலோபாய புறக்காவல் நிலையமாக இலங்கையை தொடர்ந்தும் பார்க்கும் என்று கணிப்பது நியாயமானது. அந்த வகையில், இந்தியா, சீனா மற்றும் அமெரிக்கா ஆகிய மூன்று நாடுகளுடனும் இலங்கையின் உறவுகளை இந்து சமுத்திரம் தொடர்ந்தும் தீர்மானிக்கும்.

ரஷ்யா-உக்ரைன் யுத்தம், சீனா-அமெரிக்க நிலைப்பாடு மற்றும் சீனா-இந்திய நிலைப்பாடு ஆகிய மூன்று புவிசார் அரசியல் பதற்றங்கள் இலங்கையின் வெளியுறவுக் கொள்கையை வரையறுக்கின்றன. இவற்றில் இரண்டு முரண்பாடுகள் சீனாவை உள்ளடக்கியது, விவாதிக்கக்கூடிய வகையில் இலங்கையின் மிகவும் சக்திவாய்ந்த மேலதிக பிராந்திய பங்காளி, மற்றும் சீனா ஒரு மூலோபாய பங்காளியாக ரஷ்யாவுடன் இணைக்கப்பட்டுள்ளது, பீஜிங் ஒரு புவிசார் அரசியல் காரணியாக இலங்கையின் வெளி உறவுகளில் கணிசமானதாக உள்ளது. இங்கே இலங்கை அது ஒரு பக்கத்தை எடுக்கவும் முடியாது, பக்கங்களை எடுக்கவும் முடியாது என்றதொரு ஒரு இக்கட்டான நிலையில் உள்ளது. இந்தப் புதிரைத் தீர்ப்பதற்காகவே அரசாங்கம் அதிகாரபூர்வமாக பலதரப்பு நாடுகளுடனான அணிசேரும் மூலோபாயத்தை ஏற்றுக்கொண்டது, இருப்பினும் நாம் சுட்டிக்காட்டியபடி, பலதரப்பு நாடுகளுடனான அணிசேரும் என்ற பதம் பலருக்கு பல விஷயங்களைக் குறிக்கும்.

சிறந்த முறையில், வியட்நாம் இப்போது சீனாவிற்கும் அமெரிக்காவிற்கும் எதிராக போன்ற ஒரு சமநிலைச் செயலில் ஈடுபடுவதுடன் மோசமான நிலையில், கடந்த சில தசாப்தங்களாக நாம் தொடர்ந்த பல பங்காளிகளுடன் நம்மைப் பிணைக்கும் சீரற்ற, நழுவல் கொள்கையை இது தூண்டுகிறது. இலங்கையில் பலதரப்பு நாடுகளுடனான அணிசேரும் மூலோபாயம் செயற்படுவதற்கு, அரசாங்கம் அதன் நடவடிக்கைகளில் மிகவும் சீரானதாக இருக்க வேண்டும் என்று நாங்கள் நம்புகிறோம், குறிப்பாக ஓய்வுபெற்ற இராஜதந்திரி ஒருவர் இலங்கையின் விரும்பத்தகாத முத்தரப்பு - சீனா-இந்தியா-அமெரிக்கா குழப்பகரமானது என்று அழைக்கிறார்.

இதைச் செய்வதை விட இதைச் சொல்வது எளிதானது, ஏனென்றால், ஒரு சிறிய அரசாகவும், ஒருபுறம் பிராந்திய மேலாதிக்கத்தால் சூழப்பட்ட ஒரு சிறிய பிராந்தியமாகவும், ஒருவேளை உலகின் மிகவும் சூடான போட்டிமிகுந்த சமுத்திரத்தின் மையத்தில், இலங்கை அதன் பல அண்டை நாடுகள் அனுபவிக்கும் நிலைத்தன்மை ஆடம்பரத்தை அனுபவிக்கவில்லை. எவ்வாறாயினும், அது ஒரு நிலையான, முழுமையான கொள்கையைப் பின்பற்றுவதைத் தடுக்கக்கூடாது.

உதாரணமாக, ஜப்பானில் அண்மையில் நடைபெற்ற நிக்கேய் மாநாட்டில், ஜனாதிபதி ரணில் விக்கிரமசிங்க, ஆசியா அபிவிருத்தியடைந்து வரும் வேளையில், ஆசிய நாடுகள் ஒன்றிணைய வேண்டும் என்று தெளிவாகக் குறிப்பிட்டார். இந்த விஷயத்தில் ஆசியா எந்த அணிகள் மற்றும்

கூட்டணிகளால் பயனடையலாம் என்பதை அவர் வெளிப்படையாகக் குறிப்பிடவில்லை என்றாலும், புதிய பட்டுப் பாதை முன்னெடுப்பில் மட்டுமல்ல, அமெரிக்காவின் இந்தோ-பசிபிக் மூலோபாயத்திலும் உறுப்பினராக இலங்கைக்கான ஒரு பெரிய தொலைநோக்கினை அவர் கோடிட்டுக் காட்டினார்.

இலங்கை இன்று சிக்கியுள்ள புவிசார் அரசியல் சிக்கல்களைக் கருத்தில் கொண்டு, துருவங்களாக இருக்கும் BRI மற்றும் இந்தோ-பசிபிக் மூலோபாயத்தை எவ்வாறு சமப்படுத்த முடியும் என்று நாம் கேள்வி எழுப்பலாம். ஆனால் இத்தகைய கருத்துக்கள் தற்போதைய அரசாங்கத்தின் தரப்பில் இன்னும் உறுதியான, முழுமையான வெளியுறவுக் கொள்கையை வெளிப்படுத்த வேண்டியதன் அவசியத்தை வெளிப்படுத்துகின்றன.

இந்தக் கொள்கையில் ஈடுபடுவதிலிருந்து இலங்கையைத் தடுத்ததுடன் அதை உத்தியோகபூர்வமாக ஊக்குவிக்க அதன் அரசாங்கத்தை நிர்ப்பந்தித்தது இரண்டுமே நாட்டை சக்திவாய்ந்த அரசுகளுடன் பிணைத்திருக்கும் சார்புகளின் வலையாகும். பொருளாதார ரீதியாக, இது மேற்கத்திய சந்தைகளுடன், குறிப்பாக அமெரிக்கா மற்றும் ஐரோப்பிய நாடுகளுடன் பிணைக்கப்பட்டுள்ளது. "தாராளவாத ஜனநாயகங்கள்" என்று அழைக்கப்படுபவை, வர்த்தகத்தை மனித உரிமைக் கவலைகள், ஐரோப்பிய ஒன்றியத்தின் ஜிஎஸ்பி பிளஸ் வசதி போன்ற உன்னதமான, பாடநூல் உதாரணங்களின் இணைக்கும் போக்கால், இந்த அரசுகளில் அதன் சார்பு வலுப்படுத்தப்பட்டுள்ளது.

இந்த வசதி இடைநிறுத்தப்படுவதை இலங்கைப் பொருளாதாரம் தாங்கிக்கொள்ள முடியாது. ஜிஎஸ்பி பிளஸ் தொடர்பான சர்ச்சைக்குரிய கருப்பொருள், பயங்கரவாதத் தடுப்புச் சட்டம் (PTA) சட்டம் உத்தேச ஒலிபரப்பு அதிகாரசபை சட்டம் போன்ற சட்டங்களுக்குப் பொதுமக்கள் கலந்தாலோசனை இல்லாமையாகும். இத்தகைய சட்டம் நாட்டின் ஜிஎஸ்பி பிளஸ் நிலையை ஆபத்தில் ஆழ்த்தக்கூடும் என்று ஐரோப்பிய அதிகாரிகள் அடிக்கடி சுட்டிக்காட்டியுள்ளனர்.

விஷயங்களை மேலும் சிக்கலாக்கும் வகையில், இந்த அதிகாரிகள் ஒருபுறம் பல பிரச்சினைகளில், முக்கியமாக ரஷ்யா-உக்ரைன் யத்தம் போன்றவற்றில் பலதரப்பு நிறுவனங்களில் நாட்டின் ஆதரவைப் பெற முயன்றனர். எவ்வாறாயினும், யுத்தம் தொடர்பான இலங்கையின் வாக்குப் பதிவுகள் காட்டுவது போல், அத்தகைய முயற்சிகள் இதுவரை பலனளிக்கவில்லை.

இந்த அபிவிருத்திகளை கருத்தில் கொண்டு, இலங்கையின் உத்தி என்னவாக இருக்க வேண்டும்? அணிசேரா இயக்கத்தில், குறிப்பாக டொலர் பயன்பாட்டினைக் குறைக்கும் நடவடிக்கைகள் நோக்கிய உந்துதலின் பின்னணியில், எங்கள் இணைப்புகளைத் தொடர்வதற்கு ஒரு வழக்கு உருவாக்கப்படலாம். ஏற்கனவே இலங்கை உட்பட ஒன்பது நாடுகளின் மத்திய வங்கிகள் SWIFT க்கு மாற்று சர்வதேச கொடுப்பனவு வலையமைப்பை தொடங்குவதற்கு தற்காலிகமாக இணங்கியுள்ளன. பங்களாதேஷ், பூட்டான், இந்தியா, மாலத்தீவுகள், நேபாளம், பாகிஸ்தான், மியான்மார் மற்றும் ஈரான் ஆகிய ஏனைய எட்டு நாடுகள் - பரந்த அளவில் மூன்றாம் உலக நாடுகள் அல்லது உலகளாவிய தெற்கின் பிரதிநிதிகள் அல்ல, ஆனால் வளர்ந்து வரும் ஆசிய-பசிபிக் நாடுகளின் பிரதிநிதிகளாவர்.

இதனுடன் இணைந்து, பலதரப்புவாதத்தை ஊக்குவிக்கும் பலதரப்பு மன்றங்களுடன் இலங்கை தனது உறவுகளை உறுதிப்படுத்த வேண்டும். இவற்றில் முதன்மையானது ஷாங்காய் ஒத்துழைப்பு அமைப்பு அல்லது SCO ஆகும். SCO போன்ற அமைப்புகள் உறுப்பு நாடுகளுக்கு, குறிப்பாக இலங்கை போன்ற சிறிய நாடுகளில், இருதரப்பு உறவுகள் மற்றும் நலன்களை பலதரப்பு குழுவின் கட்டமைப்பிற்குள் தொடர வாய்ப்பளிக்கின்றன என்று நாங்கள் நம்புகிறோம். இந்தப் பின்னணியில், நீண்ட காலமாக தெற்காசியாவை நோக்கிய ஒரு பிராந்தியமான மத்திய ஆசியாவுடனான தனது உறவுகளை இலங்கை உறுதிப்படுத்திக் கொள்ள முடியும்.

BRICS இன் சமீபத்திய எழுச்சியானது உலகளாவிய தெற்குடன், குறிப்பாக மத்திய மற்றும் இலத்தீன் அமெரிக்காவில் தனது உறவுகளை விரிவுபடுத்துவதற்கான வாய்ப்பையும் வழங்குகிறது. உண்மையில், வெளிவிவகார அமைச்சர் அலி சப்ரியுடனான எங்கள் குழுவின் நேர்காணலொன்றில், மெக்ஸிகோ போன்ற நாடுகளுடன் இணைப்பதன் முக்கியத்துவத்தை குறிப்பிட்டார், நாங்கள் ஒரே நேரத்தில் அமெரிக்காவுடன் மட்டுமே அங்கீகாரம் பெற்றுள்ளோம். மேலும், ஆபிரிக்கா போன்ற பிராந்தியங்கள் இலங்கையின் மிகவும்

சக்தி வாய்ந்த சில நட்பு நாடுகளான குறிப்பாக சீனாவிடமிருந்து பொருளாதாரத் தொடர்புகளால் கணிசமான அளவில் பயனடைந்திருந்தாலும் கூட, அவை ஒருபோதும் கவனிக்கப்படவில்லை.

உண்மையில், 2019 ஆம் ஆண்டில் வெளிவிவகார அமைச்சு ஆபிரிக்கா பற்றிய கொள்கை அறிக்கையை எழுதியது, இது இரு பிராந்தியங்களுக்கிடையில் பகிரப்பட்ட கலாசார பாரம்பரியத்தை எடுத்துக்காட்டுகிறது. இருப்பினும், பெரும்பாலான கொள்கை ஆவணங்களைப் போலவே இதுவும் கைவிடப்பட்டதாகத் தெரிகிறது. ஆபிரிக்காவின் சொந்தப் பொருளாதாரச் சிக்கல்களைக் கருத்தில் கொண்டு, குறிப்பாக பனிப்போரின் போது ஆசியா ஒற்றுமையுடன் நின்ற ஒரு கண்டமாகிய ஆபிரிக்காவுடன் உறவுகளைத் தொடர்வது ஒழுங்காக இருக்கலாம். அரசாங்கத்தின் பல அணிசேர்ப்பு வியூகம் அத்தகைய முன்மொழிவுடன் இணங்குமா என்பது கேள்விக்குரியதாகும். ஆபிரிக்கா பற்றி மதிப்பிடப்பட வேண்டும் என்று நாங்கள் உறுதியாக நம்புகிறோம்.

ஒரு இறுதி விடயமாவது, ஆசியா அபிவிருத்தியடைந்து வருகின்ற போதிலும் ஆசியாவும் மாறுகிறது. தேர்தல் ரீதியாகவும் பொருளாதார ரீதியாகவும் 30 ஆண்டுகளுக்கு முன்பு இருந்த ஆசியா இப்போது இல்லை. பிரதான கட்சிகள் தொடர்ந்து ஆட்சியில் இருந்தாலும் கூட ஸ்தாபன அரசியல் பல்வேறு நாடுகளில் நிராகரிக்கப்பட்டு வருகிறது. தாய்லாந்தில் சமீபத்தில் நடந்த தேர்தல் மூலம் இது தெளிவாகிறது. இந்தியாவிலும், எதிர்க்கட்சித் தலைவர் சிறையில் அடைக்கப்பட்டிருந்த போதிலும், பாரதிய ஜனதா கட்சியின் செயல்பாடுகளில் அதிக அதிருப்தி இருப்பதாகத் தெரிகிறது.

